03 පිටුව
වරායේ මූල්‍ය තත්ත්වය .....

05 පිටුව
ඵලදායි සේවාවක් සඳහා....

08-09 පිටු
පැහැසරය හෙට දවස .....

# තීර්ථ

பக்கம் 11
இலங்கை துறைமுக அதிகார சபையில் ......

12 පිටුව
නිවැරදි දැක්මකින් කටයුතු කළ...

15 පිටුව
ප්‍රවාහන අංශය.....

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ ලියාපදිංචි කරන ලදී.

දෙවන කණ්ඩය - 3 වන කලාපය | ඵලදායිතාවය හා මුසු වූ වරාය අධිකාරියේ මාසික පුවත් කවුළුව | ජනවාරි 2008

# නව වසර තුළ වරාය සංවර්ධනය නව මගක ට

## ප්‍රාදේශීය වරායයන් සංවර්ධනය ට මුල් තැන



නව වසර සුවඳ දෙන - කොඳ කැකුළු මල් සිනා..... දාරකාගාරයේ දරු දැරියන්ගේ රඟ සොබා

උදා වූ 2008 වසර සෑම නව වසරකට ම වඩා වරාය අධිකාරියට තීරණාත්මක වනු ඇත. සමුද්‍රික කලාපයේ තරගකාරිත්වය හා උරෙන් උර ගැටී කටයුතු කරමින් සමස්ථ ලෝකයට ම එක්සත් කේන්ද්‍රීය වරායක් ගොඩනැගීමට අවශ්‍ය ශක්තිය හා පහසුකම් වරාය අධිකාරිය නිවැසියන් ලෙසින් අපට තිබිය යුතු ය. මේ සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමණාකාරිත්වය විසින් දියත් කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර එම ව්‍යාපෘති ඉලක්ක ගතව නිම කිරීමට අවශ්‍ය සියළු පියවර ගැනීමට හා කාර්යක්‍ෂමතාවය කේන්ද්‍රීය කරගත් ඵලදායිතාවයෙන් යුතු නිෂ්පාදන ක්‍රියාවලියක් උදෙසා සේවක මහත්ම මහත්මීන් යොමුකරලීමට ද උදා වූ 2008 වසර තුළ කළමණාකාරිත්වය පියවර ගෙන තිබේ.

මේ වසර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ප්‍රාදේශීය වරායයන් සංවර්ධනය කිරීමට ද කළමණාකාරීත්ව පියවර ගෙන ඇත.

13 වන පිටුවට...

## 2008 වර්ෂයේ නියමාකාරයෙන් ම ශක්තිමත්ව ඉදිරියට ඒම අපගේ ඉලක්කයයි.

**සාලිය වික්‍රමසූරිය - සභාපති**

2007 වසර ඉතාමත් සාඩම්බරයෙන් අවසන් කිරීමට ලැබීම භාග්‍යයකි. එම වසර තුල ලබාගත් ජයග්‍රාහී ඉලක්ක සියල්ල වෙත ළඟා වීමට ඔබ සියලුදෙනාගේ සහාය සහ දැඩි කැපවීමද එකහෙලා හේතු විය. බහළු මෙහෙයුම් සේම, සාම්ප්‍රදායික නැව් බඩු මෙහෙයුම් ද 2006 වසරේ සිට 10% බැගින් වූ ප්‍රමාණයන්ගෙන් ඉහළ නැංවීමට අපට හැකි විය. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරීත්වය හා වෘත්තීය සමිති නියෝජිතයන් සමග පැවති සමීප සාකච්ඡා මගින් කාර්මික සාමය උදෙසා මෙන්ම ගැටුම් නිරාකරණය කිරීම සඳහා අප ගත් ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ අනෙකුත් සියලු ආයතනයන්ට මෙන්ම සංවිධානයන්ටද මහා පූර්වාදර්ශයකි.



වසර ගණනාවක් තිස්සේ එක්තැන්ව තිබූ වරාය සංවර්ධන ව්‍යාපෘතීන් කිහිපයක්ම දියත් කිරීමට අපට හැකිවූ අතර ඉදිරියේදී එමගින් සමස්ත දේශයටම පෘථුල ආර්ථික ප්‍රතිලාභ අත්වනු ඇත. චීනය, මැලේසියාව හා සිංගප්පූරුව වැනි ප්‍රධාන වරාය රට වලට අපගේ වෘත්තීය සමිති නියෝජිතයන් සහ නියමු

02 වන පිටුවට...

## සංවර්ධන ව්‍යාපෘති ඉලක්කගතව නිම කිරීමට සියළු පියවර ගත යුතුයි. ———— අමාත්‍ය චමල් රාජපක්‍ෂ



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රගති සමාලෝචනය පිළිබඳ විශේෂ රැස්වීමක් පසුගිය දා වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය චමල් රාජපක්‍ෂ මැතිතුමාගේ ප්‍රධානත්‍වයෙන් වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශයේදී පැවැත්විනි. එහිදී ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති සාලිය වික්‍රමසූරිය, උප සභාපති ප්‍රියත් බන්දු වික්‍රම යන මහත්වරුන් ඇතුළු අධ්‍යක්‍ෂවරුන් සහ සියළු කොට්ඨාශ ප්‍රධානීන්ගේ සහභාගීත්‍වයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සාර්ථකත්‍වය පිළිබඳව, එහි ක්‍රියාකාරීත්‍වය හා ඉදිරි සැලසුම් පිළිබඳවත් විශේෂ සමාලෝචනයක යෙදිනි. මෙහිදී ලබන වර්ෂය තුල ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි දියත් කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර එම ව්‍යාපෘති, ඉලක්කගතව නිම කිරීමට අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස වරාය හා ගුවන් සේවා ගරු අමාත්‍ය චමල් රාජපක්‍ෂ මැතිතුමා විසින් උපදෙස් දෙන ලදී.

මේ අතර පසුගිය වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලබා ඇති වර්ධනය පිළිබඳවද සිය අවධානය යොමු කළ ගරු අමාත්‍ය චමල් රාජපක්‍ෂ මැතිතුමන් ඉදිරි වර්ෂය තුළ මෙයටත් වඩා කැපවීමෙන් යුතුව වර්ධනීය ඉලක්කයන් කරා ගමන් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදුන් අතර, ඉතා දීර්ඝ කාලයක් තිස්සේ අතපසු වී පැවති හම්බන්තොට වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ලැබීම පසුගිය වසරේ ලත් විශාල ජයග්‍රහණයක් බව ද ප්‍රකාශ කළේ ය. ඒ අතර දකුණු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සහ ඔලුවිල් වරාය ඉදිකිරීමේ කටයුතු ද කඩිනම් කිරීමට මෙම වර්ෂය තුළ පියවර ගන්නා බවත් කොළඹ වරායේ අනාගත බහලු ධාරිතාවයන්ට සරිලන පරිදි ඉතා ඉක්මණින් දකුණු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය ඉදිකිරීම් කටයුතු දියත් කළ යුතු බවටත් උපදෙස් දෙන ලදී. එමෙන්ම පර්යන්ත පරිගණක පද්ධතිය ශ්‍රී ලංකා වරාය අධිකාරිය තුළ ස්ථාපිත කර මාස 09 ක් ඇතුළත එම කටයුතු නිම කර එය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ද අමාත්‍යවරයා උපදෙස් ලබා දුන්නේ ය. මේ අතර මේ සියලු කටයුතු පුද්ගලික අංශය සමග තරගකාරීව මෙහෙයුම් කිරීමට හැකිවන පරිදි භාණ්ඩ, උපකරණ ආදී සම්පත් සහ පහසුකම් ලබාගැනීමට හැකිවන පරිද්දෙන් අදාල නෛතික තත්වයන් සැකසීමට අවශ්‍ය කටයුතු සොයා බලන බවද ගරු අමාත්‍ය චමල් රාජපක්‍ෂ මැතිතුමා මෙහිදී ප්‍රකාශ කළේය.

**ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්යක්‍ෂමතාව ඉහළ නැංවීමට කැපවීමෙන් හා කාර්යක්‍ෂමව සිය දායකත්‍වය පළ කළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සියලු කාර්ය මණ්ඩල වෙත ද ගරු අමාත්‍යවරයා සිය ප්‍රසාදය සහ කෘතඥතාව පළ කර සිටියේය.**

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය නව නැංගුරම් ලෑමේ ප්‍රතිපත්තියක් ආරම්භ කරයි.

වින්ඩෝ බර්තින් (Window Berthing) නමින් හැඳින්වෙන නව, නැංගුරම් ලෑමේ ප්‍රතිපත්තියක් 2007 නොවැම්බර් 18 දින සිට ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය කටයුතු යොදා තිබේ. කොළඹ වරාය හා ඉන්දියානු අර්ධද්වීපය අතර සමුද්‍රික ප්‍රවාහන සේවාවන් හි කාර්යක්‍ෂමතාව වැඩි දියුණු කිරීමේ අරමුණින් මෙය ක්‍රියාවට නැංවේ.

මේ යටතේ, නෞකාවක් වරායට සේන්දු වීමට ප්‍රථමයෙන් වෙන් කරවා ගැනෙන නියමිත කාල පරාසය මුලුමනින් ම එම නෞකාව වෙනුවෙන් වෙන් කර තැබෙන අතර, නෞකාවේ යම් ප්‍රමාද වීමක දී අදාල අවස්ථාව සම්පූර්ණයෙන් ම අහිමි කෙරේ. ඒ අනුව අදාල නෞකාවට වරායේ නැංගුරම් ලෑම පිණිස හිමිවන්නේ පසු අවස්ථාවකි. වර්තමානයේ ලොව පුරා වරාය රැසක ක්‍රියාත්මක වන්නේ ද මෙම ප්‍රතිපත්තිය වන අතර, කොළඹ වරායේ පුද්ගලික අංශයට අයත්, එස්.ඒ.ජී.ටී. පර්යන්තයේ ක්‍රියාත්මක කෙරෙන්නේ ද එම ප්‍රතිපත්තිය වෙයි.

ඒ අනුව මෙතෙක් පැවැති, කලින් දැනුම් දුන් නෞකා වරාය වෙත පැමිණෙන ප්‍රමුඛතා පිළිවෙළ අනුව ඒවාට නැංගුරම් ලෑමේ පහසුකම් සැපයීමේ ක්‍රමවේදය අහෝසි කෙරේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මූලිකව මෙම නව ප්‍රතිපත්තිය චෙන්නායි හා තූත්තුකුඩි වරායයන් හි අදාල ක්‍රමවේදයට සමගාමීව එම වරායයන් හි සිට කොළඹ වරායේ ජය බහලු පර්යන්තය හා සමගි පර්යන්තය වෙත පැමිණෙන හා මෙහි සිට එම වරායයන් වෙත යාත්‍රා කෙරෙන ප්‍රධාන නෞකා (Main Line) හා පෝෂක නෞකා (Feeder Line) සේවා අරභයා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම නව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කෙරෙන වරායයන් දෙකක් අතර සමුද්‍රික ප්‍රවාහනයේ දී වඩා කාර්යක්‍ෂමව හා මනා සංවිධිත භාවයකින් යුක්තව බහලු නෞකාවන්ට වඩා ඉක්මන් බහලු ප්‍රවාහන කටයුතු සිදු කළ හැකි අතර, එමගින් අදාල සේවා ලාභීන් වෙත ද වඩා කාර්යක්‍ෂම හා සංවිධිත සේවාවක් සැපයෙනු ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය මූලිකව මෙම

13 වන පිටුවට...

## තීර්ථ බිඳක්....

තීර්ථ ඔබගේ පුවත්පතයි. ඔබ සඳහාම වෙන් වූ පුවත්පතයි. ජාතියේ හදවත වූ වරාය නිතැතින්ම එහි කාර්යක්ෂම භාවයත, ප්‍රාණයත්, සේවයේ අගය වටහා ගැනීමත්, ජාතියට විදහා දැක්වීමේ හැකියාව මත යන ඉදිරි ගමනක් ඇති එබැවින් වරාය හා නාවික කටයුතු කෙරෙහි ජනතා ප්‍රසාදය වඩාත් හිමි විය යුතු, අගය පැවසිය යුතු අමාත්‍යාංශයක් බවට පත් කිරීමේ පූර්වාදර්ශයක් වශයෙන් ක්‍රියා කිරීම ද වැදගත් වන්නේ ය.

මහ මුහුදේ කුණාටු, සුළි සුළං නැත්තේ නොවේ. රළු ගල්පර නැත්තේ ද නොවේ. නැවියා ඒ දෙස මැනවින් බලා නැව හසුරු වන්නේ ය. ජයග්‍රහණය ළඟා කර ගන්නේ ''තීර්ථ" වෙත ළඟා වීමෙනි.

දුරකතන - 2421927
3460/ 3600
ෆැක්ස් - 2451917

සුභ ප්‍රාර්ථනා, අලුත් බලාපොරොත්තු දෝත දරාගෙන අළුත් ජනේරුවක් ඇවිත්. ගෙවුණු වසර තුළ නෙළාගත් අත්දැකීම් අපේ ජීවිත වලට එකතු වෙලා. සැවොම එකතු වී 2008 පිළිගන්න මත්තෙන් අපි අපේ ජීවිත දෙස ආපසු හැරී බලමු.

ගතවුණු වසර තුළ ඔබ ඔබේ ඉලක්කයන් අරමුණු කරා ලඟා වුවාද කියා මදක් සිතා බැලුමට මේ හොඳම වේලාවයි. ඔබ සැලසුම් කළ කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වී තිබේද යන්න සොයා බලා ඔබේ කටයුතු සාර්ථක වී තිබේ නම් වඩාත් තුටු පහටු සිතුවිල්ලෙන් 2008 පිළිගැනුමට ඔබට හැකිවනු ඇත. 2007 වසරේ ඇරඹි කටයුතු මදකින් හෝ අසාර්ථක වූයේ නම්, පසුබට වූයේ නම් ඔබට වැරදුණු අතපසුවුණු තැන් සොයා බැලීමට මේ හොඳම වේලාවයි. ගතවූ දින 365 තුළ අප කළ කී ඬී යළි පසක් කර යුතුකම් හා වගකීම් ඉටු කිරීමේ කර්තව්‍යයන් හිදි අප අතින් සිදුවූ මගහැරීම් හා වැරදි ක්‍රියාවන් පිළිබඳ ස්වයං විවේචනයක් තුළින් සිතා බලා, ඒ ඔස්සේ නව වසර ඇරඹීම හෙට දවස වඩාත් සඵල කර ගැනීමට හේතු වන්නේය.

වරාය උප සංස්කෘතියේ කාර්යාල කාමරයේදී, වැඩ බිමේදී ඔබ විසින් කළ යුතු නිශ්චිත රාජකාරියක් ඇත. කාලය කා දමන්නෙකු ලෙසින් අනිසි ලෙස අතිකාල හා වැටුප් ලබමින් ආයතනය කාබාසිනියා කරන්නෙකු වීම හෝ සේවක මහත්ම මහත්මීන් ලෙසින් තමා සතු හැකියාවන් හා අඩුපාඩු හඳුනා ගනිමින් එම හැකියාවන් වැඩි දියුණු කරගනිමින්, අඩුපාඩු අවම කරගනිමින් නිශ්චිත ඉලක්ක කරා යොමු වෙමින් රැකියාවේ චිරස්ථිතිය සකස් කර ගන්නවාද යන්න උදාවූ නව වසරේ හෝ සිතිය යුත්තකි.

ශ්‍රී ලාංකිකයන් ලෙසින් ප්‍රෞඩ ඉතිහාසයක් උරුමව ඇති අපහට සමුද්‍රික ශිෂ්ඨාචාරයේද දිගු ගමනක් යාමට ඇවැසි ශක්තිය අප සතුව ඇත. එනමුදු සම ශක්තිය පිහිටීමේ සුවිශේෂිතාවයෙන් හෝ යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් පමණක් කළ හැකි වූවක් නොවේ. ඒ සඳහා මානව සම්පත සතු වටිනාම දායාදය වන ශ්‍රමය ප්‍රශස්ත ලෙසින් උපයුක්ත විය යුතුය. මේ, ''ඔබ කරන රැකියාවට ආදරය කරන්න''යන පැරණි කියමන අප සැවොම සිහියේ තබා ගත යුතු කාලපරිච්ඡේදයකි. ඔබ ඔබගේ රැකියාව ඇල්මකින්, සන්තුෂ්ටියකින් යුක්තව කරන්නේ නම් ඒ තුළින් දියුණුවීම ඉහළට යාම හා අදාල ක්ෂේත්‍රයේ දක්ෂයකු වීම අපහසු නොවනු ඇත. හොර ලෙඩ බොරු නිවාඩු අවශ්‍ය නොවනු ඇත. ඔරලෝසුවේ කටු දෙස අනිමිස ලෝචනයක සිට නවාතැන් කරා යාමට අවශ්‍ය නොවනු ඇත. හෘද සාක්ෂියට එරෙහිව අතිකාල සේවයේ යෙදීමට අවශ්‍ය නොවනු ඇත. තම සේවා ආයතනය දෙවන නිවස මෙන් සලකා තම හැඟීමෙන් කටයුතු කිරීම උදා වූ 2008 වසර සඵලදායි කරගැනීමට මෙන්ම සමුද්‍රික නිවැසියන් ලෙස කොළඹ වරාය කේන්ද්‍රීය කරගත් ශ්‍රී ලංකා වරාය අධිකාරිය කලාපයේ ප්‍රශස්ත සේවා සැපයුම් ආයතනය බවට පත් කිරීමට සේවක සැවොම තිර අදිටනින් කටයුතු කිරීමට මේ හොඳම වේලාවයි. ලැබුණු නව වසර කාර්යක්‍ෂමතාවය ඵලදායිතාවය කේන්ද්‍ර කරගත් සුභ නව වසරක් වේවායි 'තීර්ථ' ඔබවෙත ඉතසිතින් ප්‍රාර්ථනා කරයි.




තීර්ථ

## සාමූහිකත්ව ප්‍රවේශය

**උපදේශක හා අධීක්ෂණ මණ්ඩලය**

එම්.ඩබ්.එෆ්. විමලසූරිය
නලින් අපොන්සු
උපාලි සොයිසා
නිමල් ජයතිස්ස
ඒ.බී. දයානන්ද

**නිරීක්ෂණය**
කුමාරි ජයසුන්දර
හර්ෂ උදයකාන්ත පීරිස්

**සංස්කරණය**
උපුල් ගුරුගේ

**පිටු සැකසුම**
උදිත චන්දන

**සහාය පිටු සැකසුම**
දිමුතු තෙන්නකෝන්

**පරිගනක අකුරු ඇමුණුම**
රේණුකා ආරියරත්න
සත්‍යා චතුරිකා

**තාක්ෂණික සහාය**
රුක්ෂාන් සමරධීර
අසංක රාජපක්ෂ

**ඡායාරූප**
ආලෝක අයි ද සිල්වා
ඩී.කේ. වැලිකල
මහින්ද තෙන්නකෝන්

**සම්බන්ධීකරණය**
දිල්රුක් ජයසේකර
සංජීව විජේසේකර
දේවිකා හෙට්ටිආරච්චි

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශයේ ප්‍රකාශනයකි.





01. මානව සම්පත් අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව කළමණාකාරීත්ව තීරණ දනුම් දීමේ අවස්ථාවේදී සාකච්ඡාවට බඳුන් කෙරිණි. එහිදී, සුපිරින්ටෙන්ඩන් ඉංජිනේරුවන් (Superindending Engineer) බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සේවා පළපුරුද්ද ඉංජිනේරුවන්ගේ ශ්‍රේණි ඉහළ නැංවීමට අදාලව ඒ පිළිබඳව සැලකිල්ලට ගෙන, වසර 10 සිට 06 දක්වා සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කර තිබේ.

02. ඇතැම් සංශෝධනයන්ට යටත්ව, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක පිරිස් හි දූ දරුවන්ගේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව ප්‍රධාන මානව සම්පත් කළමණාකරු විසින් ඉදිරිපත් කර තිබූ වාර්තාව සාකච්ඡාවට බඳුන් කිරීමෙන් අනතුරුව එය අදාල සංශෝධනයන් වූ,
    1. සියලු පුහුණු කිරීම් උදෙසා වයස් සීමාව වසර 16 සිට 28 දක්වා සංශෝධනය කිරීමටත්,
    2. ගිණුම් ලිපිකරුවන් සඳහා අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් එක් වරකට විෂයන් 3ක් සමත් වී තිබීමත් (එහිදී වාණිජ විෂය ධාරාවෙන් පෙනී සිටින අයදුම්කරුවන්ට වැඩි ඉඩප්‍රස්ථා සැලසෙන පරිදි) යන කරුණු වලට අදාලව, ඉහත පුහුණු කිරීම් වැඩසටහන් දියත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කරන ලෙසට තීරණය කර තිබේ.

03. ගාලු වරායේ ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන් සඳහා දැනට පවතින වරාය පරිශ්‍රයෙහිම මහල් කිහිපයකින් යුත් එක් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ ශක්‍යතාව පිළිබඳ සොයා බැලීමට ද තීරණය කර තිබේ.

04. ජාතික නාවික සුභසාධන සංගමය (National Seafarers Association) සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ද සහායෙන් ඒකාබද්ධව ඉදිකිරීමට නියමිත CSC ගොඩනැගිල්ලේ නවාතැන් පහසුකම් සැලසීමට තීරණය කර තිබේ. එමෙන් ම මීසම මගින් මගින් නැවියන් වෙත සැපයෙන ප්‍රවාහන කටයුතු, එක්වරකට සීමා කිරීමටත් එනම්, 1830 පැය ට නෞකාවේ සිට මීසම වෙත මීසම වෙතත් 2130 පැයට මීසමේ සිට නෞකාවට රැගෙන ඒමටත් තීරණය කර තිබේ.

05. ප්‍රචාරක වැය ශීර්ෂ උපයෝගී කොට ගෙන රුපියල් 7500.00 බැගින් වූ ආඝ්‍රාණක (nebulizers) තුනක් රාජ්‍ය ඔසු සල වෙතින් මිලදී ගෙන කොළඹ නයනාරෝග්‍යශාලාව වෙත ප්‍රදානය කිරීමට ද තීරණය කර ඇත.

06. කේ.එච්. සිරිසෝම මහතා විසින් බිලියඩ් ශූරතාවය දිනාගැනීම පිළිබඳව උපහාර පිරිනමනු වස් රුපියල් 1,50,000,00 වටිනා මුදල් ත්‍යාගයක් හෝ ක්‍රීඩා භාණ්ඩ පිරිනැමීමට උත්සවයක් සංවිධානය කිරීමට සහ එහිදී, විවිධ ක්‍රීඩා ඉසව් යටතේ ශූරතා දිනා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත කීර්තිය ගෙනා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ද සහභාගීත්වයෙන් එම උත්සවය පැවැත්වීමට ද වැඩි දුරටත් තීරණය කර තිබේ.

## කොළඹ දකුණ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ දියකඩනය සකස් කිරීම මුල් කාර්තුවේ ඇරඹේ

කොළඹ වරායේ කලාපීය ස්ථාවරත්වය තවදුරටත් ශක්තිමත්ව පවත්වා ගනිමින් අනාගත සුවිසල් බහළු නෞකා සඳහා පහසුකම් සලසන ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමේ අරමුණින් ඉදිකිරීමට යෝජිත කොළඹ දකුණු වරායේ දියකඩනය සකස් කිරීම මේ වසරේ මුල් කාර්තුව තුළ ඇරඹීමට නියමිත අතර පර්යන්ත ඉදිකිරීම් කටයුතු 2009 මුල් කාර්තුවේ ඇරඹීමට සැලසුම් කර ඇත. කලාපයේ ජාත්‍යන්තර බහළු ප්‍රවාහන කටයුතු වල අපේක්ෂිත වර්ධනය සලකා බලන කළ එමනිසා දකුණු ආසියාවේ ප්‍රධාන ප්‍රති නැව්ගත කරන මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව යොදා ගැනීමේ වැඩි ඉඩ ප්‍රස්ථා දක්නට ලැබේ.

2000 වසරේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ දියත් කෙරුණු සාර්ථක ශාක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව 2003 වසරේදී මෙහි සවිස්තර විමර්ශන ඉංජිනේරු නිර්මාණ සහ ආයෝජන සැලසුම් සකස් කිරිම ආරම්භ කළ අතර 2005 වසරේදී එම කටයුතු අවසන් කෙරිණි. මෙම ව්‍යාපෘතියේ පළමු අධියර යටතේ අවම වශයෙන් බහළු නෞකා 3 කට පමණ පහසුකම් සැලසෙන මීටර් 1200 ක දිගින් යුතු පර්යන්තයක් ලබන වසර වන විට ඉදි කිරීමට අපේක්ෂිතය. එමනිසා කොළඹ වරාය ධාරිතාවය බහළු ඒකක මිලියන 2.5 කින් වර්ධනය කර ගැනීමට අපේක්ෂිත වන අතර මිලියන 7.5 ක අමතර ධාරිතාවයක් කරා පෙල ගැසීම මෙම ව්‍යාපෘතියේ අරමුණු අතර ප්‍රධාන වේ.

## 2008 වර්ෂය නියමාකාරයෙන් ....

01 පිටුවෙන්

නිලධාරීන් අධ්‍යාපන චාරිකා සඳහා පිටත් කර හැරීම මගින් ජාත්‍යන්තර තරගකාරීත්වය අනුව වහා ඉටු කළ යුතු නවීකරණ කාර්යයන් පිළිබඳ දැක්මක් ලබාදීමද අප විසින් ක්‍රියා කර ඇත. බහුතරයක් වූ වරාය සේවකයන්ට ප්‍රයෝජනවත් වන නව සේවා මුර ක්‍රමයක් පිළිබඳව සාර්ථකව අත්හදා බැලීමටද අපට හැකිවී තිබේ.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට හිමි දේපළ වත්කම් පිළිබඳ තහවුරු කරගැනීම උදෙසා ව්‍යාපෘති ගණනාවක් ද අප විසින් දියත් කර ඇත.

2008 වර්ෂයේ අයවැය යෝජනා මගින් අපගේ වාප්පු රැඳවුම් ගාස්තු කැපී පෙනෙන ලෙස අඩු කිරීම මගින් ශ්‍රී ලාංකික ආනයන අපනයනකරුවන් වෙත ප්‍රමුඛ දායකත්වයක්ද අත්කර දී තිබේ. පර්යන්ත කළමනාකරණ පද්ධතිය, මූල්‍ය කළමනාකරණය හා ගිණුම් පද්ධතිය, ජීව මිතික ප්‍රවේශ පාලන පද්ධතිය වැනි තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාවට නැංවීමේ අධියර දක්වා ද අප ගමන් කර ඇත. කෙටියෙන් පවසතොත් ඉතා ප්‍රශස්ත ලෙස අපි අපගේ ඉදිරි ගමන සටහන් කර සිටිමු.

කෙසේ වතුදු, තවමත් අප විසින් සම්පූර්ණ කරන්නට නොයෙදුණු ගමනාන්තයන්ද කිහිපයකි. ඉතා වැදගත් ලෙසින් නව වැටුප් ව්‍යුහය හඳුන්වා දීම සහ ක්‍රියාකාරීත්වය පදනම් කරගත් වන්දි ප්‍රදානය ක්‍රමවේදයන් තුලින් අපේක්‍ෂා කළ ඵලදායිතා ඉලක්ක ඉහළ නැංවීම කෙරෙහි අප තවමත් ශක්‍යතාවය පෙන්වා නැත. එමෙන්ම අප කාලය, මුදල් සහ සම්පත් උපරිම අයුරින් අපතේ යාම් වළක්වාගෙන නොමැත. තරගකාරී ලෙස ප්‍රමාණවත් වන පරිදි අප විසින් වැය පස පාලනය කර නොමැත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය වටා තමවත් දූෂණය හා කළමනාකාරීත්වයේ දුර්වලතා පවතී. 2008 වර්ෂයේ නියමාකාරයෙන්ම ශක්තිමත්ව ඉදිරියට ඒම අපගේ ඉලක්ක වන නිසා ඉහත කරුණු පිළිබඳ මනා වැටහීමෙන් දැඩි කැපවීමෙන් කටයුතු කිරීමට අපට අවශ්‍යව ඇත. ඉදිරියේ ඇති ඉතා වැදගත් කාල පරිච්ඡේදය හමුවේ පුද්ගලිකව අප පිළිබඳව සිතනවාට වඩා ආයතනික අභිමථාර්ථ පෙරදැරිව කටයුතු කිරීමට ඉදිරිපත් විය යුතුය.

මූල්‍ය වශයෙන් ස්වාධීනව රැඳී සිටීමට අපට අවශ්‍ය නම් මෙන්ම ඒකාබද්ධ අරමුදලෙහි සහ විදේශ විනිමය සංචිතයන්හි ප්‍රධාන දායකයෙකු ලෙස කටයුතු කිරීමට අපට අවශ්‍ය නම් අනිවාර්යයෙන්ම අප තරගකාරී මෙන්ම වානිජ වශයෙන්ද ප්‍රතිඵලදායී බවට පත්විය යුතුය. එක් අතකින් එස්.ඒ.ජී.ටී. (SAGT) අංශය සමග ශක්තිමත් ලෙස තරග කිරීමට අපට සිදුවන අතර, ඒ අතරම සමස්ත ලෝකයටම එක්සත් කොළඹ වරායක් ප්‍රවර්ධනය කළ යුතුය. සමස්ත ශ්‍රී ලංකා දේශයම සත්‍ය වශයෙන් සමුද්‍රික ජාතියක් ලෙස ගොඩ නැගීමේ කර්තව්‍යයට අප උරදිය යුතුය.

ඉදිරියට ඇති අභියෝගයන්ට මුහුණ දීම තුලින් වෙනස්ක ඇති කිරීමේ මෙහෙවරට දායක වීමට අප සෑම කෙනෙකුටම හැකියාව ඇත. එබැවින්ම සියලුදෙනාගෙන්ම වඩා උසස් ක්‍රියාකාරීත්වයක් හා වැඩි කැපවීමක් මම අපේක්ෂා කරමි. අවසානයේදී එමගින් ලබන ප්‍රතිලාභ දැඩි ඉල්ලීම් මගින් ලබාගන්නා කවර දේටත් වඩා ඉදිරියෙන් පවතිනු ඇත.

## තීර්ථ වැදගත්කම

වරායේ සේවක මහත්ම මහත්මීන්ට වරායේ සිදුවන ක්‍රියාදාමයේ විවිධ අවස්ථා හා එක් එක් කොට්ඨාශයන්ගේ ක්‍රියාකාරකම් බුද්ධිමත්ව දැනගැනීමට පළවෙන තීර්ථ පුවත්පත ප්‍රථම යෙන් ම ඇගයීමට පාත්‍රවිය යුත්තේ සංවර්ධන පුවත්පතක් ලෙස එහි කාර්යභාරය අද්විතීය බැවිනි.

වරායේ සිදුවීම් සේවක මහත්ම මහත්මීන්-ගෙන් ග්‍රාහක ගතවන කටකථා වලින් දැනගන්නවාට වඩා තාර්කික ලෙසින් වරායේ හෙට දවසේ ගන්නා ක්‍රියා මාර්ග පිළිබඳ තීර්ථ පාඨකයන් වෙත කරනා හෙළිදරව්ව ඉතා වැදගත්ය.

මේසා වගකීමක් දරන තීර්ථ පුවත්පත විටෙකදී වැදගත් වීමටත් තවත් අවස්ථාවකදී වැදගත් නොවීමටත් හේතුවක් නොමැත.

නව වැටුප් ව්‍යූහය ඇතුලත් වූ කලාපය උණු උණුවේ සෑම සේවක මහතෙකු හටම බෙදාහැරිමට උද්යෝගි වූ පරිපාලන නිලධාරින් අනෙකුත් මාසවල තීර්ථ කලාප තම කාර්යාල වල සේවකයන් අතට පත් නොකොට ගොඩ ගසාගෙන සිටින්නේ මන්ද යන්න මාහට ඇති පැනයයි.

වරාය හා වරාය ආශ්‍රිත වටිනා තොරතුරු මෙන්ම ඔබේ දුවා දරුවන්ගේ හැකියාවට, සේවක ඔබේ ක්‍රීඩා කෞශල්‍යයට, හැකියාවට මාධ්‍යමය ඉඩක් ලබාදෙන තීර්ථ පුවත්පතට හිමි ස්ථානය ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි. එය සෑම සේවක මහත්ම මහත්මීන්හටම ලැබීමට සැලසෙන බෙදාහැරීම් ක්‍රමවේදයක් සකස් කොට මැනවින් පුවත්පත බෙදා හැරීමට කටයුතු කරන මෙන් අදාල අයවලුන්ගෙන් ඉල්ලා සිටිමි. සෑම සේවක මහත්ම මහත්මියක වෙතම ලැබිය යුතු තීර්ථ පුවත්පත කියවීමේ අභිප්‍රායෙන් බැහැර කොට වෙනත් කටයුතු සඳහා යොදා ගැනීම හෙළා දකින අතර, උදාවූ වසරේ දී හෝ විධිමත් බෙදාහැරීම් ක්‍රමවේදයක් ඔස්සේ කොළඹ වරාය මතු නොව වරාය අධිකාරියේ සෑම වරායකම සේවක මහත්ම මහත්මීන්ගේ, දූ දරුවන්ගේ දැනුම, සමුද්‍රික අධ්‍යාපනය, කලා හැකියා කුසලතාවයනට ප්‍රවේශයක් සපයමින් තීර්ථ ට කටයුතු කිරීමට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරන අතර, දැඩි ආරක්ෂාකාරි හේතුන් මත වරාය නැරඹුම සිහිනයක් වූ අපේ කාලයේ ළමා පරපුරට තීර්ථ තුළින් වරාය හා සමුද්‍රික ක්ෂේත්‍රය පිළිබඳ දැනුම් සම්භාරයක් එක්කර ගැනීමට, තීර්ථ තුළින් මහඟු අවස්ථාවක් උදාකර ගත හැකි බැව් ඔබ දැනසිටිය යුතුම කරුණකි. 2008 නව වසර තීර්ථ පුවත්පතටත්, තීර්ථ පාඨක ඔබ සැමටත් සියළු අපේක්ෂාවන් ඉටුවන සුභ නව වසරක් වේවායි සුභාශිංසන එක් කරමි.

නන්දන පරණවිතාන - 6සී/එන්එල්/7552



මම ගාල්ල වරායේ දිය කොවුලා යාත්‍රාවේ සේවය කළේ. ඔය අතරේ තමයි නොසිතු නොපැතු වෙලාවක සුනාමිය ආවේ. එතකොට දිය කොවුලා යාත්‍රාවේ හිටියේ, මමයි සරත් කියා මගේ මිතුරෙකු පමණයි. කොහොමහරි ඇණියේ හා අවරේ කඹ බුරුල් කරලා අපි යාත්‍රාව බේරාගත්තා.

ජීවිතේ පරදුවට තබා යාත්‍රාව බේරා ගැනීම පිළිබඳ එවකට සිටි සභාපතිතුමා, වත්මන් උප සභාපතිතුමා, වරායේ ප්‍රධාන ඉංජිනේරුතුමා, හොලන් තානාපතිතුමා මට සුභ පැතුවා. ප්‍රධාන ඉංජිනේරු සරත්චන්ද්‍ර මහතා පැවසුවා මට හා මගේ මිතුරාට පදක්කම් සහ සහතික පත්‍ර ලබාදීමට කටයුතු කරන බවටත්, ඕනෑම උදව්වක් අප වෙත කරන බවටත්. නමුත් මේ වනතුරුත් අප වෙත ඒ පදක්කම් ලැබුනේ නැහැ.

'ලස්කල්' තනතුර සඳහා අයදුම්පත් කැඳෙව්වෙත් ඔය අවස්ථාවේදීමයි. මාහට ඕනෑම උදව්වක් දෙන බවට පැවසුවත් එහිදීත් මට අවස්ථාවක් හිමිවුණේ නැහැ.

සුනාමියෙන් හික්කඩුවේ සීනිගම දේවාලය අසල පිහිටා තිබූ මගේ නිවස සම්පූර්ණයෙන්ම විනාශ වුණා. සුනාමියෙන් අලාභ හානි වූ වරාය සේවක සේවිකාවන්හට මුදල් දීමනාවක් ලබාදුන්නා. මමත් ඒ සඳහා ඉල්ලුම් කොට එයට අවශ්‍ය ග්‍රාමසේවක සහතික ඇතුළු සියළු ලියකියවිලි ඉදිරිපත් කළා. නමුත් මට කිසිම දෙයක් ලැබුනේ නැහැ.

මාහට සිදුව ඇති මෙම අසාධාරණයන් හට සාධාරණ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කරන ලෙස කළමණාකාරිත්වයෙන් ඉල්ලා සිටිමි.

ඒ.එච්. නලින් කුමාර - ඩෙක්කරු (Calassy) - CE/T 9922

## වරාය ආරක්ෂක නියාමකට මල් මිටක්

2007.11.17 වන දින ජය බහලු ආරක්ෂක දොරටුවේ (ගේට්ටු අංක 5) සේවයේ නිරතව සිටි ආරක්ෂක නියාමක - අජන්ත සංජීව මහතා විසින් කරන ලද මහඟු උපකාරයක් පිළිබඳව දැනුම් දීමට කැමැත්තෙමි.

එදින මා එම දොරටුවෙන් වරායට ඇතුළු වෙද්දී මාගේ මුදල් පසුම්බියේ තිබී රුපියල් 500/= ක මුදල් නෝට්ටුවක් දොරටුව අසල වැටී, මා ඒ පිළිබඳව දුරකථනයෙන් දොරටුවට දැනුම් දුන් අවස්ථාවේ එහි සේවයේ යෙදී සිටි ඉහත නම සඳහන් ආරක්ෂක නියාමක මහතා එම මුදල් ඇහිඳ නැවත මාහට ලැබෙන්නට සලස්වන ලදි.

එදිනම ඒ මහතාම තවත් පකිස්තාන් ජාතික මහත්මයෙකුගේ රුපියල් 1000/= ක නෝට්ටුවක් වැටී තිබී එයද ඇහිඳ නැවත ඒ මහතා හට භාරදුන් බව මාහට දැනගන්නට ලැබුණි. සැබවින් ම මුදල් වලට ඕනෑම පහත් ක්‍රියාවක් කරන අද වැනි සමාජයක මෙවැනි සේවක මහතුන් අපගේ වරාය ආරක්ෂක අංශයේ සිටින බව දැනගන්නට ලැබීමත් මහත් සතුටකි.

ඩී.එස්.එස්.කොළඹගේ

වරාය කොමිෂන් සභාව පැවති සමයේ සිට සේවයේ යොදවා දැනට ධාවනයෙන් විශ්‍රාම ගන්වා ඇති වාෂ්ප දුම්රිය එන්ජින් කීපයක් වසර ගණනාවක සිට (1991 වසරේ පමණ සිට) ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දෙමටගොඩ දුම්රිය අංගනයක විවිධ කාලගුණ විපර්යාස වලට භාජනය වෙමින් විනාශ වීමට පටන්ගෙන ඇති බවත්, මෙම කෞතුකභාණ්ඩ විනාශ වී යාමට පෙර සුරක්ෂිතව වරාය අධිකාරියේ සමුද්‍රික කෞතුකාගාරයේ තැන්පත් කිරීමට පියවර ගන්නා ලෙසත් පසුගිය 2006 නොවැම්බර් - දෙසැම්බර් ''තීර්ථ'' මාසික පුවත් පත මගින් පෙන්වා දුනිමි.

නමුත් ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කළමනාකාරිත්වය විසින් මෙම කෞතුකභාණ්ඩ රැකගැනීමට මෙතෙක් කිසිදු පියවරක් නොගැනීම කණගාටුවට කරුණකි. එබැවින් මෙම කෞතුකභාණ්ඩ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතට ගෙන වරාය සමුද්‍රික කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනය සඳහා තැන්පත් කිරීමට පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අභිවෘද්ධිය උදෙසා කළමනාකාරිත්වය වෙත නැවත වරක් මෙසේ යොමු කරමි.

ඒ.ආර්.රාජපක්ෂ - ආරක්ෂක කොට්ඨාශය




# වරායේ මූල්‍ය තත්ත්වය හොඳ නැතැයි කියන කාරණාව පිළිගැනීමට අපහසුයි ....

## ශිරානි වන්නිආරච්චි - අධ්‍යක්ෂ (මුදල්)

**මිරිස්වත්ත කැප්පෙටිපොල විද්‍යාලයෙන් හා කොළඹ ආනන්ද බාලිකාවෙන් මුලකුරු හැදෑරූ ඇය විද්‍යා විෂය ධාරාව යටතේ අධ්‍යාපන සුදුසුකම් සපුරනු ලැබුවා. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ සහ ගණකාධිකරණය පිළිබඳ වරලත් කළමණාකාරිත්ව ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ වෘත්තිමය සුදුසුකම් සපුරා එහි අධිසාමාජිකත්වය උසුලන ඇය නමින් ශිරානි වන්නිආරච්චි නම් වන්නීය. කලක් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ (මුදල් හා සැපයුම්) තනතුර ද අනතුරුව පාරිභෝගික කටයුතු අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) ලෙසින් හා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ නි. සාමාන්‍යාධිකාරි (මුදල්) ලෙසින් කටයුතු කළ ඇය අද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) ලෙස කටයුතු කරයි. මේ වරායේ හෙට දවස පිළිබඳ ඇය සමඟ කළ විමසුමකි.**

සටහන - උපුල් ගුරුගේ





**මුලින්ම මුදල් කොට්ඨාශයේ කාර්ය භාරය පිළිබඳ කථාබහ කළොත්**

ඇත්තටම මුදල් කොට්ඨාශයේ කාර්ය භාරය වන්නේ කළමනාකාරිත්වයට සහ අනෙකුත් අධිකාරියේ දත්ත අවශ්‍ය වන පාර්ශවයන් වෙත නිවැරදි දත්ත සපයා දීමයි. ඊට අමතරව අධිකාරියේ සේවක මහත්ම මහත්මීන්ගේ වැටුප් ගෙවීම් කටයුතු, වරාය අධිකාරියේ ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය ආයෝජන නිසි ආකාරව පවත්වාගෙන යාම, කළමණාකාරිත්වයට හෙට දවසේ තීරණ ගැනීමට අවශ්‍ය නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීම මේ අතර ප්‍රධාන වෙනවා.

**බොහෝ දෙනා චෝදනා කරනවා මූල්‍ය තත්ත්වය හොඳ නැහැ කියා. කුමක්ද මෙහි සත්‍යාසත්‍යතාවය?**

වරායේ මූල්‍ය තත්ත්වය හොඳ නැහැ කියන කාරණාව පිළිගැනිමට අපහසුයි. නමුත් වරාය අධිකාරිය පෙරට වඩා සංවර්ධන යෝජනා ක්‍රම රැසකට ඉදිරියේදී යොමු වීමට අපේක්ෂා කරනවා. වරායේ සංවර්ධනය අත්‍යාවශ්‍යයෙන්ම විය යුත්තක්. එය වරාය අධිකාරිය නමැති ආයතනයේ පමණක් නොවෙයි රටේම ආර්ථික වර්ධනයට හේතු වන්නක්. නමුත් සේවක-යන් අතර අනියත බියත් ඇතිවී තිබෙනවා. අධිකාරිය වැටෙයි කියා. එහෙම දෙයක් වෙන්නේ නැහැ. සංවර්ධන කටයුතු සඳහා අපි මුදල් වියදම් කරන්නේ අපි ඒ වෙනුවෙන් මතු ආයෝජනයක් බලාපොරොත්තුවෙන්. වරායේ මූල්‍ය තත්ත්වයේ කිසිදු වරදක් නැහැ. නමුත් ඉදිරි වැඩ කටයුතු සඳහා මුදල් අවශ්‍ය නිසා අපි බොහෝම සකසුරුවමින් තමයි වියහියදම් කටයුතු සිද්ධ කරන්නේ. මං හිතන්නේ ඒක ඕනෑම ආයතනයක සිද්ධ වෙන දෙයක්. ඕනෑම දෙයක් දෙස සුභවාදීව බැලීමයි මෙහිදී වැදගත් වන්නේ.

මේ ලෙසින් ඉදිරි සංවර්ධන කටයුතු රැසකට මුදල් යෙදවීම තුළින් සේවක වැටුප් ගෙවීමේ අර්බුදයක් පැන නගින බවට අවිනිශ්චිත බියක් සේවක මහත්මීන් අතර තිබෙනවා. මං හිතන්නේ නැහැ එහෙම තත්ත්වයක් ඉදිරියේදී ඇතිවෙයි කියලා. මොකද සංවර්ධන ව්‍යාපෘති තුළින් අපිට වසරක් දෙකක් ඇතුළත ප්‍රතිලාභ ලැබීමත් සිදුවෙනවා. එබැවින් අපිට එහෙම තත්ත්වයක් උදාවෙයි කියා අනියත බියක් ඇති කර ගත යුතු නැහැ. ඒ වගේම ජයබහළු පර්යන්තයේ බහළු මෙහෙයුම් කටයුතු ප්‍රශස්ත ධාරිතාවයකට ගෙන යාමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මම හිතන්නේ නැහැ අපි අනවශ්‍ය ලෙස වියදම් නොකළොත්, නිරපරාදේ වියදම් නොකළොත් අපේ ඵලදායිතාවය වර්ධනය කරගැනීමට හැකි නම් එහෙම තත්ත්වයක් උද්ගත වන්නේ නැහැ.

**නව වැටුප් ව්‍යූහය සමගින් මුදල් කොට්ඨාශයේ හැසිරවීම පිළිබඳ නම් කළොත්**

ඇත්තටම නව වැටුප් ව්‍යූහය ක්‍රියාත්මක කළේ අපි සේවකයන්ට ප්‍රතිලාභ දීමේ අරමුණෙන් හා සේවකයන්ගෙන් ප්‍රශස්ත සේවාවක් වරාය අධිකාරියට ලබාගැනීමේ අරමුණින්. මෙහිදී මුදල් කොට්ඨාශයට යම් යම් ගැටළු වලට මුහුණ දෙන්න සිද්ධ වුණා. සේවක පිරිස වැටුප් පියවරයන්හි පිහිටුවීමේදී වරාය අධිකාරියේ සියළු සේවක සංඛ්‍යාව මත මානව සම්පත් කොට්ඨාශයටත් අපහසුතාවයක් ඇතිවුණා. නිවැරදි වැටුප් පියවරයන් මුදල් කොට්ඨාශය වෙත දැනුම් දීමට. මම හිතනවා අපි මේ වෙනකොට ඉතාමත් සාර්ථකව ඒ තත්වයට මුහුණ දී තිබෙනවා කියා. සේවක පිරිසෙන් 98% ක පමණ අපි නිවැරදි වැටුප් තලයන් හි පිහිටුවා තිබෙනවා. තව සුළු කොටසක යම් යම් ගැටළු තිබෙනවා. මොකද ඕනෑම දෙයක් කරනවිටයි ගැටළු මතුවන්නේ. මේ සඳහා මානව සම්පත් කෙට්ඨාශයෙන් සහ තොරතුරු පද්ධති කොට්ඨාශයෙන් හොඳ සහයෝගයක් ලැබුණා.

13 වන පිටුවට...

# ගම් දනව් සිසාරා විහිදෙන සහන් එළිය





වරාය අධිකාරියේ ටග් යාත්‍රා අංශයේ ක්‍රියාත්මක වෙන 'සහන් එළිය' සංවිධානය මේ වනවිට සමාජ සත්කාර රැසකටම දායක වී තිබෙනවා. පසුගියදා ඔවුන් කළ සමාජ සත්කාරයන් අතරේ සිව් නිවුන් දරුවන් හා තුන් නිවුන් දරුවන් හට අත්‍යාවශ්‍ය කිරිපිටි ඇතුළු ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමේ කටයුත්ත ප්‍රධාන වෙනවා.

වරාය අධිකාරියේ ටග් යාත්‍රා අංශය ප්‍රමුඛ අංශ 30ක සේවක මහත්ම මහත්මීන්ගෙන් සම්පාදනය වූ රු. 80,000 ක මුදල සහ 'සහන් එළිය' සංවිධානයේ සංචිතයෙන් ලබාගත් මුදලින් රු. ලක්ෂයක කිරිපිටි, ඇඳුම් පැළඳුම්, ළදරු ආහාර, කෙළි සෙල්ලම් බඩු රැගත් 'සහන් එළිය' සංවිධානයේ කට්ටිය උදෙන්ම තමන්ගේ උදාර කටයුත්ත ඇරඹුවා.

එක් දරු පවුලක් වෙසෙන්නේ ආඬිඅම්බලම කෝවින්නේ ප්‍රේමතිලක මාවතේ අංක 11 බී දරණ ස්ථානයේ. දරුවන් උපන් මුල් කාලයේ දරු පවුලට නොයෙක් උපකාර කළ අය සිටිය ද කිසිවෙකුට හැමදාම උදව් කළ නොහැකිය. දැන් දරු පවුලේ මුළු බර වැටී ඇත්තේ පියාගේ උරමතය. මේ දරු පවුල ජීවත් වන්නේ ගෙවීමේ ක්‍රමයකට ලබා ගන්නා ලද ඉඩමක තැනූ කාමර කැලි දෙකකය. ඉඩමට වාරික ගෙවමින් දරු පවුල නඩත්තු කිරීමට පියා දරන්නේ අපමණ වෙහෙසකි.

දරුවන් තිදෙනෙකුගේ වැඩ මවට පමණක් තනිවම කළ නොහැකි බැවින් පියා ද මවට උදව් කළ යුතු නිසා අතිකාල වැඩක් ද කර අමතර මුදලක් උපයා ගැනීමේ හැකියාව ද ඔහුට අහිමි විය. දරු පැටවුන් තිදෙනා බඩගිනි වී හඬන විට පියා කොයි ලෝකයකින් හෝ කිරිපිටි සොයා ආ යුතුය. වරාය අධිකාරිය ටග් යාත්‍රා අංශයේ 'සහන් එළිය' ප්‍රජා සත්කාරයේ නියමුවන් ඒ සඳහා ඔවුන්ට හැකි උපරිමයෙන් දායක වීම පිළිබඳ 'තීර්ථ' ඔවුන්ට වරාය අධිකාරිය සමස්ත සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් මෙසේ තුතිමල් පුද කරයි.

තුන් නිවුන් දරුවන්ගේ ප්‍රජා සත්කාරයෙන් පසු 'සහන් එළිය' සමාජ සත්කාර එකමුතු සංවිධානය සිව් නිවුන් දරුවන් වෙනුවෙන් උපකාර කිරීමට පෙළ ගැසුනා. ඒ කටාන ප්‍රදේශයේ නිලංකා මහත්මියට උපන් සිව් නිවුන් දරුවන් වෙනුවෙන්. ඔවුන්ට අවශ්‍ය කිරිපිටි හා ළදරු ආහාර පාන, ඇඳුම් පැළඳුම් ලබාදීමට ඔවුන් කටයුතු කළා.

ඉතින් 'සහන් එළිය' සමාජ සත්කාර එකමුතු සංවිධානයේ කටයුතු වලට දායක වන්නට ඔබත් කැමති නම් අමතන්න.

**මෙහෙයුම් කමිටු සංවිධායක**

**ඩග්ලස් පීරිස් - 077 3685347 හෝ**

**අභ්‍යන්තර දුරකථනයෙන් 3033/2286**

# "සිසු දිරිය" - ප්‍රජා සත්කාරක මෙහෙවර




ජාතියේ අනාගතය භාරගන්නා මල් කැකුළුවන් දුවා දරුවන්ගේ නෙත් පෑදීමේ උදාර වූ අරමුණින්, තොරතුරු පද්ධති කොට්ඨාශයේ වැ.බ. අධ්‍යක්ෂක ආචාර්ය ඩී.පී.එස්. ලොකුගේ මහත්මාගේ අනුශාසකත්වය යටතේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ වෘත්තීයවේදීන්ගේ සංගමය මගින් බණ්ඩාරවෙල කිතල්ඇල්ල නම් වූ දුෂ්කර ග්‍රාමයේ රත්මල් කන්ද ආරණ්‍යය මගින් පවත්වා ගෙන යනු ලබන ''ළමා හමුව'' අධ්‍යාපනික මධ්‍යස්ථානයට පරිගණක අධ්‍යාපනය සඳහා අවශ්‍ය අංගෝපාංග ලෙස නවීන මාදිලියේ පරිගණක යන්ත්‍ර 03ක්, වෙබ් කැම් යන්ත්‍ර 03ක්, පරිගණක මුද්‍රණ යන්ත්‍රයක්, පරිගණක මේස සහ පුටු ඇතුළු මෙවලම් සංගමයේ අරමුදලින් පසුගිය දා පරිත්‍යාග කරමින් මෙම උතුම් වූ සත්ක්‍රියාව සිදුකරන ලදී. මෙයට අමතරව කොට්ඨාශයේ මහත්ම මහත්මීන්ගේ නොමසුරු දායකත්වය මත ''ළමා හමුව'' මධ්‍යස්ථානයේ අධ්‍යාපනයේ අධ්‍යාපනය හදාරන 600ක් පමණ වන සිසු දරුදැරියන් හට උදාවන නව පාසැල් වාරයට අවශ්‍ය වන පාසල් උපකරණ ඇතුළු අධ්‍යාපනික මෙවලම් සංගමයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මෙදින බෙදාදෙන ලදී.

# හම්බන්තොට වරාය දියකඩනයේ ආදර්ශයනයක් අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ පරීක්ෂාවට



හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ඉදි කිරීමට නියමිත දිය කඩනයේ ආදර්ශනයක් පසුගිය දා කටුබැද්ද ජලභසුරු ආයතනයේ දී වරාය, ගුවන්සේවා, වාරිමාර්ග හා ජල කළමණාකරණ ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ විශේෂ පරීක්ෂාවට ලක් කෙරිණ. එහි දී හම්බන්තොට වරාය ව්‍යාපෘතිය සඳහා ඉදිකිරීමට යෝජිත දියකඩනයේ නියමිත ගණනය කිරීම් වල අනුපාතය අනුව කුඩා ප්‍රමාණයෙන් නිර්මාණය කරන ලද දිය කඩනයක ආදර්ශනයක ක්‍රියාකාරීත්වය පරීක්ෂාවට ලක් කෙරිණ.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති ප්‍රියත් බී. වික්‍රම, හම්බන්තොට වරාය ව්‍යාපෘතිය භාර ප්‍රධාන ඉංජිනේරු ජානක කුරුකුලසූරිය, නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු පී.ඒ.ඒ. හේවාගීගන, ලංකා ජලභසුරු ආයතනයේ කළමණාකාර අධ්‍යක්ෂ මලිත් මෙන්ඩිස් යන මහත්වරු ද එක් වූ හ.

# වරාය නිදහස් සේවක සංගමයෙන් තම සාමාජිකයනට කතරගමින් වන්දනා නිවහනක්



ශ්‍රී ලංකා වරාය අධිකාරියේ නිදහස් සේවක සංගමයේ සාමාජිකයන් වෙනුවෙන් එම සංගමයේ මූල්‍ය දායකත්වයෙන් කතරගම ප්‍රදේශයේ ඉදිකරන ලද දෙමහල් වන්දනා නිවහන පසුගිය දා සාමාජික අයිතියට පත් කෙරිණි.

මෙම අවස්ථාවට සපැමිණි ගරු වරාය හා ගුවන් සේවා අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා උත්සව සභාව අමතමින්,

වෘත්තීය සමිතියට අයත් අරමුදල් වැය කොට තම සාමාජිකයන් වෙනුවෙන් සුඛෝපභෝගී නිවාඩු නිකේතනයක් ඉදිකිරීම අනෙකුත් වෘත්තිය සමිතින්ට ආදර්ශයක් බවත් වෘත්තීය සමිතියක් ලෙස නිවාඩු නිකේතනයකට හිමිකම් කීම වාසනාවක් බවත් පැවසී ය.

හම්බන්තොට, ඔලුවිල්, ගාල්ල, ත්‍රි'මලය හා දකුණු කොළඹ වරාය සංවර්ධන කටයුතු ආරම්භ කිරීමත් සමඟ ඉදිරියේ දී විශාල සේවක පිරිසක් ආයතනය වෙත සම්බන්ධ කර ගන්නා බවත් පියවරෙන් පියවර වරාය සංවර්ධනය තුළින් රටේ ආර්ථිකයට වැඩි දායකත්වයක් ලබා දීය හැකි බවත් පැවසී ය.

මෙම කතරගම නව වන්දනා නිවහන සාමාජික අයිතියට පත් කිරීමේ උත්සව අවස්ථාවට ගරු වරාය හා ගුවන් සේවා අමාත්‍ය චමල් රාජපක්ෂ, නිදහස් සේවක සංගමයේ සභාපති භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර, සෞඛ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ එස්. අමරසිංහ, අමාත්‍යංශ අතිරේක ලේකම් රංජිත් සිල්වා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ප්‍රසන්න කළුතරගේ, වරාය නිදහස් සේවක සංගමයේ ප්‍රධාන සංවිධායක හේමන්ත කළුතරගේ ඇතුළු වරාය අධිකාරියේ උසස් නිළධාරීන් හා සේවක සේවිකාවන් රැසක් සහභාගී වූ හ.

# තොටමුණ

## වරාය සේවකයින් හට නොමිලේ ජෝතිෂ්‍ය සේවාවක්



චීන දේශයේ ජෝතිෂ්‍ය අනුව ගුප්ත අනාවැකි පැවසීමේ (නිමිති ඇල්ලීමේ) සේවාවක් නොමිලේ කර දීම සඳහා ගාල්ල වරාය අධිකාරියේ අධිකාරි (ආ) ජී.ජී. කපිල රත්න මහතා ඉදිරිපත්ව සිටී. වර්තමානයේ ගාල්ල වරායේ සේවක සේවිකාවෝ ඒ මහතාගෙන් ජෝතිෂ්‍ය සේවාව ලබා ගනියි. මේ වසර මුලදී කොළඹ වරායේ සේවක සේවිකාවන්ට ද එම අවස්ථාව රාජකාරියෙන් බැහැර කාල සීමාවන් තුළ ලබා දීමට ඔහු බලාපොරොත්තුවෙන් සිටියි. වැඩි විස්තර සඳහා 071 6525576 දුරකථන අංකයෙන් විමසන්න.


## ශ්‍රී ලංකා වරාය අධිකාරිය යැන්ග් මින්ග් (Yang Ming) සමුද්‍රික ප්‍රවාහන සේවාව හා පර්යන්ත සේවා ගිවිසුමකට

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, තායිවානයේ යැන්ග් මින්ග් සමුද්‍රික ප්‍රවාහන සේවා සමාගම හා සුවිශේෂී පර්යන්ත සේවා ගිවිසුමකට පසුගිය දා එළැඹිනි. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති සාලිය වික්‍රමසූරිය මහතා හා ආෂා ෂිපින් ලිමිටඩ් හි සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂ මැණික් පෙරේරා මහතා අතර 2007 දෙසැම්බර් මස 05 වැනි දින මෙම ගිවිසුම අත්සන් තැබිණි.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා වරාය අධිකාරියේ උප සභාපති ප්‍රියත් බී. වික්‍රම, කළමණාකාර අධ්‍යක්ෂ ඩබ්.ජී. සමරතුංග, අතිරේක කළමණාකාර අධ්‍යක්ෂ කපිතාන් නිහාල් කැප්පෙටිපොල, ආශා නැව් සමාගමේ සමූහ අධ්‍යක්ෂ ජේ.වී. එඩ්වර්ඩ්ස් සහ එහි සාමාන්‍යාධිකාරි ජනේෂ් රාමදාස යන මහත්වරුන් ඇතුලු පිරිසක් ද සහභාගි වූහ.

**කාර්යාලයේ දී මෙන් ම වැඩ බිමේ දී ඔබ මුහුණ දෙන්නා වූ විවිධ ගැටළු වලට පිළිතුරු සහ උපදේශන සේවාවක් ඇරඹීමේ අරමුණින් ඇරඹූ මෙම විශේෂාංගය තුළින් වරාය සේවක ඔබ මුහුණ දෙන්නා වූ විවිධ ගැටළු සඳහා විසඳුම් ලබා ගැනීමට හැක. අතිකාල සේවය, නිවාඩු රෙගුලාසි, කාර්ය සාධනය, ආදී නිරතුරුවම ඔබ දැනුවත්ව සිටිය යුතු අංගයන් පිළිබඳව ඔබව දැනුවත් කිරීමට ද අපි මෙහිදී ඔබ සමඟ පෙළගැසී සිටින්නෙමු.**

# ඵලදායි සේවාවක් සඳහා කාර්යය සාධන ඇගයීම



**ඒ.සී. වීරසූරිය**
**උපදේශක - කාර්මික සබඳතා**

ඔබගේ සේවක ගැටළුවලට පිළිතුරු සපයන්නේ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ කාර්මික සබදතා උපදේශක ලෙසින් කටයුතු කරන ඒ.සී. වීරසූරිය මහතාය. සේවක සබදතා ක්ෂේත්‍රය පිළිබඳ වසර 30 කට වඩා අත්දැකීම් සපිරි ඔහු කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මේ ක්ෂේත්‍රයේ කටයුතු කළ නිලධාරියෙකි.

පසුගිය තීර්ථ පුවත් පතෙහි අප විසින් අතිකාල සේවයට අදාලව කරුණු සාකච්ඡා කරන ලද අතර මෙවර ඔබගේ අවධානය සඳහා කාර්ය සාධන ඇගයීම ගැන සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් කළ යුතු යැයි අදහස් කළේ සේවක ඔබ අතර මේ ගැන විවිධ අදහස් හා මතිමතාන්තර පැතිර යන හෙයිනි. කාර්ය සාධන ඇගයීම සමහර සේවකයන් බියට පත් කරවන්නක් ලෙස පෙනී යන අතර එය එසේ වන්නේ, මින් අදහස් කරන්නේ කුමක්ද යන්න ගැන ඔබට නිසි වැටහීමක් නොමැති වීම නිසා වන්නට පිළිවන. එසේත් නොමැති නම් මේ ගැන වෙනත් අය දරණ අදහස් මත පදනම් කොට ගොඩනගාගත් මතයන් නිසාත් වන්නට ඉඩ ඇත.

කළමණාකරණය අද බොහෝ සෙයින් දියුණුවට පත්ව ඇති පුළුල් විෂයකි. කළමණාකරණය පිළිබඳව පර්යේෂණ කරනු ලබන ලෝකයේ විවිධ රටවල කළමණාකරණ විශේෂඥයින් එය විද්‍යාවක් හා ශාස්ත්‍රයක් ලෙස හඳුන්වනු ලබන අතර එහි වැදගත් අංගයක් ලෙස විශේෂයෙන් මානව සම්පත් කළමණාකරණයේදී සේවක කාර්ය සාධන ඇගයීම හඳුන්වා දී ඇත.

වරාය අධිකාරියේ විධායක නොවන සේවකයන් සඳහා කාර්ය සාධන ඇගයීමක් නොතිබූ බැව් පෙනී යයි. එවැන්නක් අලුතින් හඳුන්වා දීමේදී සේවක ඔබ නොසන්සුන්තාවයකට පත්වීම ස්වභාවිකය. එහෙත් වාර්ෂික වැටුප් වැඩිවීම ලබා දීමේදී සේවක පැමිණීම හා හැසිරීම සම්බන්ධව පරීක්‍ෂා කොට ඒවා ලබාදී ඇති බැව් පෙනේ. එය පැහැදිලි වන්නේ කිසියම් ප්‍රමාණයක ඇගයීම් ක්‍රමයක් පැවත ආ බවයි.

01. කාර්ය සාධන ඇගයීම වැඩ කොටසක් ඉටු කිරීමෙන් පසු එහි සාර්ථක හෝ අසාර්ථක භාවය සොයා බැලීම සාමාන්‍ය ජීවිතයේදී අප හැම දෙනෙක් විසින්ම පෞද්ගලිකව කරනු ලබන කාර්යයකි. ඔබ හැම දෙනෙක්ම කිසියම් කාලයක් පාසැල් අධ්‍යාපනය ලබා ඇති අය වේ. එක් එක් පාසැල් වාරය අවසානයේ හා වර්ෂය අවසානයේ පාසැලේ පරීක්‍ෂණ පැවැත්වේ. ඒවාට ඔබ ශිෂ්‍යයෙකු වශයෙන් අනිවාර්යයෙන් මුහුණ දිය යුතු වේ. මෙහිදී ඇගයීමට ලක්වන්නේ ඒ ඒ පන්තිවලදී වර්ෂයක් තුළ ඔබ උගත් විෂයයන් සම්බන්ධව දැනුම, පාසැලට පැමිණීම හා හැසිරීම යන කරුණුය. මෙම කරුණු සම්බන්ධව ඔබ හොඳින් ලකුණු ලබා ගත්තේ නම් ඉහළ පන්තියකට උසස්වීමක් ලබා ගත හැකි වේ. නිසි පරිදි ලකුණු ලබා නොගත්තේ නම් එම අඩුපාඩු කම් මග හරවා ගෙන කටයුතු කරනු ලබන බැව් ඔබගේ පාසැල් කාලය යළි මතකයට නගා ගතහොත් පැහැදිලි වනවා ඇත.

මේ අනුව කාර්ය සාධන ඇගයීම ඉහත දැක්වූ පාසැල් කාලයේ පැවති ඇගයීමට සමානව ඔබ රැකියාවේ යෙදෙන විට ද මුහුණ දීමට සිදුවී ඇති බැව් පෙනී යනවා ඇත. කිසියම් රැකියාවක් සඳහා ආයතනයක සේවයට බැඳෙන ඔබට එහිදී කළ යුතු සේවා වැඩ කොටසක් වෙන් වී ඇත. තවත් සමහරුන්ට සාමූහිකව කළ යුතු සේවා වැඩ කොටස් ද ඇත. මේ අනුව සේවා ස්ථාන වල විවිධ ක්‍රමයේ සේවාවන් ඇති බැව් පැහැදිලි වේ. සේවකයෙකු වශයෙන් ඉටුකළ යුතු කාර්ය කුමක් ද යන්න තීරණය කරනු ලබන්නේ ඒ ඒ අංශ භාරව කටයුතු කරන්නන් විසිනි. ඔවුන් විසින් අදාළ සේවකයන්ට නියමිත වැඩ කොටස් පවරා දෙනු ලබන අතර ඒවා ඉටුකළ යුතු අන්දම ගැන පුහුණුව හා අවශ්‍ය උපදෙස් ලබා දෙයි. සේවාවන් සඳහා යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා උපදෙස් ද ලබා දෙනු ඇත.

මෙසේ වැඩ පැවරීමෙන් පසු එම කාර්යයන් නිසි පරිදි ඉටුකරන්නේදැයි අධීක්‍ෂණ නිලධාරීන් විසින් වරින් වර පරීක්‍ෂා කරනු ලබයි. වර්ෂය අවසානයේදී නිලධාරීන් විසින් වරින් වර පරීක්‍ෂා කරනු ලබයි. වර්ෂය අවසානයේදී පුළුල් ලෙස වැඩ පරීක්‍ෂාකොට නියමිත කාර්යයන් ඉටුකිරීම සේවකයාට හැකි වී ඇත් ද? එසේ නොමැති නම් ඒවාට හේතු ද ඒවා වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග ද විධිමත්ව පරීක්‍ෂා කරනු ඇත.

මේ අනුව පැහැදිලි වන්නේ සේවකයා සිය වැඩ කොටස නිසි පරිදි ඉටුකරන්නේද ඔහුට ඉදිරියේදී වඩා වගකීම් ඇති තනතුරක යෙදිය හැකිද? රැකියාවේ හොඳින් කටයුතු නොකරන්නේ නම් එයට හේතූන් ද ඒවා වලක්වා ගැනීමට ගතහැකි ක්‍රියා මාර්ග ද විධිමත්ව සොයා බැලීම කාර්ය සාධන ඇගයීමක් මගින් සිදුකරන බවය. මේ අනුව මින් සිදු කරනු ලබන්නේ සේවකයන්ගේ සේවා ප්‍රතිඵලයන් විධිමත්ව ඇගයීමට ලක් කිරීම බව පැහැදිලි වනවා ඇත.

> **“සාර්ථක කාර්ය සාධන ඇගයීමක් සඳහා ඉදිරිපත් වන දෙපාර්ශ්වය සේවකයා හා ඇගයුම් කරන්නා ඔවුනොවුන්ට පැවරී ඇති කාර්යය කුමක්දැයි පැහැදිලිව වටහා ගෙන තිබිය යුතුය. කාර්ය සාධනයේ අවසන් ප්‍රතිඵලය විය යුත්තේ කාර්යක්‍ෂම සේවක පිරිසක් මගින් ආයතනයේ ඵලදායීතාවය වර්ධනය කර ගැනීමය. ඒ සඳහා දෙපක්‍ෂයම සද්භාවයෙන් කටයුතු කළ යුතු ය.”**

02. කාර්ය සාධන ඇගයීම සිදුවන්නේ කෙසේද?

මානව සම්පත් සංවර්ධන කළමණාකරණයේදී කාර්ය සාධන ඇගයීම සිදු කරන විවිධ ක්‍රමයන් ඇති බැව් මේ සම්බන්ධව පර්යේෂණයේ යෙදෙන්නන් විසින් හඳුනාගෙන ඇත. ඒවා අතරින් ක්‍රම කීපයක් මෙසේ දැක්විය හැක.

01. සේවකයාගේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව වාර්තාවක් සකස් කොට එමගින් ප්‍රතිඵල මැනීම.

02. සේවකයා සේවයේ යෙදීමේදී ඔහුගේ විවිධ විශේෂිත ගුණාංග ගැන පරීක්‍ෂා කොට ප්‍රතිඵල මැනීම.

03. රැකියාවේදී ඔහු හොඳින් ඉටුකළ කාර්යයන් පරීක්‍ෂා කොට අගය මැනීම.

04. සේවකයා ඉටු කළ සේවාවේ ප්‍රමිතිය අනුව ඇගයීම.

05. සේවකයන් අනිකුත් සමාන සේවකයන්ගේ සේවාවන් හා සසඳා අගය මැනීම.

06. සේවකයා ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කොතෙක් දුරට කටයුතු කර ඇති ප්‍රමාණය අනුව ඇගයීම.

මෙම ඇගයීම් ක්‍රම සේවකයා ආයතනයේ දරණ තනතුරු පදනම් කොට කාර්ය සාධනයේදී භාවිතා කරනු ලබයි. උදාහරණයක් ලෙස සාමාන්‍ය සේවකයෙකු හා කළමණාකරුවෙකුගේ කාර්ය සාධනය එකම ක්‍රමයක් යටතේ සිදු කළ නොහැකි වේ.

**03. වරාය අධිකාරියේ යෝජිත කාර්ය සාධන ක්‍රියාවලිය.**

දැන් අපි වරාය අධිකාරියේ කාර්ය සාධන ඇගයීම් ක්‍රියාවලිය කෙසේද යන්න සොයා බලමු. මේ සඳහා ඇගයීම් පත්‍රිකා 04ක් මගින් අදාල තොරතුරු සපයා ගැනීම සිදුකරනු ලබයි.

මින් පළමු වැන්න සේවකයාගේ පෞද්ගලික තොරතුරු හා නිවාඩු ලබා ගැනීම්, දඬුවම් ලබා ඇත්නම් ආදිය ගැන කරුණු දැක්වේ. ආකෘති පත්‍ර අංක 02 කාර්ය සාධනය සඳහා යොදා ගන්නා කාල පරිච්ඡේදය, සේවකයාගේ රාජකාරී ස්වභාවය, ඉටුකළ යුතු ඉලක්ක හා පවරන ලද රාජකාරි, ඒවා නිසි පරිදි ඉටුකර තිබේද යන්න සොයා බැලීම සිදුවේ.

අංක 03 පත්‍රිකාවේ සේවකයා ඇගයීමට ලක්වන කාලය තුළ සේවා ඉලක්ක දැක්විය යුතුය. එම ඉලක්ක සපුරා ඇති ප්‍රමාණය පරීක්‍ෂණ නිලධාරියා විසින් සටහන් කළ යුතුය. එසේ සටහන් කිරීමේදී සේවකයා සමග සාකච්ඡා කොට ඔහුගේ අඩුපාඩු සහ දක්‍ෂතාවයන් පෙන්වා දීම පරීක්‍ෂණ නිලධාරියා විසින් කළ යුතු වේ. පරීක්‍ෂණ නිලධාරීන්ගේ අවසාන නිගමනය සම්බන්ධව කොට්ඨාශ ප්‍රධානියා සෑහීමකට පත් විය යුතු වේ. එසේ නොමැති වුවහොත් නැවත ඇගයීමක් සිදු කළ යුතුය. අවසාන ඇගයුම් පත්‍රිකාවෙන් කොට්ඨාශයේ සියලුම සේවකයන් සම්බන්ධව ගනු ලබන තීරණ දැක්වීම සිදුවේ.

මේ අනුව පැහැදිලි වන්නේ ඇගයුම් ක්‍රියාවලියේදී ගනුලබන තීරණයන් සේවකයා සහ අධීක්‍ෂණ නිලධාරීන් අතර විධිමත්ව සාකච්ඡා කොට ගත යුතු බවය. ඒක පාක්‍ෂිකව තීරණ ගැනීමක් සිදු නොවීමට මෙහිදී ඉඩකඩ නොසැලසේ. තීරණයන්ට එළඹීමේදී ඒ සඳහා හේතු සහිතව තීරණ ගැනීම සිදුවිය යුතුය. සේවකයා සිදුකරන කාර්යය ගැන මනා වැටහීමක් සේවකයාට මෙන්ම ඔහුගේ අධීක්‍ෂණ නිලධාරීන්ට තිබිය යුතුය. මොවුන් දෙදෙනා ගැනම මනා අවබෝධයක් කොට්ඨාශ ප්‍රධානියාට තිබිය යුතු වේ.

කාර්ය සාධන ඇගයීමෙන් ලැබෙන ප්‍රතිඵල

04. කාර්ය සාධන ඇගයීමෙන් ලැබිය යුතු ප්‍රතිඵල සේවකයාට සහ ආයතනයට යනුවෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැක. මින් සේවකයාට ලැබෙන ප්‍රතිඵල අතරට ඔහුට තම සේවය කොතෙක් දුරට සාර්ථකව කරගත හැකි වී දැයි තක්සේරුවකට එළැඹිය හැක. ඔහුගේ දක්‍ෂතා මෙන්ම දුර්වලතාවයන් ද අවබෝධ කොට ගත හැක. ඔහුගේ දුර්වලතාවයන් හඳුනා ගැනීමටත් දක්‍ෂතා වැඩ දියුණු කර ගැනීමටත් අවස්ථා සැලසේ. තමන් දුර්වල සේවකයෙකු ලෙස අධීක්‍ෂණ නිලධාරියෙකු විසින් හඳුනාගතහොත් සේවකයාට එයට එකඟ නොවී කරුණු දැක්වීමට ඉඩකඩ ලැබේ.

සේවකයා වැඩිපුර වගකීම් සහිත රැකියාවලට තෝරා ගැනීමේ පහසුව කාර්ය සාධන ඇගයීමෙන් සේවකයාට ලැබෙන තවත් ප්‍රතිඵලයකි. ඔහුට තවදුරටත් පුහුණුව ලබා දීමට අවශ්‍ය වන්නේ නම් ඒ ගැන තක්සේරුවක් කිරීමට මෙමගින් ඉඩකඩ සැලසේ. ආයතනයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි විවිධ සේවකයන්ගේ දායකත්වය කෙසේද යන්න තක්සේරු කිරීමට කාර්ය සාධනය බෙහෙවින් ඉවහල් වේ. ආයතනයේ අනාගත සංවර්ධන සැලසුම් සඳහා අවශ්‍ය සේවක දායකත්වය සපුරා ගැනීම ද මෙමගින් කළ හැක. ආයතනයේ සේවාවන් නිසි පරිදි ඉටුකර ගැනීමට සේවකයන්ට අවශ්‍ය උපදෙස් හා ධෛර්යය ලබා දීමට මෙමගින් කළ හැකි වේ.

කාර්ය සාධන ඇගයීමේ ප්‍රතිඵල මත ඉදිරියේදී සේවකයන්ට ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය අනුව ගෙවීම් කිරීමේදී හා බෝනස් හා දිරි දීමනා ගෙවීමේදී ද උපයෝගී කොට ගත හැක. එසේම අනාගත මිනිස් බල සැලසුම් කිරීමේදී කාර්ය සාධන ඇගයීම ප්‍රයෝජනවත් වේ. අවසාන වශයෙන් දැක්විය හැක්කේ කාර්ය සාධන ඇගයීම සේවකයන් හා පාලකයන් අතර ඉතා හොඳ සාකච්ඡාවක් ඔවුනොවුන්ගේ දෙපාර්ශ්වය අතර යහපත් සන්නිවේදනයක් ඇතිවීම ආයතනයේ ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීමට රුකුලක් වන බව පෙන්වා දිය හැක.

05. සාර්ථක කාර්ය සාධන ඇගයීමක් කෙසේ සිදුවිය යුතු ද?

සාර්ථක කාර්ය සාධන ඇගයීමක් සඳහා ඉදිරිපත් වන දෙපාර්ශ්වය සේවකයා හා ඇගයුම් කරන්නා ඔවුනොවුන්ට පැවරී ඇති කාර්යය කුමක්දැයි පැහැදිලිව වටහා ගෙන තිබිය යුතුය. කාර්ය සාධනයේ අවසන් ප්‍රතිඵලය විය යුත්තේ කාර්යක්‍ෂම සේවක පිරිසක් මගින් ආයතනයේ ඵලදායීතාවය වර්ධනය කර ගැනීමය. ඒ සඳහා දෙපක්‍ෂයම සද්භාවයෙන් කටයුතු කළ යුතුය. සේවකයාගෙන් ඉටුවිය යුතු සේවය නිසි පරිදි ඇගයීමක් ඇගයුම් කරන්නා විසින් සිදුකළ යුතුය. සේවකයා සම්බන්ධව ඇති පෞද්ගලික අමනාපයන් හා පෞද්ගලික මිත්‍රත්වයන් මේ සඳහා මිනුම් දණ්ඩයන් ලෙස භාවිතා කර නොගත යුතුය. ඉන් ඇගයීම විකෘති විය හැකිය. ඇගයුම් කරනු ලබන සේවකයා සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු ඇගයුම් කරන්නා සතුව තිබිය යුතුය. සාර්ථක ඇගයීම් සඳහා එක් ඇගයුම් කරන්නෙකුට වඩා ඇගයුම්කරුවන් කීපදෙනෙකු මගින් සිදුකිරීම වඩා ප්‍රතිඵලදායක වෙයි. ඇගයුම්කරුවන් කීප දෙනෙකු විවිධ කෝණයන් යටතේ ඇගයීම් කරනු ලැබීම මෙහිදී වඩා වැදගත් ප්‍රතිඵලදායක එකක් වෙයි.

ඇත්තෙන්ම කාර්ය සාධන ඇගයීම සිදුකිරීමට වර්ෂයක් අවසානය තෙක් බලා සිටීම යහපත් ක්‍රියාවක් නොවේ. කාර්ය සාධන ඇගයීම් නිති පතා නොකඩවා කළ යුතු කාර්යයකි. එවිට සේවකයාට ඔහුගේ අඩුපාඩු මග හරවා ගැනීමට අවශ්‍ය කාලය ලැබෙනු ඇත. එවිට වර්ෂය අවසාන වනවිට යහපත් කාර්ය සාධනයක් සඳහා සෙවකයා සුදුසු තත්වයට පත්වීම සිදුවේ. කාර්ය සාධන ඇගයීමේදී විවිධ අය විසින් පරස්පර විරෝධී ඇගයීම් සිදු කරන බැවින් එය නිසි ඇගයීමක් කිරීමට බාධාවකි. එහෙයින් පොදු මිනුම් ක්‍රමයක් මගින් ඇගයීම සිදු කිරීම සාර්ථක කාර්ය සාධනයක් සඳහා ඉවහල් වේ.

06. කාර්ය සාධන ඇගයීම සම්බන්ධව මතුවී ඇති විරෝධතා

13 වන පිටුවට...

**ඔබට ඇති සේවක ගැටළු අපට ලියන්න.**
'තීර්ථ' සංස්කාරක, සේවක ගැටළු,
සන්නිවේදන හා මහජන සම්බන්ධතා
කොට්ඨාශය,
කැනල් අංගනය.

**නව විසඳුමක් සොයා ගැනීමෙන් නව ප්‍රබෝධයක් ඇති වේ. - ලී බිග්**

## නරක අතහැර හොඳ රැගෙන නව වසරට පා තබමු.

ශ්‍රේෂ්ඨ මහත්මා ගාන්ධි, අධිරාජ්‍යවාදීන් හමුවේ ඉතා අපූරු කියමනක් ප්‍රකාශ කළේ ය. ඒ '' ඔබලා විසින් භාරතයට ගෙනා හොඳ මෙහි තබා නරක සියල්ල රැගෙන වහාම භාරතයෙන් පිට වන්න'' මෙය ඉතා විප්ලවකාරී කියමනක් වූ අතර, ඒ වනවිටත් ලෝකය පුරා ගොඩනැගුණු නොයෙක් නිදහස් අරගල වලට මෙම කියමන ආයුධයක් වී ය.

මෙම කියමන හා වරාය සම්බන්ධ වන්නේ කෙසේ ද? අපේ සේවකයින් සතුව ද වෘත්තිය සංගම් ව්‍යාපාර සතුව ද පාලනාධිකාරිය සතුව ද නොයෙක් හොඳ හා නරක තිබේ. එකිනෙකා තම තමන්ගේ ස්ථාවර වල පිහිටමින් සිටීම මෙහිලා ඇති හොඳ සංකල්පය ට යාමටත් නරක සංකල්ප එළියට ඒමටත් මූලික වේ.

ලඟ වෙන්නේ නව වසරකි. පසුගිය උදා-වූ සෑම නව වසරකටම වඩා මෙවර උදාවන නව වසර වරාය ට තීරණාත්මක වනු ඇත. එයට ප්‍රබලම හේතුවක් නම් පසුගිය කාලය පුරා දකුණු ආසියාව, අග්නිදිග ආසියාව, බටහිර ආසියාව, ගොඩනැගුණු නව ධනේශ්-වර ආර්ථික ශක්තින් විසින් ඒ ඒ රටවල් වල ක්‍රය ශක්තිය ඉහළ මට්ටමකට රැගෙන විත් තිබී ම ය. ඉරානය, ඉන්දියාව, චීනය, මැලේසියාව, තායිවානය, වැනි කලාපීය රටවල උක්ත වේගවත් සංවර්ධනය ජාතික හා ජාත්‍යාන්තර අවශ්‍යතාවයන්ට තම රටවල දොරටු විවෘත කිරීම ඒ පියවරයි.

එහි සුවිශේෂ ම අංගයක් ලෙස නාවික කේෂ්ත්‍රයේ දියුණුව දැක්විය හැකි ය. මේ අනුව, තම රටවල වරාය සීමාවන් හා පහ-සුකම' පුළුල් කිරීමත් වර්ධනය කිරීමත් දිගින් දිග ට ම සිදුවේ. මේ නිසා සාම්ප්‍රදායික නාවික ක්ෂේත්‍රයේ කේන්ද්‍රස්ථානයක් වූ ශ්‍රී ලංකාවේ වරායයන් ට එල්ල වන අභියෝග සළු පටු නොවේ. මෙම අභියෝග ජයගත හැක්කේ කෙසේ ද ?

මේ අභියෝග ජයගැනීමට ඇති එක් පියවරක් නම් සාමුහිකව අප සියළු දෙනා සතු නරක දුරස් කොට හොඳ ඉදිරියට ගෙන ඒම යි.

මෙතෙක් කල් අප විසින් අපගේ ලැබීම් පමණක් ගණනය කොට ආදායම්, වියදම්, ලාභ, පාඩු මත සිට කටයුතු කළ ප්‍රතිපත්තියෙන් ඔබ්බට ගොස් නව ප්‍රවේශ හා නිර්ණායක වල සිට උදාවන නව වසර බාරගත යුතු ය.

එහි දී පුද්ගලිකව පසුගිය වසරට සාපේක්ෂව උදාවන වසර තුළ ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව ස්වයං විවේචනයක යෙදීමට සෑම සේවකයෙකු ම වග බලාගැනීමට යෝජනා කරමි. අයිතිවාසිකම් හා සමානවම යුතුකම් හා වගකීම් ඉටු කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් ය.

වෘත්තිය සංගම් ක්ෂේත්‍රය ද තම දේශපාලන ව්‍යාපෘති වල සිට සකසා ගත් මිනුම් දඬු වෙනුවට සැබෑ පරිණත වෘත්තිය සංගම් ක්‍රියාකාරිත්වයක් දැක්වීම උක්ත අභි-යෝග ජයගැනීමට ඉවහල් වනු ඇත.

මේ වනවිට පාලනාධිකාරියේ බොහෝ සමාජිකයින් හා සාමාන්‍ය සේවකයා අතර විශාල දුරස්ථභාවයක් නිර්මාණය වී තිබී ම කණගාටුවකි. තමාගේ පහළ සේවකයාගේ මරණයට, මඟුලට නොයන ලොකු නිළධාරීන් ඕනෑ තරම් ඇත. මෙය සේව්‍ය සේවක සුහදතාවයට මරු පහරකි. වක්‍රව එය වරාය ඉදිරි ප්‍රගමනයට බාධාවකි. මේ පිළිබඳව වඩා මානුෂික ස්ථාවරයන් ගොඩනගා ගත යුතු ය.

එවිට උක්ත අභියෝග ජයගැනීමට අපට හැකිවනු ඇත. උදාවන නව වසර වඩාත් හරවත් හා පැහැබර වන්නේ එවිට ය අප සතු නරක අතහැර හොඳ තුළ සිට ක්‍රියා කිරීම අපේ කේන්ද්‍රීය තත්ත්වය රැකගැනීමට ඇති ප්‍රබලම සාධක ය යි.



**සුභ නව වසරක් වේවා**

**ප්‍රසන්න කළුතරගේ**
**ක්‍රියාකාරී අධ්‍යක්ෂ**

# අග්නිදිග ආසියාවේ වරායයන් බැහැදැක

**සටහන - කාව්‍ය ඉන්ද්‍රජිත්**

මෑතක දී වරායේ සෑම අංශයක් ම නියෝජනය වන පරිදි, මැලේසියාවේ හා සිංගප්පූරුවේ වරායයන් නැරඹීම ට කොළඹ වරායේ නියෝජිත පිරිසක් සංචාරයේ යෙදිණි. මේ සටහන පසුගිය කලාපයේ ඒ සම්බන්ධයෙන් පළ වූ ලිපියේ ඉතිරි කොටසයි.

06. පාලන කාර්ය සංවිධානය
කළමණාකාරිත්වය
මානව සම්පත් මෙහෙයුම් ව්‍යාපාර සංවර්ධනය



හා මුදල් ඉංජිනේරු සන්නිවේදනය, යන ප්‍රධාන අංශ ඔස්සේ පරිපාලනය බෙදී ඇත. සභාපතිවරයා ඉහළම විධායකයා විය. මානව සම්පත් පරිපාලනයේදී ප්‍රධාන වශයෙන්, ස්ථිර සේවකයින් උප කොන්ත්‍රාත්කරුවන් මගින් පැමිණෙන සේවකයින් ලෙස කොට්ඨාශ දෙකකි. ස්ථිර සේවකයින් මේ සෑම වරායකම සීමිතය. ඔවුන් ඉහළ කළමණාකාරිත්වයේ සිට පහළම තත්ත්වය දක්වා සිටිති. ඔවුන් වෙනුවෙන් රජයේ අනුමැතිය ලත් නිවාඩු, දීමනා, හිමිකම් සියල්ල ලැබෙන අතරේම ආයතනයේ නීති රීති වලට ගිවිසුම් ගත බැඳීමකින් එක් වී සිටී. එම ගිවිසුම් හා නීති රීති බිඳ දමන සෑමවිටෙකම ඒ සඳහා ස්වයංක්‍රීය දඬුවම් ක්‍රම ක්‍රියාත්මක වෙයි.
එමෙන්ම සේවකයන් තම රාජකාරිය ඉටු කළ යුත්තේ සේවා මුර ක්‍රමයටයි. සේවයට පැමිණෙන සේවකයා මෙන්ම පිටව යන සේවකයා ද නීතිමය වශයෙන් අඛණ්ඩ සේවයක් පවත්වාගෙන යාමට බැඳී සිටී. සේවයට පැමිණෙන්නා පැයකට පෙර රපෝර්තු කිරීමට ද රාජකාරියේ යෙදී සිටින්නා අදාළ රාජකාරි ස්ථානයේදීම එය භාරදීමටද බැඳී සිටියි. උප කොන්ත්‍රාත්කරුවන් මගින් වරාය සේවා සඳහා එක්වන සේවකයින් සෘජුව වරායට වගකිව යුතු නොවුනද අදාල කොන්ත්‍රාත් සමාගම සෑම විටෙක ම එකඟ වූ ගිවිසුම ප්‍රකාරව අදාල සේවකයන් වෙනුවෙන් වගකිව යුතුය.

07. ව්‍යාපාර සංවර්ධන හා සන්නිවේදන මේ සෑම වරායකම ව්‍යාපාර සංවර්ධන අංශයට හා සන්නිවේදන අංශයට වැදගත් ස්ථානයක් හිමිව තිබුණි.
නූතන ව්‍යාපාරික හා තාක්ෂණික ලෝකය සමඟ ගනුදෙනු කිරීම වරාය සංවර්ධනයෙහිලා ප්‍රධානතම ස්ථානයක පැවතීම උක්ත වරාය කළමනාකාරිත්වය විසින් වටහා ගැනීමම වරාය යාන්ත්‍රණයේ ප්‍රධාන අංශයක් ලෙස උක්ත අංශය පත් කර ගැනීම නිදසුනකි. තවදුරටත් වරාය හුදෙක් භාණ්ඩ බාන පටවන ස්ථානයක් ලෙස නොව නොයෙක් වෙළඳ අරමුණු සහිත වෙළඳ හා පාරිභෝගික මධ්‍යස්ථානයකි. ඒ බව මේ සෑම වරායකම ප්‍රමුඛවම දක්නට ලැබුණි. එමෙන්ම, තම වෙළඳ අරමුණු අවශ්‍ය කෙෂ්ත්‍ර වෙත ගෙන යාමට අවැසි යහපත් සන්නිවේදන ක්‍රියාවලියක් නිර්මාණය කර තිබුණි. වාර්තා වැඩසටහන්, පැහැදිලි කිරීම්, වැඩමුළු අන්තර් ජාලා පහසුකම්, ජාත්‍යන්තර ජනමාධ්‍ය සබඳතා ඒ අතර ප්‍රධානය. Garden Port වැනි සංකල්ප යටතේ වරාය භූමිය අලංකාර හා පිරිසිදු රමණීය ස්ථානයක් ලෙස පවත්වා ගැනීම තුළින් පාරිභෝගිකයා තෘප්තියට පත් ස්ථානයක් බවට වරාය භූමිය පත් කර ගැනීම කැපී පෙනුණි.
SMS සේවා/Tele - Client ක්‍රම

08. නව වෙළඳ හා ව්‍යාපාර සබඳතා
මෙම සියළු වරායයන් සිය වෙළඳ හා ව්‍යාපාර අරමුණු පිරිහීමකට නොදී අඛණ්ඩව පවත්වා-ගෙනයාමටත් වර්ධනය කර ගැනීමටත් අවශ්‍ය සැළසුම් සකස් කොට හා ක්‍රියාවට නංවමින් තිබුණි.
මේ යටතේ, සමහර නැංගුරම් පොළවල් නැව් සමාගම් වලට බද්දට ලබාදීම. ග්‍රැන්ට් දොඹකර බද්දට ලබාදීම. වරාය භූමිය පුද්ගලික සමාග-ම් වලට බදුදීම. වරාය විසින් ඉදිකළ ගුදම් හා ගොඩනැගිලි සමාගම් සඳහා බද්දට ලබාදීම. නිදහස් වෙළඳ කලාප වරාය ආසන්නයේ ඉදිකිරීමට පහසුකම් සලසාදීම. ඕනෑම ආකාරයක භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් සඳහා අවශ්‍ය ඕනෑම ක්‍රමයකට ප්‍රවාහනය සලසා දීමට කැපවීම E - Terminal වැනි නූතන තාක්ෂණික පහසුකම් ඇති කර තිබීම. ඉතා වැදගත් අංශ කිහිපයකි. එමෙන්ම බොහෝ වෙළඳ හා නාවික සමාගම් වල මූලස්ථාන හෝ කලාපීය කාර්යාල පිහිටුවීම අවශ්‍ය අවකාශ ලබාදීම ද දක්නට හැකිවිය. එමෙන්ම, E - Terminal පහසුකම් යටතේ ED 1, e - Berthing, e - Submit, e - Do, e - Gate, e - Loading, e - TDR , e - SSR, e - Bithing, e - Procure

ඔවුන්ගේ නව වෙළඳ හා ව්‍යාපාර අරමුණු වේ. එමෙන්ම, නිතර මව් සමාගම් සමඟ



සම්බන්ධව සියළු බහළු හා සාම්ප්‍රදායික නැව් භාණ්ඩ මෙහෙයවීම් සිදු කිරීමට උත්සාහ කිරීම දක්නට ලැබුණි.

09. රාජ්‍ය හා පුද්ගලික අංශයේ දායකත්වය
මේ සෑම අංශයකම ''වරාය'' විෂය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන රාජ්‍ය ආයතනය වන්නේ වරාය අධිකාරියයි. එය මැලේසියාව හා සිංගප්පූරුවේ යන දෙරටේ ම දක්නට ලැබුණි. ඔවුන් මුදල් අමාත්‍යාංශය හා ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ වන අතර වරාය විෂය මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇත.
සියළු වරාය භූමි වරාය අධිකාරිය සතු වුවද ඔවුන් මේ සෑම බිමක්ම පුද්ගලික සමාගම් වලට දීර්ඝ කාලීන හා කෙටි කාලීන ගිවිසුම් ගත බදු ක්‍රම වලට ලබා දී තිබේ. මේ නිසා සෑම වරායකම කළමනාකාරිත්වය සඳහා රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශයෙන්ම දායක වී සිටී.
සභාපතිවරයා මුදල් අමාත්‍යාංශයටත් ප්‍රවාහන අමාත්‍යාංශයටත් වරාය අධිකාරියටත් වගකිව යුතුය. එමෙන්ම, වරාය සේවකයින් කෙරෙහි ක්‍රියාත්මක වන්නේ රටේ පොදු නීතිය හා කම්කරු නීතියයි. නමුත්, ඒ ඒ වරායයන්හි වෙළඳ අරමුණු වෙනුවෙන් රජය විසින් අවශ්‍ය පහසුකම් සලසා දෙයි. උදාහරණයක් ලෙස සමහර වරායයන් හි තෝරාගත් අංශ රේගු බද්දෙන් නිදහස් කොට ඇත. එමෙන්ම, ප්‍රවාහන අමාත්‍යාංශය අධිවේගී මාර්ග පද්ධති මගින් ප්‍රවාහන ජාලය වරායේ කාර්යක්ෂමතාවය වෙනුවෙන් පිහිටුවා තිබේ.

10. බදු සහන/භාරයන්/ආරක්ෂාව/රක්ෂණ
මේ සෑම වරායක් ආසන්නයේම එකක් හෝ කිහිපයක් වූ නිදහස් වෙළඳ කලාප ඇත. එමෙන් ම, රේගු බදු, සේවා බදු, වෙළඳ බදු බොහෝ වරායයන් ක්‍රියාත්මක නොකරන්නේ වරාය සංවර්ධනය වෙනුවෙනි.
භාරයන් ගෙවීමේ අවශ්‍යතාවයක් නොමැත්තේ උක්ත දෙරටේ කලාප සීමාව සාමකාමී වාතාවරණයකින් යුක්ත බැවිනි.
මූලිකවම මේ සෑම වරායක්ම ISPS ක්‍රමය හා අනුගතව සිටී. එමෙන්ම, පුද්ගල හා තාක්ෂණික මෙවලම් භාවිතයෙන් දැඩි ආරක්ෂාවක් සියළු කටයුතු කෙරෙහි යොදවා ඇත. විශේෂයෙන්ම ප්‍රවාහනයේ පහසුව සඳහා ඇති කොට ඇති ''දොරටු ආරක්ෂක පද්ධති'' හෙවත් GCAM ක්‍රමය පරිගණක පද්ධතියක් ආශ්‍රයෙන් ක්‍රියාත්මක වේ. ඒ නිසා ආරක්ෂාව සියයට සියයක් ලෙස ඔවුන් සහතික කරයි. එමෙන්ම RAPADS (Radar Information Processing and Display) ක්‍රමය මුළු වරායයන්ම රේඩාර් පද්ධතියකට හසු කර තිබේ. ලොව පිළිගත් සියළු ආරක්ෂණ ක්‍රම ඒ ඒ අදාළ අංශ වෙනුවෙන් ලබාදී තිබේ.

11. සේව්‍ය සේවක සබඳතාවය/කාර්මික සාමය/සුභ සාධනය
මේ සෑම ආයතනයකම සේව්‍ය සේවක සබඳතාවය ගොඩ නැගී තිබුණේ දැඩි නීති රීති පද්ධතිය පදනම් කර ගනිමිනි. ස්ථිර සේවකයන් මෙන්ම ස්ථිර නොවන කොන්ත්‍රාත් සේවකයින්ද රජයේ කම්කරු නීති ප්‍රකාරව වැඩ කිරීමට හා අයිතිවාසිකම් ලබාගැනීමට බැඳී සිටී. සෑමවිටම ඇත්තේ එක් වෘත්තීය සමිතියකි. එකී සාමාජිකත්වය වරාය සභාපතිවරයාගේ වීමත් සියළු සේවක සේවිකාවන් වෙත සාමාජිකත්වය සලසා දී තිබේ. එමෙන්ම, වැඩ බිමේ ප්‍රශ්ණ ඇතිවීම අවම වන අතර ප්‍රශ්ණයක් ඇති වුවද ඒවා එම ස්ථානයේදීම ක්ෂණිකව විසඳේ. ඒ සඳහා සේව්‍ය පක්ෂය නිතර සූදානමින් සිටී.
සේව්‍ය සේවක දෙපාර්ශවයම නියෝජනය කර හා සේව්‍ය පාර්ශවය අදාළ වර්ෂයට හෝ වර්ෂ දෙකකට අදාල ලෙස ගිවිසුම් ගත වී සිටී. එතැන් සිට ක්‍රියාත්මක වන්නේ ගිවිසුමයි.
වෘත්තිය සමිතිය සේවක අයිතිවාසිකම් වෙනුවෙන් පමණක් හා රජයේ කම්කරු ආඥාවන් ක්‍රියාවට නැංවෙන ආකාරය නිරීක්ෂණයට පමණක් සිටී. වර්ජන හා අකුරට වැඩ කිරීම් නොමැත. කුමන ගැටළුවක් වුවද වරායේ ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල කිරීම නොහැකිය. අවශ්‍ය ප්‍රතිලාභ වර්ෂය මුලදී ඇති කරගන්නා ගිවිසුම අනුව සිදුවේ. නීතිය පොදු හා විශ්වාසනීය බැවින් ලැබෙන සියළු විසඳුම් සාධාරණ බව සේවක පිළිගැනිමයි. එමෙන්ම සිදුවන මාසික, කාර්තු, වාර්ෂික ඇගයීම් සේවක තෘප්තිය හා ඵලදායිතාවය වර්ධනයට රුකුලක් ඇති කරයි.
සුභසාධනය පිළිබඳ සැලකීමේදී මේ සෑම වරායක්ම වර්ෂයකට එක් දිනක් සේවක සුහද හමුවක් පවත්වයි. එදා දරු පවුල් සමඟ වරාය භූමියට හෝ යොදාගත් ස්ථානයකට පැමිණ සතුටු වෙයි. අනෙක් බොහෝ සුභසාධන සේවා සඳහා මූල්‍ය පහසුකම් ලබාගෙන ඒ වෙනුවෙන් සේවය කළ හැකිය. උදාහරණයක් ලෙස කෑම පැය සඳහා අමතර ගෙවීමක් සිදු කරන බැවින් එම කාලයද වැඩ කිරීම සඳහා යෙදවේ. වරායේ අභ්‍යන්තර ගමන් සඳහා බස් සේවා සපයා ඇත. එමෙන්ම හදිසි නිවාඩු ලැබීම් ද ලබාගත හැක.

12. අනාගත සැලසුම්
මේ සෑම වරායකම අනාගත සැලසුම් සකස් වී ඇත්තේ පහත කාරණා ඇසුරිනි.
තාක්ෂණික දියුණුව, නාවික කෙෂ්ත්‍රයේ දියුණුව, නව වෙළඳ ක්‍රමවේද, තරඟකාරිත්වය, විශ්වාසය හා ආරක්ෂාව.
මේ යටතේ ඉහත සෑම වරායක්ම පුළුල් කිරීමටත් එය අරමුණු කරගෙන නව වෙළඳ හා නාවික සබඳතා ඇති කර ගැනීමටත් උත්සුක වෙයි. එමෙන්ම, ආකර්ශනීය බදු සහන හා වෙනත් විශේෂිත පැකේජ හඳුන්වා දෙමින් කාර්යක්ෂමතාවය ද ආරක්ෂාව සැපයීමට ඔවුන් නව ප්‍රවේශයක් සකස් කරමින් සිටී. එමෙන්ම, පරිගණක පද්ධති හා නවීන යන්ත්‍ර සූත්‍ර ද උපාංගද කෙරෙහි ඔවුන් දක්වන නැඹුරුතාවයක් ස්වභාවික පරිසරය නිර්මාණය කිරීමටත්, ඒ තුළින් වරාය වඩාත් ආකර්ෂණීය ස්ථානයක් කිරීමටත් ඔවුන් දක්වන උනන්දුව කැපී පෙණුනි.

ඒයි නිදාගත්ත ඇති නැගිටිනවා'' මා විහිළුවක් කරමින් මිනෝලිගේ උරහිසට තට්ටුවක් දැම්මා.

''නිදාගත්ත නෙවෙයි. කතාව රස විඳිමින් හිටියේ''

''ඒකට කමක් නැහැ. දැන්වත් ඔය ඔරේන්ජ් ජූස් එක බොන්න''

''ඇත්තමයි ආලෝක. මට මතක නැති වුණා. ඒ තරමටම කතාව රසවත්''

''මං ප්‍රශ්නයක් අහන්න ඔයා මට ඇත්ත කියනවද?''

''මොකක්ද?''

''ඔයා ඉන්ග්ලන්ඩ් වල ඉන්දද්දි ඔයාට බෝයි ෆ්‍රේන්ඩ් කෙනෙක් කෙනෙක් හිටියේ නැද්ද?'' මගේ ප්‍රශ්නෙට මිනෝලි තිගැස්සෙනවා මම දැක්කා . ඒත් ඒ බවක් නොදැනෙන්නට එයා සිනාසුණා.

''අයියෝ ඉගෙනගන්න කාලේ ඉන්න ඔක්කොම පිරිමි යාළුවො බෝයි ෆෙන්ඩ්ස්ලා නේ''

''එහෙම නෙවෙයි. විශේෂ කෙනෙක්''

''අනේ නවත්තපු තැන ඉඳන් ආයේ කතාව කියන්නකෝ. නැත්නම් අදත් ඉවර කරන්න බැරි වෙනවා.'' මගේ ප්‍රශ්නය මග හරිමින් මිනෝලි පැවසුවා.

අපි දෙන්න එකට ම යි කැම්පස් ගියේ. පළවෙනි දවසේ අපි දෙන්නටම හොඳ රැග් එකක් ලැබුණා. ඒක නම් මට කවදාවත්ම අමතක වෙන්නේ නැහැ. කැම්පස් ජීවිතයට හුරු වෙන්න අපිට මාසයක් විතර ගතවුණා. එයාටත් මටත් නේවාසිකාගාරවල නැවතීම් පහසුකම් ලැබුණා. එයා සංඝමිත්තා නේවාසිකා ගාරයේත් මා වීරසූරිය නේවාසිකාගාරයේත් හොස්ටල් ජීවිතයට හුරු වුණා. ලෙක්චර්ස් වලට අපි දෙන්නා ගියේ එකටමයි. අම්මලා තාත්තාලා නැති අඩුව දැනුනත් කාලය ගතවෙද්දී කැම්පස් එක අපි හැමෝට ම ගෙදර වගේ වුණා.

තවමත් ශාදි ඇවිත් නැහැ. මං ඇවිත් විනාඩි 20කට වඩා වැඩියි. ඇයි ශාදි තවමත් නැත්තේ? වෙනදා ඇය මටත් කලින් එනවා. දේශනය පටන් ගන්නට ඇත්තේ තවත් විනාඩි කිහිපයයි. සංඝමිත්තා ශාලාවට ඇතුල් වී මා වටපිට බැලුවේ ඇයගේ යෙහෙළිය ඉවෝන්වත් එහි සිටීදැයි සැකයෙන්. කෙල්ලන් කිහිප දෙනෙකු සමග උස් හඬින් හිනැහෙමින් ශාදි මොනවදෝ පවසමින් ඉන්නවා මම දැක්කා. ඒ කියන්නේ ශාදි ඇවිල්ලා ගොඩක් වෙලා. ඇයි මම එනකන් හිටියේ නැත්තේ?''

මම කිසිඳු කතා බහකින් තොරව දේශනයට සහභාගී වීමට ඉඳ ගත්තා. තවමත් ශාදි මා නොදුටු සෙයකි. ඒ තරමටම ඇයට කතාව රසවත් වී ඇත. දේශකයා ශාලාවට ඇතුළුවත්ම ශාදි ඇතුළු පිරිස දුව ගෙනවිත් අසුන් ගත්තා. හිඳගත් ශාදි එක්වරම වටපිට බලන්නට වූණා. ඇයට මා මතක් වන්නට ඇත්තේ දැන්. ඇය මව දැක්කා. බියත්, පසුතැවිල්ලත්, නොසන්සුන් බවත් කැටිවුණු දෙනෙතින් යුතුව ශාදි මා දිහා බලා සිටියා. දේශනයට සවන් දෙන ලෙස අතින් පවසමින් මම දේශකයා දෙසට අවධානය යොමු කරගත්තා. දේශනය අවසන් වනතුරු මම ශාදි දිහා නිකමටවත් බැලුවෙ නැහැ. මගේ සිත කුමක්දෝ නොසන්සුන් කමකින් පෙළෙන්නට වුණා. එය කුමක් අරඹයා දැයි මට නොතේරේ. කිහිප විටක් ශාදි මා දෙස බලනු මා දැස් කොනින් දුටු වද මා එය නොදුටු ලෙසින් සිටියා.

දේශනය අවසන් වූ පසු දේශකයා පිටව ගොස් විනාඩි පහළවක් පමණ ගත වුණා. එහෙත් මම තවමත් සිටි තැනමයි. ශාදි සෙමින් සෙමින් මා වෙත පැමිණ ''ආලෝක'' යැයි කථාකරන තුරුත් මා සිටියේ කල්පනාවක.

''ඇයි''

''මට සමාවෙන්න. මම ඔයාට කලින් ඇවිත් හෝල් එක ලඟට වෙලා ඉන්න කොට කෙල්ලෝ ටික මාව ඇතුලට ඇදගෙන ගියා. ඔයා එයි, යමු ඇතුලට කියලා''

''ඒකට කමක් නැහැ ශාදි. ඒත් ඔයාට නිකමට හරි එලියට ඇවිත් බලන්න තිබුණා මම ඇවිත් ද නැද්ද කියලා.''

''ඉවෝන්ට වෙච්ච සිද්ධියක් කිය කියා හිටියේ. ඒක හරිම රසවත් කතාවක්. ඒ කතාව අහගන්න සිහියක් නැතිවනේ කෙල්ලෝ ටික හිටියේ. ඉතින් මට වෙලාව යනවා තේරුණේ නැහැ. අනේ සොරි ආලෝක''

''හොඳයි රසවත් කතාවක් ලඟදි ආලෝකව අමතක වෙනවා කියලා දැනගත්ත එක''

''ඔන්න ඔයා රණ්ඩුවක් අල්ලලා මාත් එක්ක තරහා වෙන්න හදන්නේ. අනේ ආලෝක මම සොරි කිව්වනේ'' හුරතල් බවක් පාමින් ශාදි මගේ අත අල්ලා ගත්තා ය.

''යමු. මට හොඳටම බඩගිනියි'' මම ශාදිත් එක්කම ධර්මාලෝක ශාලාවෙන් එලියට ආවා.

ශාදිත් එක්ක මම කෙලින්ම ගියේ හිල්ටන් එකට. (හිල්ටන් යනු කැලණි විශ්ව විද්‍යාලයේ කැන්ටිමකි)

''ශාදි ඔයා අපේ සීනියර්ස්ලගෙ පාටි එකට මොනවද අඳින්නේ'' කෑම කන අතරෙ මම ඇහුවා.

''අනේ මන්දා ආලෝක ඔයා දන්නවනෙ, රෑ පාටි එකකට අඳින තරම් හොඳ ඇඳුමක් මා ලඟ නැහැ කියලා''

'' යමු. මම ඔයාට ඇඳුමක් අරන් දෙන්නම්. අද මම ඔයාට ඒ ගැන කියන්නත් හිතාගෙ නයි. ආවේ. කොහෙද ඉතිං....'' යනුවෙන් පවසමින් මා නිහඬ වුණි.

''අනේ ඇයි ආලෝක. ඔයා උදේ සිද්ධියට තවමත් තරහින් නේද? එක වෙලාවකට ඔයාට මාව හරි කරදරයක් නේද ආලෝක?''

''ඔයා දන්නවනේ මම ඔයාට කොයිතරම් ආදරේද කියලා. මාත් ඔයාගෙන් ඒ වගේම ආදරයක් බලාපොරොත්තු වෙනවා. ඒත්.......''

''ඇයි ඔයා ඒත්....... කියල නතර කළේ?''

''නැහැ අද වෙච්ච සිද්ධිය වුණත් මගේ හිතට හරියට දැනුණා ශාදි. මම ඔයාගෙන් ඒ වගේ දේවල් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. මම ආස මම එනකොට මග බලන් ඉන්න, මං ඉස්සරහට දුවගෙන ඇවිත් අතේ එල්ලිලා ආදරෙන් මං දිහා බලන, මගේ ම කියලා මට දැනෙන්න ආදරය කරන කෙනෙක් ට''

''මාත් ඔයාට ගොඩාක් ආදරෙයි ආලෝක. කෙල්ලෝ එකතු වෙලා මට වදේ ගහනකොට මට ලැජ්ජ හිතුණා. අනික ඉවෝන් බලෙන් වගේ මාව ඇතුලට ඇදගෙන ගියේ''

'' අපි ඔය කතාව දැන් නතර කරමු ශාදි. අපි යමු ඔයාට හොඳ ඇඳුමක් ගන්න'' කියමින් මා නැගිටිනවාත් සමග ශාදි නැගිට මගේ අත අල්ලා ගත්තා.

''යමු'' ශාදි මගේ අත අල්ලාගෙනම හිල්ටන් එකෙන් එලියට බැස්සා.

''කොහෙන්ද ආලෝක අපි දැන් ඇඳුම් ගන්නේ?''

''කිරිබත්ගොඩ හොඳ ෂොප්ස් තියෙනවනේ. එහෙන් ගමු'' මං කිරිබත්ගොඩ බලා යන බසයකට ශාදි සමග නැග ගත්තා.

කිරිබත්ගොඩින් බැසගත් අපි දෙදෙනා විලාසිතා මැදුරු කිහිපයකට ගොඩ වූවත් හිත ඇදී යන කිසිඳු ඇඳුමක් හමු වුනේ නැහැ. අවසානයේදි අපි 'අනූෂා මෙමා'' එකට ගොඩ වූණා. එහි තිබුණු සිහින් උරපටි සහිත කළුපාට ලස්සන ඇඳුමකට මගේ සිත ඇදී ගියේ ඒ ඇඳුම දුටු සැනින්. එහෙත් මීට පෙර ශාදි එවැනි ගවුම් ඇඳ නොතිබූ නිසා ඇය එම ඇඳුමට කිසිඳු කැමැත්තක් දැක්වූයේ නැහැ.

''ඔයා මේ ගවුම ඉස්සෙල්ලා ෆිටෝන් කරල බලන්න බබා''

''අනේ ආලෝක මට මේ වගේ ගවුම් ඇඳලා පුරුදු නැහැනේ''




**මෙතෙක් කථාව,**
**වරාය අධිකාරියේ ඉහළ නිළයක් උසුලන ආලෝක වීරසූරිය ට ව්‍යායාම කරන මොහෙතක දී ගාලුමුවදොර පිටියේ දී මිනෝලි සුසෑන් හමුවේ. නිදහස් ඡායාරූපකරණයේ යෙදෙන ආලෝක, මිනෝලිගේ රුවින් සැරසුනු ඡායාරූප ප්‍රදර්ශනයක් පිළිබඳව සිහින මවයි. ඡායාරූප ගැනීම පිළිබඳව කතිකා කර ගැනීමට මිනෝලි හමුවන ආලෝක, ඇය හමුවේ ස්වකීය ජීවිතය ඉස්පිල්ලක් පාපිල්ලක් නෑර අකුරු කරනුයේ අනපේක්ෂිත ලෙසිනි....**

''මේ ඔයාගේ ගම නෙවෙයි. කොළඹ. ඔයා මාත් එක්ක ඉන්න කොට මේ වගේ දේවල් වලට හුරුවෙන්න ඕනෙ. හැබැයි ඔයාගෙ තියෙන චාම් වැදගත් පෙනුම නැති කර ගන්නෙ නැතිව.''

''අනේ මන්දා'' කියමින් ඇය ඇඳුම් ඇඳ බලන කුඩා කාමරයකට ගියා. මා තේරූ ගවුම ඇඳ ශාදි මා ඉදිරියේ පෙනී සිටියා. පුදුම ලස්සනක් මා සිතින් සිතුවා.

''හරි ලස්සනයි ශාදි. අපි මේක ගමු''

''හා'' ශාදි සතුටින් පැවසුවේ ඇයගේ සිතත් දැන් ඒ ඇඳුමට කැමැත්තක් ඇති වූ නිසා විය යුතු යි.

එම ඇඳුමත් සමගම මා ඇයට ඩෙනිම් කලිසම් කිහිපයකුත්, ස්කිනි කිහිපයකුත්, ත්‍රී ක්වාටර් කිහිපයකුත් එකවර අරන් දුන්නා. ශාදි පුදුමයෙන් මෙන් මා දෙස බලා සිටියා.

''ඇයි ඔයා මෙච්චර ඇඳුම් ගත්තේ? මම මීට කලින් කලිසම් ඇඳලත් නැහැනේ''

දැන් ඔයා ඉන්නේ මාත් එක්ක. ඉතින් මම ආස විදිහට ඔයා ඇඳුම් ඇන්දට කමක් නැහැනේ. අනික ට්‍රවුසර් එකත් ගර්ල් කෙනෙකුට තියෙන හොඳම ඇඳුමක්. ආරක්ෂිතයි. ඒ වගේම පහසුයි''

''ඔයා නිකං බොරුවට සල්ලි වියදම් කරන්නේ''

''කවුද ආස නැත්තේ තමන්ගෙ කෙල්ල ලස්සනට ඉන්නවට''

මිලදී ගත් ඇඳුමුත් රැගෙන මා නැවතත් ශාදි ඇරලවීම සඳහා සංඝමිත්තා ගේට්ටුව අසලට ආවා. මා අත තිබූ පාර්සල් කිහිපය ඇයට දුන් මා '' ඔයා ඇතුලට යන්න'' පවසමින් ආපසු හැරෙන්නට හදත් ම, ශාදි මගේ අතින් අල්ලා ගත්තා.

''තැන්ක්ස් ආලෝක. අපි හෙට මීට් වෙමු. දැන්නම් හරි මහන්සියි නේද?''

''ඔව් බබා. මටත් හරි මහන්සියි. හෙට ඔයා ලෙක්චර්ස් එන කොට ඔය ඇඳුම්වලින් එකක් ඇඳගෙන එන්න''

''බලමුකො. බායි ආලෝක. බුදුසරණයි.'' වටපිට බලා ඇඟිලිතුඩු වලින් ඉස්සී නළලට හාදුවක් දුන් ඇය කඩිමුඩියේ නේවාසිකාගාරයට දිව ගියා. ඈ ගිය දෙස තවත් මොහොතක් බලා සිටි මම ආපසු මගේ හොස්ටල් එකට යන විටත් කොල්ලො ටික කාඩ් සෙල්ලමේ.

''ආ.....ඔය එන්නේ මනමාලයා. රවුම් ගහලා'' කවිඳු පැවසුවා.

''ඇයි උඹලට ඊරිසියද?''

''ඊරිසියා නෑ බං දුකයි''

''අනේ පලයං බං යන්න. උඹලට කොකු නැතිවුණා කියලා මං පලිද?''

''අපි ඉතිං උඹ වගේ මෝඩයෙක් නෙවෙයි. උඹ ඕක මෙහෙට එනකොටම එල්ලං ආපු එකනේ. ඉතිං ආපු දවසේ ඉඳන් මේකෙන් යනකං ම ඕකම ඇද ඇද හිටපන්''

''මේ උඹලා වගේ ගමට එකයි, කොළඹට එකයි තියාගෙන ඉන්න ජාතියේ එකෙක් නෙවෙයි මං''

''හරි හරි උඹ ඉතිං බෝධිසත්වයනේ. බලමුකෝ'' කවිඳු පැවසූ විට කොල්ලෝ ටික හයියෙන් හිනා වුණා.

''උඹලා ඕන එකක් කියාගනිල්ලා. මම යනවා වොෂ් එකක් දාගන්න''

හොස්ටල් එකේ පොදු නාන කාමරයට වැදුණු මා හොඳ හැටි නා ගත්තා. නෑමෙන් පසු සැහැල්ලු ඇඳුමක් ඇඟ ලා ගත් මා කිවිඳු ඇතුළු පිරිස වෙතට යාමට සිතුවත් ආයෙමත් උන්ගේ මඩ පාරවල් වලට ගොදුරු වීමට සිදුවන බැවින් එම අදහස අතැර කාමරයේ මාගේ ඇඳේ ටිකක් ඇලවුණා.

**නැවත හමුවෙමු**




# කලා කේන්ද්‍රයේ හෙට දවස

මේ ශ්‍රී ලංකා වරාය අධිකාරිය සේවක මහත්ම මහත්මීන්ගේ කලා හැකියාව නංවාලීමේ අරමුණින් ඇරඹි කලා කේන්ද්‍රයට පසුගියදා නව නිලධාරි මණ්ඩලයක් පත් කෙරුණා. පසුගිය කාලවකවානුවේ භක්ති ගීතයට පමණක් සීමාවූ, එක්තරා පිරිසකගේ පමණක් කලා කේන්ද්‍රයක් ලෙසින් බොහෝ සේවක මහත්ම මහත්මී-න්ගේ අප්‍රසාදයට ලක්වූ කලා කේන්ද්‍රය නව නිලධාරි මණ්ඩලයේ ප්‍රවේශයත් සමග කලාවට ලැදි සේවක සැමටම විවෘත වූ, කලා කුසලතාවයට අතදෙන තෝතැන්නක් වන බවට අපගේ විශ්වාසයයි. තීර්ථ කළ මේ සංවාදය කලා හිතකාමී සමස්ත සේවක මහත්ම මහත්මීන් වෙනුවෙනි. මුලින්ම අප කතාබහ කලේ කලා කේන්ද්‍රයේ වත්මන් නියෝජ්‍ය සභාපති ගාමිණී රණසිංහ මහතා සමගයි.

නව නිලධාරි මණ්ඩලය සමගින් කලා කේන්ද්‍රයේ හෙට දවස ගැන ඔහුගෙන් විමසුවා.

ප්‍රථමයෙන්ම කලා කේන්ද්‍රයට නව සාමාජිකයන් බඳවා ගැනීමට කටයුතු කරනවා. මෙහිදී විශේෂයෙන්ම කිව යුතුයි. ගායනයට, වාදනයට, රංගනයට නර්තනයට වගේම ලේඛන කලාවට නිවේදන, චිත්‍ර හා මූර්ති කලාවට හැකියාවක් ඇති වරාය සේවක මහත්ම මහත්මීන්ට කලා කේන්ද්‍රයේ දොර කවුළු විවෘත කිරීමට අපි කටයුතු කර ගෙන යනවා. ඒ වගේම නව වසරේ අප්‍රේල් මස දී බේරේ වැව කලා දූපතේදී ප්‍රසාංගික කලා අංගයන් රැසකින් යුත් නව මානයක ප්‍රසංගයක් පැවැත්වීමට



නියෝජ්‍ය සභාපති
ගාමිණී රණසිංහ

බලාපොරොත්තු වෙනවා. කලා කේන්ද්‍රයේ ආරම්භයේ පටන් ක්‍රියාත්මක වූ භක්ති ගී වැඩසටහන පුළුල් ලෙසින් සේවකයා අතරට ගෙන යාමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා වරායේ තෝරාගත් ස්ථාන 5 ක බැති ගී ප්‍රසංග ඉදිරිපත් කිරීමට අපි කටයුතු කරනවා. එළඹෙන, අගෝස්තුවේදී වරායේ සංවත්සරය වෙනුවෙන් විශේෂ සංස්කෘතික වැඩසටහනක් ඉදිරිපත් කර වරායේ කලා ශිල්පීන් ඇගයීමට ලක් කිරීමත් කලා කේන්ද්‍රයේ නව යෝජනා අතර ප්‍රමුඛ වෙනවා. දැනට කලා කේන්ද්‍රයේ කලා හැකියාවැති සාමාජිකයන් 82 ක් සිටිනවා. ප්‍රථමයෙන්ම මේ පිරිස ඒකරාශි කරගෙන සුහද හමුවක් පවත්වා ඔවුන්ගේ හැකියාවන් ඔවුන්ගේ නිලධාරින් ඉදිරියේ ප්‍රදර්ශනය කර නිලධාරින්ගේ ද සහාය මේ සඳහා ලබාගැනීමට බලාපොරොත්තු වෙනවා. තවත් අපේ අදහසක් තිබෙනවා වරායේ පාලනාධිකාරිය සමඟ එකතු වී ඔවුන් විසින් ගනු ලබන තීරණ වීදි නාට්‍ය ස්වරූපයෙන් සේවකයන් අතරට ගෙන යාමට. අප සතුව දක්ෂ වාදක මණ්ඩලයක් සිටිනවා. ඔවුන්ගේ ශිල්පීය දැනුම නව තාලයෙන් එක්තැන් කොට සංගීත කණ්ඩායම ඉදිරිපත් කොට සේවක මහත්ම මහත්මීන්ගේ ප්‍රිය සම්භාෂණ සඳහා සංගීතය සැපයීමට ආයතන මට්ටමින් දායක වීමට බලාපොරොත්තු වෙනවා. මගේ හිතේ තව අදහසක් තියෙනවා කලා කේන්ද්‍රයේ ශිල්පීන්ගේ කලා කුසලතාවය දේශ දීපංකර වල සිට මෙරටට සේන්දු වන මාර්ග නෞකාවල පැමිණෙන්නන් උදෙසා විදහා දක්වීමට විශේෂයෙන්ම අපට උරුම වූ සාම්ප්‍රදායික ගායන, නර්ථන, රංගන සංකලනයෙන් ප්‍රසාංගික අත්දැකීමක් රස වින්දනයට අවස්ථාවක් උදාකර දීමට බලාපොරොත්තු වෙනවා. මේ කටයුතු ක්‍රමවත් පිළිවෙලකට ක්‍රියාත්මක කිරීමට කලා කේන්ද්‍රයේ නව නිලධාරීන් ලෙසින් එක්සත්ව කටයුතු කරනවා.

**ඇතැම් පිරිස් චෝදනා කරනවා කලා කේන්ද්‍රය කලාවට වඩා වෙනත් දෑ උලුප්පා කටයුතු කරන බව.**

අපේ රටේ කලාව ගතහොත් එහි තරගකාරීත්වයක් දකගන්න පුලුවන්. එහිදී එකිනෙකා පරයා නැගී සිටීමට වෙර දරන පිරිස් දකගත හැකියි. කලා කේන්ද්‍රයේ ද තමන් තනිවම ඉදිරියට යා යුතුය යන අදහසේ එල්බ සිටි කලාකරුවන් ඉඳලා තිබෙනවා. මම ඒ පිළිබඳව කතා කිරීම ආචාර ධර්මයන්ට පටහැනියි. නමුත්, අද තත්ත්වය ඊට හාත්පසින්ම වෙනස්. නි. සභාපති ලෙසින් මම විසින් කරන්නේ මෙහෙයවීමක් පමණයි. වැඩසටහන් සංවිධානය කිරීම ඒවා මෙහෙයවීම ක්‍රියාත්මක කිරීම ඒ ඒ විෂය භාර නිලධාරී මණ්ඩලයට බෙදා දී කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම සාමාජිකයන් කණ්ඩායම් හතරකට වර්ග කර එනම්, නර්ථන, රංගන, ගායන, වාදන වශයෙන්. ඉන්පසු මේ කණ්ඩායම් මෙහෙයවීමට අදාල නිලධාරීන්ට බාර දී පරිපාලනමය වශයෙන් එක් එක් කණ්ඩායම් සඳහා පුහුණුවීම් සඳහා රාජකාරී නිවාඩු සතියකට වරුවක් ලබා දී පුහුණුවීම් කටයුතු සිදු කරන අතරතුර අපේ ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. පොදු අදහසක් ක්‍රියාත්මක වී සාමූහික ප්‍රයත්නයක් ලෙසින් කලා කේන්ද්‍රය තුළින් නිර්මාණ එළි දක්වීමට බලාපොරොත්තු වෙනවා. ඒ තුළින් ඒකාකාරීත්වය හා පුද්ගලිකතාවයත් යන මේ රැල්ල ඉවත් කිරීමට අපේක්ෂා කරනවා. ඒ අරමුණින් තමයි දෙසැම්බර් මාසයේ සුහද හමුව පැවැත්වූයේ.



ප්‍රධාන ලේකම්
ආර්.ඒ.ඩී. චමින්ද තුෂාර

> **"නර්ථන, රංගන, ගායන, වාදන කණ්ඩායම් මෙහෙයවීමට අදාල නිලධාරීන්ට බාර දී පරිපාලනමය වශයෙන් එක් එක් කණ්ඩායම් සඳහා පුහුණුවීම් සඳහා රාජකාරී නිවාඩු සතියකට වරුවක් ලබා දී පුහුණුවීම් කටයුතු සිදු කරන අතරතුර අපේ ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වෙනවා. පොදු අදහසක් ක්‍රියාත්මක වී සාමූහික ප්‍රයත්නයක් ලෙසින් කලා කේන්ද්‍රය තුළින් නිර්මාණ එළි දැක්වීමට බලාපොරොත්තු වෙනවා."**

**කලා කේන්ද්‍රය පිලිබඳ සහෘද සේවක මහත්ම මහත්මීන් වෙත දැනුවත් කිරීමට කිනම් පියවරක් ද මේ වනවිට ගෙන තිබෙන්නේ**

කලා හැකියාවන් ඇති පුද්ගලයන් බඳවා ගැනීම සම්බන්ධයෙන් පෝස්ටර් මාධ්‍යයෙන් සමස්ත වරාය තුළ ම දැනුවත් කිරීමක් සිදු කළා. දැන් ඕනෑම කෙනෙකුට ශිල්පීය දක්ෂතා ප්‍රගුණ කර ගැනීමට කලා කේන්ද්‍රය විවෘතව තිබෙනවා. කිරීමට හැකි දේ ප්‍රශස්ත ලෙසින්ම සිදු කිරීමටයි අපගේ මේ නව සාමූහික වෑයම.

**මීළඟට අපිත් එක්ක කථා බහට එක්වුණේ කලාකේන්ද්‍රයේ ප්‍රධාන සංවිධායක - ආර්.එම්. ඉන්ද්‍රසිරි මහතා.**

අපි ප්‍රථමයෙන්ම කළ යුත්තේ සමස්ත වරාය අධිකාරිය පුරා විසිරී සිටින කලාකරුවන් ඒකරාශී කර ගැනීමයි. ඉන් අනතුරුවයි සංවිධානාත්මකව නිර්මාණ කටයුතු සඳහා යොමුවිය යුත්තේ. නව නිලධාරී මණ්ඩලයේ එක්සත්භාවය තුළින් අපි නිරතුරුවම උත්සහ කරන්නේ මේ ගමන එක්සත්ව යාමට. කලා හැකියාවන් සපිරි සේවක මහත්මීන් හට සංවිධායක ලෙසින් මම ආරාධනා කරනවා ඔබේ නිර්මාණ හැකියාව භාවිතයට කලා කේන්ද්‍රයට එක්වන්නැයි කියා.

සියළු කලාංගයන්ගෙන් සමන්විත කලා උළෙලක් පැවැත්වීමට යන බැව් ආරංචියි.

ඔව්. හැබැයි ලඟදීම නොවේ. කලා ශිල්පීන් ඒකරාශී කර ගැනීමෙන් අනතුරුවයි. අප මේ කටයුත්තට යොමුවන්න බලාපොරොත්තු වන්නේ. එළඹෙන අගෝස්තුවේ වරාය සංවත්සරයට සමගාමීව වරායෙන් සමුගත් කලාකරුවන් වෙනුවෙන් සම්මාන ප්‍රදානයක් සහ විවිධ ප්‍රසංගයක් පැවැත්වීමට බලාපොරොත්තු වෙනවා.

**අපි මීලඟට කතාබහට එක්කර ගත්තේ කලා කේන්ද්‍රයේ ලේකම් ධූරය හොබවන තුෂාර චමින්ද මහතා.** නියෝජ්‍ය සභාපතිතුමා හා සංවිධායකතුමා පැවසූ කරුණු වලට අමතරව මට මෙම තනතුරේ කටයුතු කරද්දී හැඟී ගිය කරුණක් තමයි ලිපි ලේඛන වල පවතින පසුබෑම.

විශේෂයෙන් රාජකාරි නිවාඩු ආදී කටයුතු වලදී මුහුණපා ඇති ගැටළු සම්බන්ධයෙනි.

කලා කේන්ද්‍රයේ සාමාජික සාමාජිකාවන් කිසිදු අවස්ථාවක අපහසුතාවයට ලක් නොකර අදාල කටයුතු ඉටු කිරීමට අපි සියළු දෙනාම එක්සත්ව කටයුතු කරනවා. කලාවට ලැදි සියළු සේවක මහත්ම මහත්මීන්ගෙන් අපි විවෘත ඉල්ලීමක් කරනවා. ඔබේ කලා හැකියාවට කලා කේන්ද්‍රයෙන් ආලෝකයක් ලබාගන්න යැයි කියා......

භාණ්ඩාගාරික රොෂාන් මුතුකුඩ සමගින් අපි කලා කේන්ද්‍රය ගිණුම් කටයුතු පිළිබඳ කථාබහ කළා.

2006 සැප්තැම්බර් මාසයට පෙර සාමාජික මහත්ම මහත්මීන්ගෙන් සාමාජික මුදලක් අය කළේ නැහැ. නමුත් ඉන්පසුව එක් සාමාජිකයකුගෙන් මසකට රු.20 බැගින් ලබා ගැනීමට අපි තීරණය කළා. අපි ඒ සියළු ගිණුම් කටයුතු වඩා විනිවිදභාවයකින් පවත්වාගෙන යාමට අපි කටයුතු කරනවා.

ඉතින් කලාව සහ වරායේ නිෂ්පාදන ක්‍රියාවලිය යන අංශ දෙක පටලවා නොගනිමින් වරායේ



ප්‍රධාන සංවිධායක
ආර්.එම්. ඉන්ද්‍රසිරි

නිෂ්පාදන ක්‍රියාවලියට උපරිම දායකත්වය සපයමින් නිසි පරිදි කාලය කළමණාකරනය කරමින් ඔබේ කලා හැකියාවටද නව ජීවයක් ලබාදෙන ලෙස සමස්ත සේවක ඔබ සැමටම අපි ඇරයුම් කරනවා.

**සටහන - උපුල් ගුරුගේ**

## ශ්‍රී ලංකා වරාය අධිකාරි කලා කේන්ද්‍රයේ නව නිළ මඩුල්ල

1. නියෝජ්‍ය සභාපති - ගාමිණී රණසිංහ - 2464
2. ප්‍රධාන ලේකම් - ආර්.ඒ.ඩී.තුෂාර චමින්ද - 2403
3. භාණ්ඩාගාරික - රෝෂාන් මුතුකුඩ
4. ප්‍රධාන සංවිධායක - ආර්.එම්.ඉන්ද්‍රසිරි - 2735
5. උප සභාපති - 1. බී.එච්.එල්.ප්‍රේමරත්න 2. එස්.එම්.පී.චන්ද්‍රලතා
6. උප ලේකම් - 1. අශෝක වඩුවාවල 2. එස්.පී.බී.ගොඩවිට
7. උප භාණ්ඩාගාරික - සුනිල් රත්නසිරි
8. සහාය සංවිධායක - සුනිල් වික්‍රමසිංහ
9. ගිණුම් පරීක්ෂක - ඒ.ඩී.වී.එස්.කේ.වනසූරිය

කාරක සභිකයන් -

1. එච්.පී.පී.ප්‍රියන්ත
2. පලිහක්කාර
3. ඩී.එම්.ඩී.ශ්‍රියානි
4. එම්.එන්.පී.කේ.මධුරසිංහ
5. ඩබ්.පී.එම්.ප්‍රියන්ත
6. ඒ.බී.අයි.මල්කාන්ත

## ஹம்பாந்தோட்டை துறைமுக திட்டத்தின் அலைதாங்கியின் மாதிரி ஒன்றை பரீட்சித்தல்



துறைமுக விமான சேவை நீர்ப்பாசன மற்றும் நீர் முகாமைத்துவ கௌரவ அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்கள் 06.12.2007 ஆந் திகதி கட்டுபெத்தையில் அமைந்துள்ள Lanka Hydrolic நிறுவனத்தில் ஹம்பாந்தோட்டை அபிவிருத்தித் திட்டத்தில் உத்தேசிக்கப்பட்ட அலைதாங்கியின் மாதிரி ஒன்றினை பார்வையிட்டார். இங்கு அலைதாங்கி மாதிரியின் அமைப்பை ஒத்த சிறிய அளவிலான அலைதாங்கியின் செயற்பாட்டை பரீட்சித்தார்.

இலங்கை துறைமுக அதிகார சபையின் உபதலைவர் பிரியத். பீ. விக்கிரம, ஹம்பாந்தோட்டை துறைமுக திட்டத்திற்குப் பொறுப்பான தலைமைப் பொறியியலாளர் ஜானக குருகுலசூரிய, தலைமைப் பொறியியலாளர் P.A.A. ஹேவாகீகன, நிறுவனத்தின் முகாமைப் பணிப்பாளர் மலித் மென்டிஸ் ஆகியோர்களும் இந் நிகழ்வில் கலந்துகொண்டனர்.

## கௌரவ அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்களின் கொழும்புத் துறைமுக பாதுகாப்பு தொடர்பான கண்காணிப்புப் பயணம்

துறைமுக விமான சேவை நீர்ப்பாசன மற்றும் நீர் முகாமைத்துவ அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்களின் தலைமையிலான குழுவொன்று கடந்த 15.12.2007 ஆந் திகதியன்று இலங்கை துறைமுக அதிகார சபையின் பாதுகாப்பு தொடர்பாக ஆராயும் பொருட்டு கண்காணிப்பு பயணம் ஒன்றை மேற்கொண்டது.

கொழும்புத் துறைமுகத்தின் பாதுகாப்பு நிலவரம் பற்றி இப்பயணத்தில் முக்கிய கவனம் செலுத்தப்பட்டது. இந்தப் பயணத்தில் இலங்கைத் துறைமுக அதிகார சபையின் தலைவர் சாலிய விக்கிரமசூரிய, உபதலைவர் பிரியத். பீ. விக்கிரம, பிரதான பாதுகாப்பு முகாமையாளர் கொம்டே B.H. புஷ்பகுமார, கடற்படை மேற்கு கொமான்டோ B.J.J. பீரிஸ் ஆகியோர்களும் கலந்துகொண்டனர்

## இலங்கை துறைமுக அதிகார சபையில் புதுவருட வேலை நடவடிக்கைகள் ஆரம்பிக்கப்படல்





இலங்கை துறைமுக அதிகார சபையின் 2008 ஆம் வருடத்திற்கான சேவை நடவடிக்கைகள் ஆரம்பிக்குமுகமாக 2008.01.01 ஆந் திகதி மதவழிபாட்டு நிகழ்வுகள் ஸம்புத்த ஜயந்தி சைத்திய வளாகத்தில் நடைபெற்றது.

மத வழிபாடுகளின் பின்னர் இலங்கைத் துறைமுக அதிகாரசபையின் தலைவர் சாலிய விக்கிரமசூரிய அவர்கள் உரையாற்றுகையில், துறைமுக அதிகாரசபை தேசிய, சர்வதேச மட்டங்களில் ஏற்படும் சவால்களை துணிச்சலுடன் எதிர்கொள்ள வேண்டியதுடன் அதற்கு எஅமது நிறுவனத்தின் சேவை வழங்கும் நடவடிக்கைகள் மேலும் வினைத்திறன் மிக்கதாக அமையவேண்டும்.

இலங்கை துறைமுக அதிகார சபையின் உபதலைவர் பிரியத் பந்து விக்கிரம அவர்கள் உரையாற்றுகையில், சகல ஊழியர்களும் முகாமைத்துவத்தின் மீது நம்பிக்கை வைப்பது நிறுவனத்தின் முன்னேற்றப் பாதைக்கு அவசியமானது எனவும் ஆதலால் ஒருவருக்கொருவர் நம்பிக்கையுடன் கடமை புரியும் காலம் நெருங்கிவிட்டது எனவும் கூறியுள்ளார்.

தொடர்ந்து உரையாற்றிய உப தலைவர் அவர்கள் 2007 ஆம் ஆண்டு கடந்த வருடங்களை விட அதி முக்கியத்துவமிக்க ஆண்டாவதுடன் அக்கால வரையறையினுள் துறைமுக கள நடவடிக்கைகளில் பாரிய அபிவிருத்தி இலக்கை நோக்கி வீறுநடை போடுவதற்கான வாய்ப்பு எமக்கு கிட்டியுள்ளது எனவும் தெரிவித்தார்.

முகாமைப் பணிப்பாளர் W.G. சமரதுங்க, நிறைவேற்றுப் பணிப்பாளர் சஞ்சய செனரத், பணிப்பாளர் பிரசன்ன களுதரகே, மேலதிக முகாமைப் பணிப்பாளர் கெப்டன் நிஹால் கெப்படிபொல உட்பட உயரதிகாரிகளும் இந் நிகழ்வில் கலந்துகொண்டனர்.

## புத்தாண்டே பிறந்திடு

அரசியல்வாதிகளே!
அரை நுற்றாண்டாய்
இனவெறி போரில்
எதைச் சாதித்தீர்கள்.

இழந்த உயிர்கள் எத்தனை?
இழந்த உடமைகள் எத்தனை?
துடித்த மனங்கள் எத்தனை?
தொலைத்த முதல்தான் எவ்வளவு?

பல கட்சிகள்
பல தலைவர்கள்
பல கொள்கைகள்
பாழாய்ப்போன நாட்டில்,

புத்தாண்டிலாவது
புது யுகம் படைப்போம்.
இறந்துபோன சமாதானத்தை
உயிர்கொடுத்து மீட்டெடுப்போம்!

சாதி மதம் பேதமின்றி
சமத்துவத்தைக் கொடுத்திடுவோம்
சாந்தி சமாதானத்துடன்
புத்தாண்டே பிறந்திடு
புதுயுகம் படைக்க
நீ மலர்ந்திடு!!

கே.எம்.எம. ம.்.றூப் - தொடர்பாடல் பிரிவு

# தலைவர் அவர்களிடமிருந்து

2007 ஆம் வருடத்தை மிகவும் ஆடம்பரத்துடன் கழிப்பதற்கு கிடைத்தமை பெரும் பாக்கியமொன்றாகும். அவ்வருடத்தினுள் வெற்றி இலக்குகளை நோக்கிச் செல்வதற்கு பெரிதும் உதவிய காரணிகள் ஊழியர்களினது பங்களிப்பும் அர்ப்பணிப்புமேயாகும். கொள்கலன் செயற்பாடு, சம்பிரதாய கப்பற் சரக்கு கையாளல் என்பவற்றை 2006 ஆம் வருடத்திலிருந்து 10% ஆல் அதிகரித்துக்கொள்ள முடிந்துள்ளது. இலங்கைத் துறைமுக அதிகார சபை முகாமைத்துவம் மற்றும் தொழிற்சங்க பிரதிநிதிகளுடன் நடைபெற்ற சுமுகமான கலந்துரையாடல்கள் மூலம் தொழில்நுட்ப முன்னேற்றம் மற்றும் பிரச்சினைகளைத் தீர்த்துவைத்தல் போன்றவற்றிற்கு எம்மால் மேற்கொள்ளப்பட்ட செயற்பாடுகள் இலங்கையில் உள்ள ஏனைய நிறுவனங்களுக்கும் அமைப்புகளுக்கும் ஒரு முன்னுதாரணமாகும்.

பல வருட காலங்களாகத் தேங்கிக் கிடந்த துறைமுக அபிவீருத்தித் திட்டங்கள் பலவற்றை எமக்கு செயற்படுத்த முடிந்தது. அத்துடன் இதனால் எதிர்வரும் காலங்களில் தேசம் பூராவும் பொருளாதாரம் வளமடையும். எமது தொழிற்சங்க பிரதிநிதிகளையும் கள செயற்பாட்டு உத்தியோகத்தர்களையும் பிரதான துறைமுகங்கள் உள்ள நாடுகளான சீனா, மலேசியா, சிங்கப்பூர் ஆகிய நாடுகளுக்கும் கல்விச் சுற்றலாவொன்றுக்கு அனுப்பியதன் மூலம் சர்வதேச போட்டித் தன்மைகளுக்கு அமைய துரிதமாக மேற்கொள்ளக்கூடிய நவீன செயற்பாடுகள் பற்றிய அறிவைப் பெறுவதற்கான வழிவகையும் எம்மால் செயற்படுத்தப்பட்டுள்ளது. பெருமளவு துறைமுக ஊழியர்களுக்கு பயன்படக்கூடிய Shift duty முறையொன்றும் வெற்றிகரமாகப் பரீட்சிக்கப்பட்டது. இலங்கை துறைமுக அதிகார சபைக்குரிய சொத்துக்களை உறுதிப்படுத்திக் கொள்வதற்கு திட்டங்கள் பலவும் எம்மால் செயற்படுத்தப்பட்டுள்ளன.

2008 ஆம் ஆண்டு வரவு செலவுத் திட்ட ஆலோசனைகள் மூலம் கப்பல் கட்டணங்கள் (Wharfage Charges) குறைக்கப்பட்டதன் மூலம் இலங்கை ஏற்றுமதி இறக்குமதியாளர்களுக்கு பங்களிப்பொன்றை நல்கியுள்ளனர்.

Terminal Management System, Financial Management and Accounting System, Biometric Access Control System போன்ற தகவல் தொழில்நுட்ப முறைகளை செயற்படுத்தும் கட்டம் வரை நாம் பயணித்துள்ளோம். சுருங்கக் கூறின் நாம் சிறந்ததொரு நிலைக்கு வந்துள்ளோம். எவ்வாறாயினும் எம்மால் பூர்த்தி செய்யப்படாத பயணங்கள் பலவாகும்.

எமது பயணம் இன்னும் முடிவடையவில்லை. முக்கியமாக புதிய சம்பள அளவுத் திட்டத்தை அறிமுகப்படுத்துதல், செயற்பாட்டு திறன் அடிப்படையில் நஷ்டஈடு வழங்கும் முறைகள் என்பவற்றின் ஊடாக எதிர்பார்க்கப்பட்ட இலக்கை உயர்த்திக் கொள்வதில் நாம் இன்னும் திறமைகளை வெளிக்காட்டவில்லை. அதேபோல் நேரம், பணம், வளம் ஆகியவை வீணாவதை எம்மால் தவிர்த்துக்கொள்ள முடியவில்லை. போட்டித்தன்மைக்கேற்ப போதுமான செலவுகளை எம்மால் கட்டுப்படுத்த முடியவில்லை.

இலங்கை துறைமுக அதிகார சபையினுள் இன்னும் ஊழல்களும் முகாமைத்துவத்தில் குறைபாடுகளும் காணப்படுகின்றன.

2008 ஆம் வருடத்தில் துணிச்சலுடன் முன்செல்வது எமது இலக்காகும். இதற்கு மேல் உள்ள விடயங்கள் பற்றிய தெளிவான அறிவும் அர்ப்பணிப்பும் எமக்குத் தேவைப்படுகின்றது. எதிர்வரும் காலகட்டத்தில் தனியாக எம்மைப்பற்றிச் சிந்திப்பதை விட நிறுவனத்தின் அபிவிருத்திக்கு முன்நின்று நடவடிக்கைகள் மேற்கொள்ளல் வேண்டும். நிதியியல் துறையில் சுயமாகச் செயற்படவும், ஒன்றிணைக்கப்பட்ட நிதியத்திலும் வெளிநாட்டுச் செலாவணியிலும் பிரதான பங்காளராக நாம் செயற்படவும் வேண்டுமாயின், கட்டாயமாக நாம் போட்டித் தன்மையிலும் வணிகத் துறையிலும் முன்னேற்றமான நிலைக்கு வரவேண்டும். ஒருவகையில் S.A.G.T. பிரிவுடன் கடும் போட்டியிட நேருவதுடன் கொழும்புத் துறைமுகத்தை முழு உலகத்திற்கும் ஐக்கிய துறைமுகமொன்றாக மிளிரச் செய்ய வேண்டும். நாம், இலங்கையில் உண்மையானதொரு கடல் வளம் மிக்க தேசமாக கட்டியெழுப்ப உதவி செய்ய வேண்டும்.

நாம் எதிர்கொள்ள உள்ள சவால்களுக்கு துணிச்சலுடன் முகம்கொடுக்கும் வல்லமை எம் அனைவரிடமும் உண்டு. அதற்குத் தேவைப்படும் உயர்ந்த செயற்பாடுகளையும் அர்ப்பணிப்பையும் நான் சகலரிடமும் இருந்து எதிர்பார்க்கின்றேன். இறுதியில் இவற்றால் கிடைக்கப்பெறும் வெகுமதி கோரிக்கைகளால் கிடைக்கும் வெகுமதியைவிட பெறுமதிமிக்கது.

தலைவர்,
சாலிய விக்கிரமசூரிய
இலங்கை துறைமுக அதிகாரசபை

## துறைமுக சுதந்திர ஊழியர் சங்கத்தினால் கதிர்காமத்தில் நிர்மாணிக்கப்பட்ட சுற்றுலாவிடுதி சங்க அங்கத்தவர்களின் பாவனைக்கு விடப்படல்




இலங்கை துறைமுக அதிகார சபையின் சுதந்திர ஊழியர் சங்கத்தினால் தமது உறுப்பினர்களின் நலன் கருதி நிர்மாணிக்கப்பட்ட இரு மாடி விடுதி ஊழியர்களிடம் கையளிக்கப்படும் நிகழ்வில் துறைமுக விமான சேவைகள் அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்கள் கலந்துகொண்டார்.

அங்கு உரையாற்றிய அமைச்சர் அவர்கள் இது மற்றைய தொழிற்சங்கங்களுக்கும் ஒரு முன்மாதிரி எனவும் ஹம்பாந்தோட்டை, ஒலுவில், காலி, திருகோணமலை, கொழும்பு தெற்கு துறைமுக நடவடிக்கைகள் ஆரம்பிப்பதுடன் முன்வரும் காலங்களில் இதற்கு கூடுதலான ஆளணியொன்றினை தொடர்புபடுத்திக் கொள்ள இருப்பதாகவும் தெரிவித்தார். அத்துடன் படிப்படியாக துறைமுக அபிவிருத்தியினூடாக நாட்டின் பொருளாதாரத்திற்கு பாரிய பங்களிப்பினை நல்க முடியும் எனவும் குறிப்பட்டுள்ளார்.

இந் நிகழ்வில் சுதந்திர ஊழியர் சங்கத் தலைவர் பாரத லக்ஷ்மன் பிரேமச்சந்திர, ஸெமா நிறுவனத்தின் பணிப்பாளர் எஸ். அமரசிங்ஹ, அமைச்சின் மேலதிகச் செயலாளர் ரஞ்ஜித் சில்வா, இலங்கை துறைமுக அதிகார சபையின் செயற்பாட்டுப் பணிப்பாளர் பிரசன்ன களுதரகே, துறைமுக சுதந்திர ஊழியர் சங்கத்தின் பிரதான ஏற்பாட்டாளர் ஹேமந்த களுதரகே உட்பட துறைமுக உயரதிகாரிகளும் ஊழியர்களும் கலந்துகொண்டனர்.

Prepayad by:
M.F.F. Farzana

# නිවැරදි දැක්මකින් කටයුතු කළ සෑම අවස්ථාවක ම




# අපි සහයෝගය දීලා තියෙනවා.....

**චන්ද්‍රසිරි මහගමගේ**
ප්‍රධාන ලේකම්, වරාය පොදු සේවක සංගමය.

**ඔබට වෘත්තිය සමිති ව්‍යාපාරයට සම්බන්ධ වීමට බලපෑවේ කොයි වගේ තත්ත්වයක් ද ?**

මම ශ්‍රී ලංකා වරාය අධිකාරියට බැඳුනේ 80 දශකයේ. ඒ කියන්නේ යූ.එන්.පී. ආණ්ඩුව වෘත්තිය සමිති ව්‍යාපාරය නිර්දය මර්ධනයකට ලක් කරන කාලේ ඒ නිසාම ජවිපෙ. දේශපාලන මතවාදයන් වෙත තල්ලු වෙලායි හිටියේ. මේ සියළු තත්ත්වයන් මත වරාය තුළින් අපි යම් ප්‍රමාණයක අපට හැකි උපරිම අයුරින් 80 දශකයේ අගත් 90 දශකයේ මුල් භාගයේත් කටයුතු කළා. මේ අනුව අපිට පුළුවන් උනා 1996 අප්‍රේල් 25 වැනි දා වරාය පොදු සේවක සමිතිය කියන අපේ වෘත්තිය සමිතිය ආරම්භ කිරීමට. ඒ වෙන කොට වරාය වෘත්තිය සමිති ව්‍යාපාරය විශාල අවස්ථාවාදයකට නතු වෙලා තිබුණා. ඒ වනවිට සී.එම්.යු. එකේ 7500 ක සාමාජිකත්වයක් හිටියා. එවැනි දැවැන්ත වෘත්තිය සමිති ව්‍යාපාරයකට අභියෝගයක් වෙමින් අපි 22 නෙකුගෙන් තමයි අපේ සංගමය පටන් ගත්තේ. මේ නිසා සී.එම්.යූ. එක ට වරායෙන් එළියට යන්න වුණා. අනිත් වෘත්තිය සමිති වලටත් අපව අභියෝගයක් උනා. ඒ රික්තකය තමයි අපි පිරෙව්වේ. මේ වගේ තත්ත්වයකට බලපෑවේ එතෙක් පැවති ආණ්ඩු විසින් ගෙන ගිය මර්දනකාරී ක්‍රියා මාර්ග. ඒ හේතුවෙන් යටවී තිබු සේවක අයිතිවාසිකම් කප්පාදු වෙලා තිබුණා. අපි සංගමයක් ලෙස නොසිටිය අවධියේ පවා වැඩබිම් වල කම්කරුවන් අතරට ගොස් ඔවුන්ගේ අයිතින් වෙනුවෙන් පෙනී හිටියා. අරගල කලයුතු තැන අරගල කලා. එසේ වු හැම තත්ත්වයක දී ම අපි අපේ ශක්තිය පෙන්නුම් කළා. මේ නිසා සේවකයින් අපව හඳුනාගත්තා. ඔවුන් අපිව වෘත්තිය සමිතියක් බිහිවන තැනට තල්ලු කළා. එතැන දී අපව ඔවුන් විසින් මෙහි නියමුවන් ලෙස පත් කළා.

**ඔබගේ නායකත්ව පසුබිම කොයි වගේ ද ?**

පාසල් යන කාලයේ මා තුළින් නායකත්වයක් දිස් උනා ද මම දන්නේ නැහැ. අදටත් මම නායකයෙක් හැටියට හඳුන්වනවට මම කැමති නැහැ. මම වගකීම් දරණ යුතුකම් ඉෂ්ඨ කරන්නෙක් පමණයි. එම තත්ත්වය පවරා තිබෙනතාක් කල් ඔබට මාව නිතර හමුවේවි. නමුත්, මම වරායේ දී තමයි බොහෝ දේ ඉගෙන ගත්තේ. මට මේක සිප් සැලක්. සමාජය පිළිබඳව, සංස්කෘතිය පිළිබඳව, දේශපාලනය පිළිබඳව විශාල පරිචයක් ලැබුවා. ඒ සමග'ම 80 ජුලි වර්ජනය හරහා රටේ ඇතිවුණු පිරිහිච්ච දේශපාලනය, ඒ දුර්දාන්ත පාලනයේ අමිහිරි අත්දැකීම් මාව ජවිපෙ දේශපාලනය වෙත යොමු කළා. යූ.ඇන්.පී. ආණ්ඩුවේ ජවිපෙ මර්දනය අපි පන්නරයක් කර ගත්තා. එය එල දැරුවේ වරායේ දී කියන්න සතුටුයි. යූ.ඇන්.පී. මර්ධනයෙන් පසුව බිහි වු, මුළු ලංකාවේ ම ජවිපෙ සම්බන්ධ පළමු වෘත්තිය සංගමය තමයි, 96 බිහිවුණු වරාය පොදු සේවක සංගමය. වරායෙන් බිහිවු ඒ ශක්තිය ලංකාවේ වෘත්තිය සමිති ව්‍යාපාරයට විශාල ශක්තියක් සැපයුවා. ඒ යටතේ, ජවිපෙ ඉදිරි පෙළ නායකයින් රැසක් බිහි වී තිබෙනවා. ඒ පසුබිමේ තමයි මමත් වගකීම් ඉෂ්ඨ කිරීමේ මුලිකත්වය ගත්තේ.

**වරාය තුළ ඔබගේ සංගමයේ ස්ථාවරත්ව ය කොයි වගේ ද ?**

සේවකයෝ අපි ගැන දැඩි විශ්වාසයකින් ඉන්නේ. වෙනත් වෘත්තිය සංගම් වල සාමාජිකයෝ පවා ඒ තැන ඉන්නවා. ඒ පිළිබඳව එක උදාහරණයක් දෙන්නම්. වරායේ සමුපකාර බැංකුවේ, ණය සකසුරුවම් බැංකුවේ, සුභසාධක සංගමයේ යන ආයතන තුනේ ම නිලවරණ වලින් අපි ජයග්‍රහණය කළා. ඔබට පුදුම හිතෙයි. මේ හැම ආයතනයක ම අපේ සැලකියයුතු සාමාජික පිරිසක් නැහැ. නමුත් අවසානයේ අපි ජයග්‍රහණය කරලා තිබෙනවා. එතැනදි අපේ කණ්ඩායම වශයෙනුයි අපි ඉදිරිපත් උණේ. අපි හැමවිටම පුද්ගලයාට වඩා ප්‍රතිපත්තියට මුල් තැනදිලා කටයුතු කරනවා.

ඒ වගේ ම අපේ සංගමයට වෙනත් වෘත්තිය සංගම් වල සාමාජිකයින් නිතරම පැමිණ ඔවුන්ගේ ගැටළු වලට විසඳුම් ලබාගෙන යනවා. අපි සෑමවිට ම අපේ සාමාජිකයින්ටත් ඔවුන්ටත් සම මට්ටමේ තමයි සලකන්නේ. අපි ඒ තුළින් කුහක දේශපාලන වාසි හෝ සාමාජික්තවය තර කර ගැනීමට උත්සහ කරන්නේ නැහැ. ඒ තුළින් අපි බලාපොරොත්තු වන්නේ වැඩ බිම තුළ සේවකයා ස්වයං සංවර්ධනයකටත් පොදු සංවාදයකටත් ලක් කිරීම ඒ වැඩ පිළිවෙළ අපි ජයග්‍රහණය කරලා අවසන්. එය බහුතර සේවකයෝ අනුමත කරනවා. ඒ වගේම ඉතිරි පිරිසත් නිහඬව සහය පළ කරනවා. මේ තමයි අද අපේ ස්ථාවරත්ව ය.

අනෙක තමයි. ඔබේ මුදල් - ඔබේ දරුවාට යන සංකල්පය යටතේ ඇති කළ ශිෂ්‍යත්ව වැඩ පිළිවෙල. ඒ සඳහා අපි යොදවා තිබෙන්නේ සමුපකාර බැංකුවේ අපේ කණ්ඩායම නියෝජනය කරමින් පත් ව ඇති අධ්‍යක්ෂකවරුන්ගේ දීමනායි. ඒ යටතේ පසුගිය වසරේ පහ වසර ශිෂ්‍යත්වය සමත් වරාය සේවකයින්ගේ දුවා දරුවන් 62 දෙදෙනෙකුට අපි ශිෂ්‍යාධාර ලබා දුන්නා.

**ඔබ වැටුප් කොමිටියෙන් නැගිටලා ගියේ ඇයි ?**

වෘත්තීය සමිති එකතුව විසින් වැටුප් වැඩිවීම සම්බන්ධනේ බල කර සිටියේ රු. 3000/ කින් සේවක වැටුප් වැඩි කරන ලෙසයි. හිටපු අමාත්‍යවරයා එම අරගලය නැවැතවී ම සඳහා එම ඉල්ලීමට එකඟ උනා. එහි දී රු. 1500.00 පළමුව ලබාදුන්නේ රජයේ වැටුප් කොමිටි තිරණය මගින් ඉහත ඉල්ලීම ඉටු කර දෙන බවට වු පොරොන්දුවෙනුයි. එහි දී රජයේ වැටුප් කොමිටිය විසින් නව වැටුප් ව්‍යුහයක් සකසන ලෙස පාලනාධිකාරියට යෝජනා කොට තිබුණා. එය පදනම් කරගෙන පාලනාධිකාරිය විසින් සකස් කළ 2006 - 2007 නව වැටුප් ව්‍යුහය අපි පිළිගන්නේ නැහැ.

හේතුව තමයි. අපි අරගලයේ නිරත වු අවස්ථාවට සාපේක්ෂව අද භාණ්ඩ මිල ඉහළයි. ඒ නිසා ඒ 3000.00 වැඩිවීම අද ගලපන්නන බැහැ. ඒ වගේම එම නිර්දේශ තුල ඉතා විශාල අසමානකමක් තිබෙනවා. පහළම සේවකයාට ඉතා අඩු වැටුප් වැඩිවීමකුත් ඉහළ ම සේවකයාට ඉතා වැඩි වැටුප් වැඩිවීමකුත් සිද්ධ කරලා. වැටුප් වර්ධක වල පරතරය/සේවා කාලය වගේ දේවල් පිළිබඳව සැලකිමක් දක්වලත් නැහැ. ඒ නිසා වැඩබිමේ සේවකයා අද අර්බුද රැසකට මුහුණ දීලා. ඒ වගේම සමහර සේවක අයිතින් කප්පාදු කරලා. අපි විශ්වාස කරනවා අපිත් ගිවිසුම් ගත උනානම් සේවකයින් වෙනුවෙන් හඬ නගන්නට තිබුණු අවස්ථාව ගිලිහෙන බව. ඒ නිසයි අපිට මුකවාඩම් දැම්මේ උගුලට අපි අහු උනේ නැත්තේ.

**වරායේ වත්මන් සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව ඔබගේ අදහස.**

රටේ කේන්ද්‍රීය ආදායම් මාර්ගයක් තමයි වරාය. මේකේ ඉපදෙන්නේ ශුද්ධ ලාභ. නමුත් වරාය පාලනය කරන්නන් හැමදාම ඒ පිළිබඳව අඩු තක්සේරුවක ඉඳලා තමයි කටයුතු කරලා තියෙන්නේ බලන්න, රැජිණ පාලම, ඒ දවස් වල අපට වාර්ෂිකව ඩොලර් මිලියන 10 ක් ලාභ වශයෙන් ආදායමට එකතු කළා. නමුත්, අද ඒක ඩොලර් මිලියන 02 කට බැහැලා.

මේක තමයි පෞද්ගලිකරණයේ අතුරු එල. ඒ යාන්ත්‍රණය අපිව ගිල ගනිමින් සිටිනවා. නමුත්, අපි බුද්ධිමත් උනොත් ඒ උවදුරු වලින් ජයග්‍රහණය කරන්න පුළුවන්. අද සෑම අංශයක ට ම පෞද්ගලික අංශයේ හස්තය යොදවලා අවසන්. සෞඛ්‍ය, ප්‍රවාහන, අධ්‍යාපන වගේ අංශ එහි ගොදුරු වෙලා මේ තත්ත්වය මත ඉඳලා තමයි අපි වරායේ සංවර්ධනය දකින්නේ. ඒ නිසා හම්බන්තොට හැදුවත්, ගාල්ල හැදුවත් දකුණු කොළඹ හැදුවත් කන්කසන්තුරේ හැදුවත් අද අපිට ඉෂ්ඨ කිරීමට වෙලා තියෙන්නේ අධිරාජ්‍යවාදීන්ගේ උවමනාවන්, හම්බන්තොට පිළිබඳ මුල් ම යෝජනාව ගෙනාවේ ලෙනාඩ් වුල්ෆ් 1902 දී නමුත් අදයි ඒක සිදුවෙන්නේ.

අනෙක තමයි අපි අපේ ජාත්‍යන්තර තත්ත්වය හිතන්න ඕන. හම්බන්තොට හැදීමට, දකුණු කොළඹ හැදීමට එරෙහි විශාල ජාත්‍යන්තර බලවේගයක් ක්‍රියාත්මක වෙනවා. මේවා කඩාකප්පල් කරන්න ඔවුන් නොගන්න උත්සහයක් නෑ. මේ නිසා තමයි අපි කියන්නේ ජාත්‍යන්තර කොම්පැණි කාරයන්ගේ උපදෙස් වලින් තොරව මේවා කලයුතුයි කියලා. නමුත්. අද සිදුවන්නේ අධිරාජ්‍යවාදීන්ගේ උවමනා සැපිරිමක් ඒ තුළ සැබෑ සංවර්ධනයක් වෙනවා ද කියන එක අපට සැකයි.

**අපේ මුල්‍ය හැකියාව හා ක්‍රය ශක්තිය හීන නිසා මේ සංවර්ධන සිහින අපේම මුල්‍ය ප්‍රතිපාදන වලින් ජයගත නොහැකියි නේ ද ?**

මගේ පිළිගැනීම තමයි වරායේ මුල්‍ය තත්ත්වය යහපත් මට්ටමක තියෙන බව. සේවකයිනුත් ඒ ආකල්පයේ ඉන්නවා. නමුත්. යහපත් මුල්‍ය කළමණාකරණයක් නැහැ. ඒ නිසා සිදුවන වංචා හා දූෂණ අති විශාලයි. මේ තත්ත්වය පාලනය කරතොත් මේ සංවර්ධනය යෝජනා විතරක් නොවෙයි තවත් වෙනත් ව්‍යාපෘතින් ඇති කළ හැකියි. මේ තමයි සැබෑ තත්ත්වය. නිරන්තර වංචා හා දූෂණ නිසා සේවකයින්ගේ රැකියා තෘප්තිය අඩුවෙලා, ඵලදායිතාව ය අඩුවෙලා, මේ සියල්ල පිටු දැකිමට නම් වංචා දූෂණ නැති කළ යුතුයි. මේ නිසා වරාය තුළ සිදුවන පිරිහීමෙන් වාසි ගන්නේ පුද්ගලික අංශය. යම් අවස්ථාවක ඔවුන් මේක ගිල ගනිවි. මේ වනවිට, අපි ඒ පිළිබඳව අවශ්‍ය අංශ දැනුවත් කරමින් ඉන්නවා. වරාය සේවකයාගේ අනාගතය වෙනුවෙනුයි අපි ඒ දේ කරන්නේ. මේක ජාතික වස්තුවක්. ඒ නිසයි අපි කියන්නේ වරායේ දේවල් කිරීමට වරායට අවශ්‍ය මුල්‍ය ශක්තිය තියෙනවා කියලා.

අපි මේ පිළිබඳව ඉදිරියේ දී සමස්ථ ජනතාව ඒකරාශි කරගනිමින් විශාල දැනුවත් කිරීමේ ව්‍යාපාරයක නිරත වීමට අදහස් කරනවා.

**07. ඔබලාගේ ඉදිරි සැලසුම් ගැන සඳහන් කළොත්....?**

රටේ සමස්ථ වරායන් පිළිබඳව වඩා ඵලදායි වැඩ පිළිවෙලක් රජය විසින් ඇති කලයුතු වෙනවා. එය ජාත්‍යාන්තර වරායයන් වලට අභියෝග කළ හැකි සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය ලෙස පුළුල් දැක්මකින් කලයුතු එකක් විය යුතුයි. එවන් වැඩපිළිවෙලක් තුළ වෘත්තිය සමිතියක් ලෙස අපේ ඉදිරි දැක්ම සමගාමී කරන්නට අපි සුදානම්. නමුත්, ඒ වැඩපිළිවෙල තුළ වංචා, දූෂණ, අක්‍රමිකතා, පෞද්ගලිකරණ වැනි දේවල් සිදුනොවීමටත් සේවකයින්ගේ රැකියා ශක්තිය වඩවන යහපත් කළමණාකරණයක් සහ පරිපාලනයක් ස්ථාපිත වීමත් සිදු වි ය යුතු යි.

> “අපේ සංගමයට වෙනත් වෘත්තිය සංගම් වල සාමාජිකයින් නිතර ම පැමිණ ඔවුන්ගේ ගැටළු වලට විසඳුම් ලබාගෙන යනවා. අපි සෑමවිට ම අපේ සාමාජිකයින්ටත් ඔවුන්ටත් සම මට්ටමේ තමයි සලකන්නේ. අපි ඒ තුළින් කුහක දේශපාලන වාසි හෝ සාමාජික්තවය තර කර ගැනීමට උත්සහ කරන්නේ නැහැ. ඒ තුළින් අපි බලාපොරොත්තු වන්නේ වැඩ බිම තුළ සේවකයා ස්වයං සංවර්ධනයකටත් පොදු සංවාදයකටත් ලක් කිරීම ඒ වැඩ පිළිවෙළ අපි ජයග්‍රහණය කරලා අවසන්. එය බහුතර සේවකයෝ අනුමත කරනවා.”

සාකච්ඡා සටහන - **කාව්‍ය ඉන්ද්‍රජිත්**

## ඵලදායිතා සේවාවක්....

05 පිටුවෙන්

මෙම ලිපිය අවසන් කරන්නට මත්තෙන් කාර්ය සාධන ඇගයීම් සම්බන්ධව සේවකයන් අතර මතු වී ඇති විරෝධතාවයන් සම්බන්ධව ද පරීක්ෂා කිරීමක් සිදුකළ යුතු බව පෙනී ගිය හෙයින් කෙටියෙන් හෝ ඒ සම්බන්ධව විමසා බැලිය යුතු වේ.

1. අයිතිවාසිකම අහිමි වහල් ශ්‍රමිකයන් නිර්මාණය කිරීම.

කාර්ය සාධන ඇගයීමකින් කිසි ලෙසකින් වත් වහල් සේවකයෙක් බිහි නොවේ. සේවකයෙකු සේවයේ යෙදිය යුත්තේ ඔහුට නියමිත රාජකාරි වේලාවන් තුළදී පමණි. ඔහුට නියමිත විවේකය හා නිවාඩු මේ හේතුව මත වෙනස් නොවේ. ඔහු කළ යුත්තේ තමාට නියමිත රාජකාරි වේලාව තුළදී නිසි පරිදි සේවාවන් ඉටු කිරීම පමණි.

2. සේවකයන් අඛණ්ඩව හැම මොහොතකම වැඩ කළ යුතුය. රාජකාරි වේලාව තුළ සේවයේ යෙදීම සේවකයා සතු කාර්යයකි. ඉන් ඔහු හැම මොහොතකම සේවයේ යෙදිය යුතු යැයි අදහස් කරන්නේ නැත.

3. සේවකයා සේවයෙන් පහ කිරීම දක්වා ඇති අවදානම කාර්ය සාධන ඇගයීමෙන් සේවයෙන් පහ කිරීමක් අදහස් නොකෙරේ. සේවකයා සේවය සිදු කරන ආකාරය ගැන විශ්ලේෂණය කිරීමක් සිදු කොට ඔහුගේ අඩුපාඩු මග හරවා ගැනීමට උදවු කිරීම මෙමගින් සිදුකෙරෙන වැදගත් කාර්යයකි. ඔහු යහපත් ලෙස සේවයේ යෙදෙන්නේ නම් වැඩි වාසිදායක තනතුරක් සඳහා උසස්වීමට ඉඩකඩ ලැබීම පමණක් නොව ඔහු දනට නියුක්ත රැකියාවට ඔහුට නොගැලපෙන්නේ නම් වෙනත් රැකියාවකට යොදා ගැනීමට ද අවස්ථාව සැලසේ.

4. රහසිගත වාර්තා මගින් සේවකයා සතු වාර්ෂික වේතනාධිකය නොලැබීම.

වේතනාධිකය යනු සේවකයෙකු විසින් වර්ෂයක් තුළ හොඳින් සේවය කොට උපයාගත යුතු දෙයකි. කාර්ය සාධන ඇගයීමේදී සේවකයා කාර්ය ඉටු කිරීමේ දී ඇති අඩුලුහුඬුකම් පෙන්වා දීම සිදුකරනු ලබයි. ඒවා මග හරවා ගැනීමට සීමිත කාලයක් තුළ කටයුතු කිරීම ඔහුට අයත් කාර්යයක් වේ. ඔහු නැවත යථා තත්වයට පත්ව කටයුතු කිරීමට අවශ්‍ය සහාය කාර්යය සාධනයෙන් ලබා දෙයි.

5. සේවකයාට පාලනය කරගත නොහැකි හේතූන් නිසා කාර්ය සාධනයේදී අසාධාරණයක් සිදුවීම.

එවැනි තත්ත්වයන් මතුවුව හොත් ඒ සම්බන්ධව පාලක පක්ෂය සොයාබලා සේවකයා හට අසාධාරණයක් නොවන පරිදි කටයුතු කරයි. උදාහරණයක් වශයෙන් යන්ත්‍ර සූත්‍ර නිසිපරිදි ක්‍රියාත්මක නොවීම නිසා සේවාවන්ට බාධා ඇතිවීම, ගං වතුර, සුනාමි වැනි ස්වභාවික උපද්‍රව නිසා සේවා ඉටු කිරීමට නොහැකි වීම. සේවකයා විසින් පාලනය කරගත නොහැකි බාධාවන් වලදී එම අපහසුතාවය සේවකයා මත පැටවීමට කටයුතු නොකෙරේ.

6. ඇගයීම් කරන්නා පක්ෂග්‍රාහීව කටයුතු කිරී-මෙන් අසාධාරණයක් සිදුවීම.

ඇගයීම් මණ්ඩලයක් මගින් කාර්ය සාධන ක්‍රියාවලිය කිරීම මෙයට හොඳම විසඳුමකි. එසේම ඇගයීමෙන් පසුව සේවකයා එයට එකඟතාවයක් නොදක්වන්නේ නම් ඒ ගැන අභියාචනා කිරීමට සේවකයාට ඉඩදීම මෙම ගැටලුවට හොඳම විසඳුමකි.

මෙම සියලු විරෝධතාවන්, දෙපාර්ශ්වයට සද්භාවයෙන් යුතුව කාර්ය සාධන ඇගයීම සිදු කරන්නේ නම් අවම කර ගැනීමට ඉවහල් වන බව පෙන්වා දිය හැක. එසේ වීමෙන් වරාය අධිකාරියේ කාර්යක්ෂම සේවකයන් පිරිසක් ඇති වී ඵලදායීතාවයෙන් යුතු සේවාවන් ඉටු කිරීමට හැකි හා ලෝකයේ අනෙකුත් වරායයන් හා කරට කර කටයුතු කිරීමට හැකි වරායන් බිහිවනු දකීම අප කාගේත් කාලීන ප්‍රාර්ථනාව විය යුතුව ඇත.



මෙවර නත්තල් උත්සවය 2007.12.24 දින අති උත්සවශ්‍රීයෙන් පැලියගොඩ බහළු මෙහෙයුම් මධ්‍යස්ථානයහිදී සැමරූ අතර, එහිදී කළමණාකාර ඩබ්.ඒ.ගුණරත්න මයා උත්සව සභාව ඇමතූ අයුරු

## ජනසතු සේවා අභිෂේක ලබා





මෙවර පවත්වනු ලැබූ ජනසතු සේවා ක්‍රීඩා උළෙලේ මළල ක්‍රීඩා ශූරතාවලිය දිනා ගැනීමට වරාය අධිකාරිය මලල ක්‍රීඩා කණ්ඩායම සමත්විය. තරඟාවලියේ දක්ෂතම ක්‍රීඩකයා පිරිමි (ආධුනික) ශූරතාවය පණ්ඩුල රණසිංහ විසින් දිනාගන්නා ලද අතර, දක්ෂතම ක්‍රීඩිකාව (කාන්තා) ශූරතාවය දමයන්ති ජයතිලක විසින් හිමි කරගන්නා ලදි. අවු. 35 ට ඉහළ කාන්තා දක්ෂතම ක්‍රීඩිකාව ලෙසින් පී.ඩී.එස්.කරුණානායක ජයග්‍රහණය හිමිකර ගන්නා ලදි. මෙම ජයග්‍රාහී කණ්ඩායමට සරත්චන්ද්‍රලාල්, වසන්ත කුමාර, වසන්ත විජේසිංහ, ජානක ප්‍රදීප්, ඒ.ජී.එම්.අතාවුද තුෂාරි පෙරේරා, ගීතා ශ්‍යාමලී, සමීර, නිලන්ති කුමාරි, චමිල කුරුපනාදන්, පණ්ඩුල, ගිහාන්, නිලන්ත ප්‍රදීප්, රංගික අබේධීර, තක්ෂිලා ගුණසිංහ, අජන්ත වනසේකර ක්‍රීඩා කෞශල්‍යයෙන් එක්විය.

මෙවර ජයග්‍රහණය උදෙසා ජාතික ක්‍රීඩා සංචිතයේ නෙලාන් සිරිවර්ධනගේ මඟ පෙන්වීම හා කැපවීම විශේෂයෙන් සිහිපත් කළ යුතු අතර, නියෝජ්‍ය ආරක්ෂක කළමණාකරු, සුසිල් රණසිංහ මහතාට ද ප්‍රණාමය හිමිවිය යුතුයි.

## වරායේ මූල්‍ය තත්ත්වය ....

03 පිටුවෙන්

<u>මේ වනවිට F MAS ක්‍රමයට වරාය අධිකාරිය යොමුවෙලා. ඒ පිළිබඳ කථා කළොත්</u>

ඇත්තටම F MAS ක්‍රමය තුළින් අපි බලාපොරොත්තු වෙන්නේ අධිකාරියේ ගිණුම් නව තාක්ෂණය සමගින් ක්‍රමානුකූලව පවත්වා-ගෙන යාමයි.

වරාය අධිකාරිය ස්ථාපිත වූ දවසේ සිට අද දක්වා මුදල් කොට්ඨාශය සම්පූර්ණයෙන්ම පරිගණක ගත කිරීමක් සිදු වෙලා නැහැ. නමුත් යම් යම් කොටස් උදා - වැටුප් වාර්තා ආදිය පරිගණක ගත වී තිබෙනවා. F MAS ක්‍රමය මගින් සියළු දේ පරිගණක ගත කිරීම තුළින් අපිට මේ කටයුතු සියල්ල ඉතාමත් පහසු තත්ත්වයට පත්වෙනවා. ඒ තුළින් නැව් නියෝජිතයන් ඇතුළු ප්‍රේෂණලාභීන් හට ඉතාමත් පහසු වෙනවා. අවශ්‍ය අවස්ථාවකදී දත්ත එකවර ලබාගැනීමේ පහසුකම් මේ නිසා හිමිවෙනවා. ඒ මගින් මුදල් කොට්ඨාශයේ කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට හැකිවන අතර, කළමණාකරණය ඉදිරියට සංවර්ධන වැඩ කටයුතු සඳහා තීරණ ගැනීමට අවශ්‍ය කරන දත්ත එකවරම ලබාගැනීමේ හැකියාවක් අපට මේ ක්‍රමෝපාය තුළින් හිමිවෙනවා.

<u>බහුකාර්ය ණය ලබාදීම සීමාසහිත කරන බවට කථාවක් මේ වනවිට සේවකයන් අතර පැතිරිලා</u>

බහුකාර්ය ණය මුදල ලෙසින් මුලින්ම ලබාදුන්නේ රු. 30,000 ක මුදලක්. ඊටපසු එය රු. 50,000 දක්වා වැඩි කළා. නැවත ලක්ෂය දක්වා වැඩි කළා. දැන් එම ණය මුදල දෙලක්ෂ පනස් දහස දක්වා වැඩි කර තිබෙනවා. මෙම බහුකාර්ය ණය මුදල ලබාගැනීමේ හිමිකම වරාය අධිකාරියේ සෑම සේවක මහත්ම මහත්මියකටම තිබෙනවා. විධායක ශ්‍රේණිවල වුවත් වාහන ණය ලබා නොගන්නා සේවක මහත්ම මහත්මීන් හට මෙම ණය මුදල ලබා ගැනීමේ හැකියාව තියෙනවා. නිදහස් සේවක සංගමයේ විශේෂ ඉල්ලීම මත අපි මේ බහුකාර්ය ණය අළුත් කිරීමට සෑම සේවකයකුටම අවස්ථාව සලසා දී තිබෙනවා. මේ තුළින් කලින් බහුකාර්ය ණය මුදල ලබාගත් අයෙකුට වුවත් හිඟ මුදල් ගෙවා නැවත බහුකාර්ය ණය මුදල් ලබාගැනීමේ පහසුකම තිබෙනවා. මෙම කටයුතු සිදු කිරීමේදී අධිකාරියේ මුදල් ප්‍රමාණයට බලපාන්නේ නැති ලෙසින් මේ කටයුතු සිදුවීම ඉතා වැදගත්. අපේ මුළු සේවක සංඛ්‍යාවටම එකවර මෙම මුදල් ඉල්ලීම් කළොත් එකවර සංචිතයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කිරීමට සිදුවෙනවා. මේ නිසා අපි තීරණය කළා බහුකාර්ය ණය 500 ක් පමණක් එක් මසකට ලබාදීමට. ඒ සඳහා අපි රු. මිලියන 125 ක් වැය කරනවා. ඒකමයි ප්‍රධානම හේතුව වුණේ, බහුකාර්ය ණය ගෙවීම සීමා කිරීමට. මෙම තීරණය ගත්තේ ණය මුදල් ගෙවීම අපේ මුදල් ප්‍රමාණයට අහිතකර ලෙස බලපෑම නවත්වන්න.

<u>ඇතැම් අවස්ථාවල මූල්‍ය නීති - රීති නිසි ලෙස ක්‍රියාත්මක වන්නේ නැති බවට චෝදනා පවතිනවා</u>

නැහැ, රාජ්‍ය ආයතනයක් හැටියට ශ්‍රී ලංකා වරාය අධිකාරිය මූල්‍ය නීති රීති නිසි අයුරින් ක්‍රියාත්මක කරනවා. මූල්‍ය පරිපාටි සංග්‍රහයක් වරායෙන් නිකුත් කර තිබෙනවා. ඒ අනුව තමයි අපි ක්‍රියා කරන්නේ. ඒ නිසා ඔය කියන චෝ-දනාව සම්පූර්ණයෙන්ම බැහැර කරනවා.

<u>මූල්‍ය ක්ෂේත්‍රයේ උසස් නිලධාරියෙක් /නිලධාරිණියක් වීමට කුමන පරාසයක සුදුසුකම් ද තිබිය යුත්තේ</u>

මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වෘත්තීමය සුදුසුකම් ලබාදෙන ආයතන ලෙසින් සැලකිය හැකි වරලත් ගණකාධිකාරි ආයතනය, වරළත් කළමණාකාරිත්ව ගණකාධිකාරිවරුන්ගේ ආයතනය වැනි වගකිව යුතු ආයතනයකින් විභාග සමත්වීම මේ ක්ෂේත්‍රයට ඉතාමත් වැදගත්. න්‍යායාත්මක දැනුම ලබාගැනීමෙන් පසු එකී ආයතන විසින් ලබාදෙන ප්‍රායෝගික පුහුණුව ඉතාම වැදගත්.

<u>ඔබගේ වරාය ජීවිතය දෙස ආපසු හැරී බැලීමක් කළොත්</u>

ඇත්තටම මම දැන් මේ ගත කරන්නේ රාජ්‍ය ආයතනයක ගත කරන විසිහත්වැනි අවුරුද්ද. ඒ කාලයෙන් වසර 2 ක කාලයක් මම වරාය අධිකාරියේ සම්පූර්ණ කර තිබෙනවා. මම හිතනවා මේ කාල පරිච්ඡේදය මගේ වෘත්තීය ජීවිතයට ලැබූ ලොකු අත්දැකීමක් කියා. ජාතියේ හදවත බඳු ආයතනයක මූල්‍ය කටයුතු පාලනය කිරීමට ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා.

<u>මුදල් කොට්ඨාශයේ අධ්‍යක්ෂ ලෙසින් වරාය හෙට දවස කෙසේද ඔබ දකින්නේ</u>

මං බලාපොරොත්තු වෙනවා වර්තමානයේ සිදු කරමින් පවතින සංවර්ධන ව්‍යාපෘති රැස අනුව ඉතා දීප්තිමත් හෙට දවසක් සමස්ත වරාය අධිකාරියට පමණක් නොවෙයි, සමස්ත ජාතියටම සතුටු විය හැකි හෙට දවසක් උදාවෙයි කියලා.

## නව වසර තුළ ....

01 පිටුවෙන්

ගාල්ල වරාය සංචාරක කර්මාන්තයට රුකුල් දෙන අයුරින් වැඩි දියුණු කිරීමට හා ප්‍රදේශීය අවශ්‍යතාවයන්ට සරිලන ලෙසින් පවත්නා සැලසුම් වලට යටත්ව මේ වසරේ ඉදිකිරීම් කටයුතු ඇරඹීමට අපේක්ෂිත ය. 1994 වසරේ සිට කතා බහට පමණක් සීමා වෙමින් පැවති ඔලුවිල් වරායේ ඉදිකිරීම් මේ මස ඇරඹීමට කටයුතු යොදා ඇත. තව ද ත්‍රි'මලේ වරාය ආශ්‍රිතව ආයෝජන මණ්ඩලය හා ඒකාබද්ධව පරිසර හිතකාමී සංවර්ධන කලාපයක් ඇති කිරීමට සංචාරක මන්ඩලය හා ඒකාබද්ධව මෙම කලාපය තුළ සංචාරක ප්‍රවර්ධන කටයුතු ඇති කිරීමටත් අවශය සියළු කටයුතු යුහුසුළුව සම්පාදනය කර තිබේ. මේ ලෙසින් කුඩම්මාගේ සැලකිල්ලට ලක් වූ ත්‍රි'මලේ වරාය සක්‍රිය වරායක් බවට පත්කිරීමට අවශ්‍ය පසුබිම සකස් වෙමින් පවතී.

ඊට අමතරව කන්කසන්තුරේ සහ පේදුරුතුඩුව වරායයන් හා නව වරායයක් ලෙසින් හඳුනාගත් මයිලඩි හා කරෙයිනගර් නවීකරණය කිරීමට ද ඒ තුළින් එකී ප්‍රදේශයන්ගේ අත්‍යවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය ඇතුළු සුභ සාධක කටයුතු වැඩිදියුණු කිරීමට ද කටයුතු කෙරේ. තව ද ඉදිකිරීම සිහිනයක් ව පැවැති හම්බන්තොට වරාය ඉදිකිරීම් ඇරඹීමට 2007 වසර තුළ දී වරාය අධිකාරියට හැකිවූ අතර මාස 39කින් අවසන් කිරීමට සැලසුම් කළ හම්බන්තොට වරාය පළමු අදියර මාස 33කින් නිමා කිරීමට අවශ්‍ය කඩිනම් වැඩපිළිවෙළක් මේ සඳහා සකස් කර තිබේ. මේ තුළින් සමස්ථ වරාය අධිකාරිය ට මතු නොව සමස්ථ ආර්ථියට ම වාසි රැසක් සැලසෙන බව අපගේ විශ්වාසයයි.

## දැව නිමවුම් හලේ....

16 පිටුවෙන්

මම කළමණාකාරිත්වයෙන් ඉල්ලා සිටිනවා නිෂ්පාදනයට දායක වූ සේවක මහත්වරුන් හට දිරි දීමනාවක් ලබාදීම වැනි ක්‍රියා මාර්ගයකින් සේවකයන් දිරිගැන්වීමට ක්‍රියා පටිපාටියක් අනුගමනය කරන්නේ නම් වඩු කර්මාන්ත ශාලාවෙන් ප්‍රශස්ත ඵලදායිතාවයක් කරා ලඟාවන්නට පිළිවන්. මේ වසරේ ඵලදායිතා සම්මාන සඳහා තරඟ වැදීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ දිනවල ඒ සඳහා සේවකයන් දැනුවත් කරමින් අපේ ඉලක්ක කරා අපි සහයෝගීව ගමන් කරනවා.

මෙතෙක් කළ සැඟව සිටිමින් වරාය අධිකාරියට සේවය දුන් ඔවුන් ජාතික තලයේ ඵලදායිතා ඇගයුමට ලක්ව කීර්තිමත් වේවායි තීර්ථ සුභාසිංශන එක්කරයි.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය....

01 පිටුවෙන්


නව ප්‍රතිපත්තිය චෙන්නායි හා තුත්තුකුඩි වරායයන්ගේ සිට ජය බහලු පර්යන්තය හා සමගි පර්යන්තය වෙත පැමිණෙන හා මෙහි සිට එම වරායයන් වෙත යාත්‍රා කෙරෙන ප්‍රධාන නෞකා සේවා හා පෝෂක නෞකා අරභයා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු පෝෂක නෞකා නැංගුරම්පොළ වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති, බහු කාර්ය නැංගුරම් පොල දක්වා සංවර්ධනය වීමෙන් අනතුරුව නව ප්‍රතිපත්තිය යටතේ නියමිත කාල පරාසයන් ඉල්ලා සිටින, කොළඹ වරාය වෙත පැමිණෙන සියලු නෞකා ආවරණය වන පරිදි මෙම ප්‍රතිපත්තිය තව දුරටත් ව්‍යාප්ත කෙරෙණු ඇත.

මුදල් අවංක සේවකයෙකි. එහෙත් අහිතවත් ස්වාමියෙකි. - බේකන්



**මුව රංචුව**
අෂාන් චානුක ජයතුංග
3 ශ්‍රේණිය
කළුගෙඩිහේන අශෝක ප්‍රා. විදුහල



**අපේ ලොරිය**
ඔසද විල්හාන් සමරතුංග
අඹසෙවන පෙර පාසල
පිළියන්දල



**අපේ ගෙදර**
ධිනූෂ රවී මාවිටගමගේ
1 ශ්‍රේණිය
මහානාම විදුහල -කොළඹ



**ගං ඉවුර**
නෙලෝමි උදේෂිකා
1 ශ්‍රේණිය
හේමමාලි මහ විදුහල -ගණේමුල්ල.




**වනයක වතුර බොන කුරුල්ලෝ**
ඉමායා චිරන්ති හේරත් ගෙදර
4 වසර
සුමන බාලිකා විදුහල - රත්නපුර



**මම කැමති පළතුරු**
කේ. අනුද ඉන්දිප
2 ශ්‍රේණිය
බ/ප/මිනු පල්ලෙවෙල මහ විදුහල



**මාළු ටැංකිය**
රන්දිකා පුන්සදලි සමරතුංග
2 ශ්‍රේණිය
පිළියන්දල කනිටු විදුහල



**ලස්සන උදෑසනක්**
මින්හාජ් හුසේන්
5 ශ්‍රේණිය
අල් මදීනා විදුහල - කල්මුනේ



**අපේ ගෙදර**
අනුරුද්ධි ද සිල්වා
මාලමුල්ල, පානදුර



**මුහුදු වෙරළ**
සසංක හසරංග
1 ශ්‍රේණිය
හෝ/බප/ජය ජනාධිපති විදුහල





# ඔටුනු පලන් කැංගරු පැංචා

ලිව්වේ දේවිකා නැන්දා

ඒදත් සුන්දර උදෑසනක්. ගස්වල මල් පිපිලා වෙනදටත් වැඩිය. සමනළයෙක් එයාගෙ ලස්සන පිහාටු සොලව සොලවා මලක පැණි බොනවා. පැණි කුරුල්ලෙක් ඒ දිහා ඉරිසියාවෙන් වගේ බලන් ඉන්නවා.

ඒ අතරේ තවත් විශේෂ සිද්ධියක් වුණා. ඒ තමයි කැලේ ඉන්න කැංගරු අම්ම කෙනෙකුට කැංගරු පැංචෙක් ඉපදීම. පැංචා චූටියි. ඒත් හරිම හැඩයි. මේ හුරුබුහුටි පැංචව දැකපු කැංගරු අම්මට හරිම සතුටුයි.

'හැමෝම ඉක්මනට එන්නකෝ අපේ අලුත් පැංචා බලන්න.'

කැංගරු අම්මා අසල්වැසියන්ට කෑගහලා කීවා. අහල පහළ හැමෝම පුංචි පුංචි තෑගිත් අරගෙන කැංගරු පැංචා බලන්න ආවා.

'ෂා... හරිම පූරු පැටියා... අනේ මෙයාව මට දෙන්නකෝ හදාගන්න..'

'ෂොක් මල්ලි.... ලොකු වුනාම අපිට සෙල්ලම් කරන්න පුළුවන්..'

'ආනේ.. මේ බබාගේ කකුල් රෝස පාටයි... අත් දෙක හරිම සිනිදුයි..'

කැංගරු පැංච ව බලන්න ආව අය කියන්න පටන් ගත්තා. මේ කැංගරු පැංචා දැන් ටිකක් ලොකුයි. හැබැයි තාමත් ගමනක් යන්නේ අම්මගේ පැසට බැහැලා. අම්මා වේගෙන් දුවනකොට පැංචා පැස ඇතුලට හිස ඔබාගත්තත් සමහර වෙලාවට අම්මා ගල් උඩින්, දියකඩිති උඩින් පැන පැන යනකොට ටිකක් ඔළුව එළියට දාලත් බලනවා.

ඉතින් හැමදාමත් අම්මාගේ පැස ඇතුලේ මෙයාට ඉන්න බෑනේ. දවසක් කැංගරු අම්මා කියනවා, දැන්නම් පුතේ ඔයා ලොකුයි. තවත් අම්මගේ පැසට වෙලා හිටියොත් ඔයාට ඇවිද්නන බැරිවෙයි. අනික අනෙක් පැංචලා ඔයාට හිනාවෙයි කියලා.

අනේ අම්මේ... තව ටික දවසක්.

බෑ... බෑ... ඔයා අද ඉදන් ඇවිදින්න ඕන...

කොහොම හරි කැංගරු අම්මගේ බල කිරීමට පැංචා ඇවිද්දා කියමුකෝ... ඒත් මේ ඇවිදිල්ල නම් හරිම වෙනස්. පැංචා ඇවිදිනකොට ටකස්.. ටකස්.. ගාලා මහ හයියෙන් සද්දෙ ආවා.

පුතා... සද්ද නැතුව ඇවිද්න්නකෝ..

කැංගරු අම්මා දවසට දහගමනක් විතර පැංචට කීවා. කැංගැ පැංචා ඇවිදිනකොට සද්ද වුණේ හරියට අලියෙක් එයාගේ යෝද කකුලකින් පාගලා ලොකු දරලීයක් කඩනවා වගෙයි.

පැංචා ඉස්කොලේ යන වයසටත් ආවා. ඒත් ටික දවසයි ඉස්කෝලේ යන්න වුණේ. කැංග-රු පැංචගේ අඩි සද්දෙට මුණු මුණු ගාපු කැලෑ ගමේ ඉස්කොලෙ ළමයි ටිකක් කල් යනකොට පැංචට උසුළු විසුළු කරන්නත් බනින්න ගහන්නත් පටන් ගත්තා.

නඩු අහලා බැරිම තැන පැංචාගේ අම්මා පැංචගේ ඉස්කොලේ ගමන නතර කරලා ගෙදර තියාගෙන උගන්නන්න පටන් ගත්තා.

මං මේකට මොකද කරන්නේ.... නිතරම කැංගරු අම්මා කල්පනා කළා.

පැංච ඇවිදින කොට සද්දෙ එනනිසා කකුල් දෙක සද්දෙ එන්නැති විදිහට හදලා දෙන්න පුළුවන් වෙද මහත්තයෙක් ළගට අම්මා පැංචව එක්කගෙන ගියා.

මේ වෙද මහත්තයව කැලේ කවුරුත් හැදින්වුනේ 'ජිරාෆ් මහ වෙදා' කියලා. ඉතින්... පැංචව පරීක්‍ෂා කරපු මහ වෙදා කීවේ ලෙඩේ හොද කරන්න දුරං පරක්කු වැඩියි කියලා.

මේක පොඩි සද්දයක්නේ... මම ගෙන්නම් ඔයාලට හොද යෝජනාවක්... ඒ තමයි එහා කැලෑ ගමේ තියෙනවා වැඩ උගන්වන පොඩි පාසලක්. මේ ළමයාව එහාට බාර දෙන්න.

කැංගරු අම්මා කැංගරු පැංචාව පහුවදාම අර මහ වෙදා කීව පාසලට එක්ක ගියා.

පාසලක් කීවට එතන පාසලක් මත් නෙමේ. විවිධ වයසේ විවිධ සත්තු වර්ග එතන හිටියා. එතන පොත පත වැඩ වගේම වෙනත් දේවලුත් ඉගැන්නුවා. නොයෙක් විදිහේ ආබාධ තියෙන අය වගේම හොද නිරෝගී අයත් හිටියා. මේ පාසලට ආපු සමහර අය මුලදී හරිම දගයිලු, අකීකරුයිලු, රංඩුකරනවලු, කම්මැලිලු හැබැයි දැන්නම් හැමෝම හොදයි.

මේ පාසල අයිති වදුරෙකුට. ළමයි එයාට කතා කළේ වදුරු මහත්තයා කියලා. මෙයා තමයි පාසල පාලනය කරපු කෙනා. එහෙමත් නැත්නම් ඒ පාසලේ නායක වදුරා කීවත් හරි.

කැංගරු පැංචා දවසක් පංතියේ පුටුවක වාඩි වෙලා බර කල්පනාවක...

පැංචා දන්නෙම නෑ වදුරු නායකයා එතනට එනකම්ම. ආ.. මොකද කල්පනවා. නායකයා ඇහුවා...

මම කල්පනා කළේ වදුරු මහත්තයා කොහොමද වෙච්චර හොදට මේ පාසලේ වැඩ කරන්නේ කියලා... මෙතන ඉන්න කවුරුත් ඔබට කීකරුයි. ඒ වගේම කවුරුත් ඉන්නේ සතුටින්.

දරුවෝ... ඔබ දන්නවනේ මමයි මෙතන පාලකයා, නායකයා. ඉතින් හොද නායකයෙකුට පුළුවන් තමන් නායකත්වය දෙන කණ්ඩායම හොදින් පාලනය කරන්න. හොඳ මගට ගන්න. ඒ වගේම ඒ අයගේ යහපත් බලාපොරොත්තු ඉටු කරන්න.

වදුරු මහත්තයෝ.. මටත් ආසයි කවදා හරි නායකයෙක් වෙන්න.

ආ... ඒක හොද අදහසක්.

හැබැයි නායකයෙක් වෙන්න නම් ලේසියි. ඒත් හොද නායකයෙක් වෙන්න අමාරුයි. හොද නායකයෙක් වෙන්න හොද නායකත්ව පුරුදු ගොඩනගා ගන්න ඕන.

වදුරු මහත්තයා කැංගරු පැංචගේ හිස අතගාන ගමන් කීවා.

එදා රෑ නින්දට ගිය කැංගරු පැංචා ලස්සන හීනයක් දැක්ක. එයා කැංගරු රංචුවටම නායකයා වෙලා රත්තරං පාට ඔටුන්නක් දාගෙන සිංහාසනේ වාඩි වෙලා ඉන්නවා.

## හඳ මාමා

හඳ මාමා හෙමින් හෙමින්
නැග නැග එනවා
අපෙ ලෝකේ අඳුර මකන
හඳ නැග එනවා

හඳ මාමේ ඔබෙ තනියට
තරුත් සිටිනවා

කුමුදු පිපෙනවා
ඔබ හිනැහෙනවා

සචිනි පූර්ණිමා, 3 - ඒ
මහමායා බාලිකා මහ විදුහල

# ජාතියේ හදවත ට සවිය ගෙනෙන ප්‍රවාහන අංශය

ජාතියේ හදවත ලෙස අන්වර්ථ විරුදාවලිය පටබැඳුණු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉංජිනේරු කොට්ඨාශයේ ප්‍රවාහන අංශයෙයන් සිදුවන සේවාවන් පිළිබඳ කරුණු අනාවරණය කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබාදීම පිළිබඳව තීර්ථ වෙත හෘදයාංගම ස්තූතිය පුද කරමි.

102 ක් වන සේවක පිරිසකගෙන් සැදුම්ලත් ප්‍රවාහන අංශයේ මේ වනවිට විශේෂ කාර්ය භාර්යයන් රැසක්ම ඉටුවේ. මේ අතරින් ප්‍රධානත්වයේලා සැලකිය හැකි සේවාවන් වන්නේ,

1. සමස්ථ වරාය අධිකාරියේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි ආහාර හා තේ බෙදා දීමේ කටයුතු.
2. සුහසාධන කොට්ඨාශය හා ප්‍රවාහන අංශය ඒකාබද්ධව පවත්වාගෙන යන සුහසාධන ප්‍රවාහන සේවය.
3. ජයබහලු පර්යන්තයේ සේවකයින් හට ප්‍රවාහන පහසුකම් සැලසීම.
4. ආපදා රථයේ සේවය.
5. සමස්ථ වරාය අධිකාරියේ ආරක්‍ෂාව සඳහා නාවික හමුදාවෙන් සිදුකරණු ලබන සේවයේදී ඊට ප්‍රවාහන අංශයෙන් ලබාදෙන දායකත්වය.
6. සේවක වැටුප් ගෙවීම හා මධ්‍ය මාසික අත්තිකාරම් ගෙවීම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම.

> **සුහසාධන කොට්ඨාශය හා ප්‍රවාහන අංශය අනුබද්ධව සිදුකරන සංචාරක ප්‍රවාහන සේවාව මෙම සේවය සඳහා සුඛෝපභෝගී බස්රථ තුනක් යොදා ඇත. අධිකාරියේ සෑම සේවකයෙකු-ගේම මංගල, අවමංගල, අධ්‍යාපන, විනෝද, වන්දනා කටයුතු සඳහා යොදවනු ලබන මෙම බස්රථ ධාවන ආරම්භ වන්නේ ප්‍රවාහන අංශයේ සිටය. මෙහිදී විනය ගරුක රියදුරන් සුහසාධන බස්රථ වලට යෙදවීම මාර්ග නීති පිළිබඳ මනා දැනුම, සිද්ධස්ථාන, පෞරාණික ස්ථාන, අභය භූමි, කෞතුකාගාර, පුරාණ නටඹුන් වැනි දේ පිළිබඳව ඔවුන් සතු දැනුම චාරිකා වල නිරත වන සේවක පිරිස උකහාගන්නේ ඉතාම අල්ප වශයෙනි.**

1. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි ආහාර හා තේ බෙදීම සිදුකරනු ලබන්නේ ප්‍රවාහන අංශයේ ලොරි රථ නමයක් යොදාගෙනය. මෙම සේවාව සඳහා විසිහතර පැයේ වැඩමුර ක්‍රමය යටතේ එක් වැඩ මුරයක් සඳහා රියදුරු මහතුන් හා රිය සහයක මහතුන් දහඅටදෙනෙකු සේවයේ යොදවයි. සෑම දිනයකම මෙම ලොරි රථ ආහාර බෙදීම සඳහා පෙ.ව.10.00 ට පහත සඳහන් අංශ වලට මීල් රූම් (Meal room) යොමු කරනු ලැබේ.

අංශ 6/4
ජයබහලු අංශය
බණ්ඩාරනායක පාලම
නියමු පාලම
අංශ 05
අංශ 02
අංශ 12
විජය පාලම
ප්‍රධාන කාර්යාලය

ඉහත අංශ වෙත ලබා දෙන ලද ලොරි රථ යොදාගෙන ආහාර හා තේ බෙදා දීම සිදුකරනු ලබන්නේ පහත සඳහන් කාලසටහනකට අනුවය.

පෙ.ව. 10.00, මධ්‍යහ්න 12.00 - දිවා ආහාරය බෙදීම
ප.ව. 14.00, ප.ව. 16.00 - සවස තේ බෙදීම
ප.ව. 19.00, ප.ව. 20.30 - රාත්‍රී ආහාර බෙදීම
ප.ව. 22.30, මධ්‍යම රාත්‍රී 12.30 - රාත්‍රී තේ බෙදීම
අළුයම 03.00, අළුයම 04.30 - රළුයම තේ බෙදීම
පෙ.ව. 05.00, පෙ.ව. 06.30 - උදේ ආහාර බෙදීම

පෙ.ව. 10.00 සිට පසුදින පෙ.ව. 06.30 දක්වා දිවා රාත්‍රී ආහාර හා තේ බෙදා දීමේ සේවයේ නිරතවන ප්‍රවාහන අංශයේ රියදුරු හා රිය සහයක මහතුන් මේ සඳහා සුවිශේෂ කැපවීමකින් යුතුව මෙම සේවයේ යෙදෙනුයේ ශ්‍රී ලංකා වරාය අධිකාරියෙත් රටෙත් ජාතියෙත් අභිවෘද්ධිය ගැන සාඩම්බර හැඟීමෙන් යුතුවය.

2. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ රාජකාරිමය කටයුතු සඳහා මෙන්ම සේවකයින්ගේ සුභසාධන කටයුතු සඳහාත් සුහසාධන කොට්ඨාශය හා ප්‍රවාහන අංශය අනුබද්ධව සිදුකරන සංචාරක ප්‍රවාහන සේවාව මෙම සේවය සඳහා සුඛෝපභෝගී බස්රථ තුනක් යොදා ඇත. අධිකාරියේ සෑම සේවකයෙකු-ගේම මංගල, අවමංගල, අධ්‍යාපන, විනෝද, වන්දනා කටයුතුතු සඳහා යොදවනු ලබන මෙම බස්රථ ධාවන ආරම්භ වන්නේ ප්‍රවාහන අංශයේ සිටය. සුහසාධන බස්රථ වල රාජකාරි කටයුතු සඳහා රියදුරු මහතුන් යොදවනු ලබන්නේ විශේෂ පරීක්‍ෂණයකින් සමත් වීමෙන් පසුවය. මෙහිදී විනය ගරුක රියදුරන් සුහසාධන බස්රථ වලට යෙදවීම මාර්ග නීති පිළිබඳ මනා දනුම, සිද්ධස්ථාන, පෞරාණික ස්ථාන, අභය භූමි, කෞතුකාගාර, පුරාණ නටඹුන් වැනි දේ පිළිබඳව ඔවුන් සතු දනුම චාරිකා වල නිරත වන සේවක පිරිස උකහාගන්නේ ඉතාම අල්ප වශයෙනි.

ඔබ බස්රථයක් වෙන් කරගෙන චාරිකාවක නිරත වන විට ඔබගේ දූ දරුවන්ට අධ්‍යාපනික වටිනාකමක් ඇති බොහෝ ස්ථාන පිළිබඳව පහදා දීමේ හැකියාව මෙම රියදුරු මහතුන් සතුව ඇත. සුහසාධන බස් රථ මගින් මෙවැනි ගුණාත්මක සේවයක් ලබා දීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් නිසි ලෙස කළමණාකරණය කිරීම සිදුකරනු ලබන්නේ යාන්ත්‍රික ඉංජිනේරු I.M.S ප්‍රියන්ක මහතාගේ හා ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි ඉඳුරුගොල්ල මහත්මාගේ නිරන්තර අධීක්‍ෂණය යටතේය.

ජය බහලු පර්යන්තයේ සේවයේ යෙදෙන සේවක මහතුන් හා සමගි පාලමේ සේවය කරන සේවක මහතුන් රාජකාරියට පැමිණීමේදීත් සේවයෙන් මිදී නික්මයන විටත් වරාය පරිශ්‍රය තුළ එම සේවක මහතුන්ට ප්‍රවාහන පහසුකම් ලබාදීම සිදුකරනු ලබන්නේ ප්‍රවාහන අංශයේ බස්රථ මගිනි. විජය පාලමේ සිට රැජිණ පාලම දක්වා බස්රථයක් ධාවනය කරවීම මගින් අධිකාරියේ සේවකයින්ට වරාය පරිශ්‍රය තුළ ප්‍රවාහන පහසුකම් ලබාදීම ප්‍රවාහන අංශයෙන් සිදුවන තවත් මෙහෙයකි. බණ්ඩාරනායක පාලමේ සිට සමගි පාලම දක්වාත් නැවතත් සමගි පාලමේ සිට බණ්ඩාරනායක පාලම දක්වාත් නැව්වල සේවයේ යොදවන සේවක මහතුන් ඔවුනගේ රාජකාරි පෙරට්ටු පොළ දක්වා රැගෙන යන්නේ ප්‍රවාහන අංශයේ ලොරි රථ මගිනි.

වරාය අධිකාරියේ සෑම අංශයකම ඇති වාහනයක් ක්‍ෂණිකව ක්‍රියා විරහිත වීමකදී හෝ හදිසි ආපදාවක් නිසා ධාවනය කිරීමට නොහැකි වුවහොත් ප්‍රවාහන අංශයේ ඇති ආපදා රථය යොදවා දිවා රාත්‍රී ඕනෑම වෙලාවක එම රථය වාහන (Mortor Garage) වෙත රැගෙන ගොස් භාරදීම ප්‍රවාහන අංශය සතු රාජකාරියකි. ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ පලාතක වරාය අධිකාරියේ වාහනයක් මෙලෙස අනතුරකට භාජනය වුවහොත් කඩිනමින් එම වාහනය යථා තත්වයට පත්කොට රැගෙන ඒම ප්‍රවාහන අංශය හා වාහන නඩත්තු අංශය ඒකාබද්ධව සිදුකරනු ලැබේ.

නාවික හමුදාව මගින් පැය විසිහතර පුරාම වරාය පරිශ්‍රය තුළ සිදුකරනු ලබන සෝදිසි මෙහෙයුම් හා ආරක්‍ෂක කටයුතු සඳහා ප්‍රවාහන අංශය මගින් වෑන්රථයක් හා ලොරි රථ දෙකක් ද රියදුරු මහතුන් තිදෙනෙක් ඒ වෙනුවෙන් යොදවා ඇත. මෙම රියදුරු මහතුන් තම ජීවිතවලට ඇති අවදානම් සහගත ස්වභාවය ද නොතකා තම රාජකාරිය නිසි පරිදි ඉටු කිරීමට කැපවී සිටිනුයේ වරාය අධිකාරිය ආරක්‍ෂා කිරීම තමන් සතු මෙහෙවරක් ලෙස සිතීමට හැකි මානසික වටපිටාවක් ඔවුන් සතු හෙයිනි.

වරාය අධිකාරිය සේවක වැටුප් ගෙවීම හා මධ්‍ය මාසික වැටුප් අත්තිකාරම් ගෙවීමේදී මුදල් කොට්ඨාශයේ නිලධාරීන් සෑම අංශයකටම ගොස් වැටුප් ගෙවීම සිදුකරනු ලබයි. මෙම කටයුතු සඳහා වාහන අටක් යොදවනු ලබයි. සෑම මසකම වැටුප් ගෙවීම හා මධ්‍ය මාසික වැටුප් අත්තිකාරම් ගෙවන දිනයේදී ප්‍රවාහන අංශයේ රියදුරු මහතුන් අටදෙනෙකු මෙම සේවය සඳහා යොදවනු ලබයි. ලේකම් කාර්යාලයේ හා අමාත්‍යාංශයේ රාජකාරි කටයුතු සඳහා අමතර රියදුරු මහතුන් අවශ්‍ය වූ විටකදී ප්‍රවාහන අංශයේ රියදුරු මහතුන් එම කටයුතු සඳහා යොදවනු ලබයි.

ප්‍රවාහන අංශය මගින් සිදුකරන ලද මෙම රාජකාරිමය කටයුතු හා මෙම අංශයේ පරිපාලන කටයුතු නිසි පරිදි පවත්වාගෙන යෑමට පරිපාලන නිලධාරීන් දෙදෙනෙකු වන එන්.එම්.එන්. බණ්ඩාර මහතා හා සුසන්ත විතානගේ මහතා විසිනි. ප්‍රවාහනාගාරයේ සේවකයින්ගේ රාජකාරිමය කටයුතු සිදුකරනු ලබන්නේ ප්‍රධාන ලිපිකරු සුනිල් අමරවංශ මයා, ලිපිකරු අර්සාන් මයා ලිපිකරු තුෂාර චමින්ද රාජපක්‍ෂ මයා යන නිලධාරීන් විසිනි.

ප්‍රවාහන අංශයේ විශේෂ හැකියාවන් හා දක්‍ෂතාවයන් ඇති බහුතරයක් සිටින අතර සමාජ සේවා කටයුතු වලදී ප්‍රමුඛතාවය ගෙන කටයුතු කරන සේවක පිරිසක් ද මෙම අංශයේ සිටී.

**නොයෙල් වනසිංහ**
ප්‍රවාහන අංශය
ඉංජිනේරු කොට්ඨාශය



එලදායීතාවය හා මුසු වූ වරාය අධිකාරියේ මාසික පුවත් කවුළුව



# දැව නිමැවුම් හලේ ගෙවුණු මොහොතක්

ඔබේ ඇස නොගැසුණු වරායේ සම්පතක් බඳු ආයතනයක් වෙත ඔබව කැටුව යාමටයි මෙවර ඇස ගිය තැන් තුළින් අපගේ වෑයම.

නව බේරේ ප්‍රදේශයේ පිහිටා ඇති දැව නිමවුම්හල හෙවත් වඩු කර්මාන්ත ශාලාව සමස්ත වරාය අධිකාරියටම අවශ්‍ය දැව හා කාර්යාලිය ගෘහ භාණ්ඩ සම්පාදනයේ යුහුසුළු වන බව ඔබ නොදන්නා කරුණක් විය හැකියි. සේවක මහතුන් 56 දෙනෙකු-ගේ ශ්‍රම බලකායෙන් දිවෙන මෙහි කම්කරු නොවන සේවක මහතුන් 13 ක්, වඩු කාර්මික 25 ක්, ඉරුම්කරු 3 ක්, යන්ත්‍ර ක්‍රියාකරුවන් 3 ක්, කියත් මුවහත්කරුවන් 3 ක් දෛනික ක්‍රියාදාමයට සම්බන්ධ වෙනවා.

ඉරුම් අංශය, වඩු අංශය, මැෂින්, ලොරි බඳ සැකසුම් අංශය වශයෙන් කොටස් 4 කට වඩු කර්මාන්ත ශාලාව වර්ගීකරණයට ලක්වෙනවා. පළමුවෙන්ම සිද්ධ වන්නේ රාජ්‍ය දැව සංස්ථාවෙන් ගෙන්වන දැව කඳන් ඉරුම් අංශයේදී අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ඉරා වෙන් කර ගැනීමයි.

අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් දැව කඳන් ඉරා වෙන් කර ගැනීමට Overhead Crane යන්ත්‍රය උපයෝගි කරගනු ලබනවා. දැව ඉරුම් අංශයේ පරිපාලක ලෙසින් කටයුතු කරන්නේ චාල්ස් කරුණාරත්න මහතා. ඔහු යටතේ සේවක මහතුන් 8 ක් සේවයේ යෙදෙනවා.

අවශ්‍ය ප්‍රමාණයන්ට ඉරාගත් ලෑලි යතු ගෑම ආදි ක්‍රියා පටිපාටියකින් වඩු අංශයට අවශ්‍ය ලෙස සකස් කරගැනීම යන්ත්‍ර අංශයේ කාර්ය භාරයයි. පරිපාලක සෝමරත්න මහතාගේ අධීක්ෂණයෙන් යුතු යන්ත්‍ර අංශයේ සේවක මහතුන් 12 ක් සේවය කරනවා. කොළඹ, ගාල්ල, ත්‍රි'මලේ ආදි වරාය අධිකාරියේ සෑම වරායකටම අවශ්‍ය දොරවල් උළුවහු, ජනෙල් රාමු, මේස පුටු, වීදුරු අල්මාරි ආදි කාර්යාලීය ගෘහ උපකරණ නිෂ්පාදනය වඩු අංශයේ ප්‍රධාන කටයුත්ත වෙනවා. පරිපාලක ජයන්ත ෆොන්සේකා මහතාගේ අධීක්ෂණය යටතේ ක්‍රියා කෙරෙන එහි සේවක මහතුන් 12 ක් නිෂ්පාදන කාර්යයට උරදෙනවා.

වඩු අංශයෙන් නිෂ්පාදනය වූ කාර්යාලීය ගෘහභාණ්ඩ අනතුරුව යොමු වන්නේ ඔප දැමීමේ අංශය වෙතටයි. අදාල නිෂ්පාදනයේ ස්වභාවය හා කාර්ය භාරය අනුව සුදුසු ලෙස වර්ණ ගැන්වීම හා ඔප දැමීම මෙම අංශය තුළින් සිදුවෙනවා.

වරාය අධිකාරියට අයත් ලොරි වල සියළු බඳ සැකසුම් කටයුතු සිදු කරන 'ලොරි බොඩි' අංශයත් වඩු කර්මාන්ත ශාලාවේ වැදගත් ස්ථානයක්. එක් ලොරියක බඳ සැකසුම් කටයුත්තක් උදෙසා මාස 2 ක පමණ කාලයක් ගතවෙන අතර, පරිබාහිර ස්ථානයකින් මෙම කටයුත්ත සිදු කරන්නේ නම් ඒ සඳහා මාස 5 - 6 ක පමණ කාලයක් ගතවන බැව් ලොරි බඳ සැකසුම් අංශයේ පරිපාලක ඩී.බී.විජේසිංහ මහතා පවසනවා. ඔහු යටතේ සේවකයින් 10 දෙනෙකු මෙම අංශයේ සේවය කරනු ලබනවා.

ඇල මාර්ගයන්හි ජලාපවහනය පාලනය කිරීමට යොදා ගන්නා ගේට්ටු දොරවල් නිෂ්පාදනය කිරීමද මෙම වඩුකර්මාන්ත ශාලාවෙන් සිදුවෙනවා. තේක්ක, බුරුත ආදි සවි ශක්තියෙන් අනූන දැව යොදා නිෂ්පාදනය කරන යෝධ ජල කඳන් පාලනය කරනු ලබන මෙවැනි ගේට්ටු 8 ක් වඩු කර්මාන්ත ශාලාවෙන් නිෂ්පාදනය කර තිබී මෙන්ම මෙම ආයතනය සතු නිර්මාන ශක්‍යතාව තහවුරු වෙනවා. මේ සියල්ල පසුපස යෝධ ශක්තියක්, දිරිය මිනිසෙක් සිටින බැව් වඩු කර්මාන්ත ශාලාවේ ගත කළ හෝරා කිහිපයේදී අපට හැඟී ගිය කරුණක්. අපි ඔහු සොයා ගියා. නමින් ඩබ්.ඒ.ජයවික්‍රමසිංහ නම් වූ ඔහු එහි ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරිතුමා. අපි ඔහු සමගින් දැව නිමයුම් හලේ හෙට දවස පිළිබඳ කථා කළා.





ජ්‍යෙෂ්ඨ වැඩ අධිකාරි
**ඩබ්.ඒ. ජයවික්‍රමසිංහ**

නව බේරේ කියූ සැනින් ඇතැමුන්ගේ සිත්වල තිබෙන්නේ අපැහැදිලි චිත්‍රයක්. ඇත්තටම මෙතැන වරායේ සැඟවුණු ස්ථානයක් ලෙස හැඳින්වීම වඩාත් නිවැරදියි. නමුත් මෙම ස්ථානයෙන් වරාය අධිකාරියට ප්‍රශස්ත සේවාවක් ඉටුවන බැව් පෙන්වා දීමට පිළිවන්. අධ්‍යක්ෂ (තාක්ෂණ) ආර්.පී.අබේකෝන්, ප්‍රධාන ඉංජිනේරු ලාල් සරත්චන්ද්‍ර, නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු නිශාන්ත දන්තනාරායන, ඉංජිනේරු (කර්මාන්තශාලා භාර) ඒ.ඉසෙඩ්. එම්. තවුෆික් යන මහත්වරුන්ගේ අධීක්ෂණය හා උපදෙස් මත මෙහි නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවෙනවා.

අපේ නිෂ්පාදන සඳහා අපි යොදාගන්නේ මනා ප්‍රමිතියකින් යුත් දැව වර්ග. ඒ වගේම අපේ සේවක මහතුන්ගේ ශිල්පීය දක්ෂතාවයන් උපරිමයෙන් තිබෙනවා. මම පොඩි උදාහරණයක් කියන්නම්.

රු. 84500/= ක මිලකට පිටස්තර ආයතනයකින් මිලට ගත් දැවමය කබඩයක් අපේ ආයතනයෙන් රු. 21,750/= පිරිවැයකින් නිෂ්පාදනය කිරීමට අපේ ආයතනයේ සේවක පිරිසට හැකිවුණා.

**සටහන - උපුල් ගුරුගේ**

13 වන පිටුවට...



පන්නිපිටිය, පැලැන්වත්ත, මහවත්ත පාරේ, අංක 173/ඒ හි පිහිටි 'ක්‍රියේටිව් බ්‍රෂ්' මුද්‍රණාලය මගින් මුද්‍රණය කරවා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය මගින් ප්‍රසිද්ධ කරන ලදි.